ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

දසවැනි පාර්ලිමේන්තුවේ

පළමුවැනි සභාවාරය

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 489

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ

## හයවැනි වාර්තාව

(2024.05.10 සිට 2024.08.08 දක්වා සිදු කරන ලද විමර්ශන)

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු කබීර් හෂීම් මහතා විසින්
2026 මාර්තු මස 06 වැනි දින ඉදිරිපත් කරන ලදී.

*2026 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.*

පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගන්නා ලද පියවර ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) හි පහත පරිදි දක්වා ඇත:-

***"පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ යම් වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට සහ ආයතන භාර අමාත්‍යවරයන්ට යොමු කරනු ලැබිය යුතු අතර, එවිට, මුදල් විෂය භාර ආමාත්‍යවරයා සහ ආයතන භාර අමාත්‍යවරයන් විසින් ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම නිරීක්ෂණ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම හෝ එම නිර්දේශ සම්පූර්ණ කළ නොහැකි බව අමාත්‍යවරයාගේ අදහස නම්, රාජ්‍ය මුදල් නිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ ගතයුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ ලිඛිතව හේතු පැහැදිලි කළ යුතු අතර, කාරක සභාවට අවශ්‍ය වන්නේ නම් අදාළ අමාත්‍යවරයාට කරුණු පැහැදිලි කිරීම සඳහා කාරක සභාවට පෞද්ගලිකව පැමිණීමට අරාධනාවක් කළ හැකි අතර එවැනි කාරණා වලින් පැන නඟින ප්‍රශ්න වලට සති අටක් ඇතුළත පිළිතුරු සැපයිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී වාර්තාව නීතිපතිවරයාගේ නිරීක්ෂණ සහ අවශ්‍ය කටයුතු සඳහා යොමු කරනු ලැබිය හැකි ය."***

## නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය
*(වාර්තාවේ සඳහන් කාලසීමාව තුළ)*

1. ගරු ලසන්ත අලගියවන්න මහතා, පා.ම. කාරක සභාවේ සභාපති
2. ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා, පා.ම.
3. ගරු ප්‍රසන්න රණවීර මහතා, පා.ම.
4. ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම.
5. ගරු ඩයනා ගමගේ මහත්මිය, පා.ම.
6. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
7. ගරු තිස්ස අත්තනායක මහතා, පා.ම.
8. ගරු වජිර අබේවර්ධන මහතා, පා.ම.
9. ගරු ඒ .එල් .එම්. අතාඋල්ලා මහතා, පා.ම.
10. ගරු ජයරත්න හේරත් මහතා, පා.ම.
11. ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
12. ගරු විමලවීර දිසානායක මහතා, පා.ම.
13. ගරු නිරෝෂන් පෙරේරා මහතා, පා.ම.
14. ගරු ජේ .සී .අලවතුවල මහතා, පා.ම.
15. ගරු අශෝක් අබේසිංහ මහතා, පා.ම.
16. ගරු ජයන්ත කැටගොඩ මහතා, පා.ම.
17. ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම.
18. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
19. ගරු එම් .උදයකුමාර් මහතා, පා.ම.
20. ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා, පා.ම.
21. ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා, පා.ම.
22. ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා, පා.ම.
23. ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා, පා.ම.
24. ගරු නීතිඥ ප්‍රේම්නාත් සී .දොලවත්ත මහතා, පා.ම.
25. ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය, පා.ම.
26. ගරු එම් .ඩබ්ලිව් .ඩී .සහන් ප්‍රදීප් විතාන මහතා, පා.ම.
27. ගරු නීතිඥ මධුර විතානගේ මහතා, පා.ම.
28. ගරු ඩී. වීරසිංහ මහතා, පා.ම.
29. ගරු වීරසුමන වීරසිංහ මහතා, පා.ම.
30. ගරු මංජුලා දිසානායක මහත්මිය, පා.ම.
31. ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය, පා.ම.

## දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු කබීර් හෂීම් මහතා, පා.ම. කාරක සභාවේ සභාපති
2. ගරු ඇන්ටන් ජයකොඩි මහතා, පා.ම.
3. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා, පා.ම.
4. ගරු සුගත් තිලකරත්න මහතා, පා.ම.
5. ගරු සුන්දරලිංගම් ප්‍රදීප් මහතා, පා.ම.
6. ගරු නලින් හේවගේ මහතා, පා.ම.
7. ගරු අරවින්ද සෙනරත් මහතා, පා.ම.
8. ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා, පා.ම.
9. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
10. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
11. ගරු ජේ.සී. අලවතුවල මහතා, පා.ම.
12. ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
13. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
14. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
15. ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම.
16. ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය, පා.ම.
17. ගරු මංජුල සුරවීර ආරච්චි මහතා, පා.ම.
18. ගරු කේ. ඉලංකුමාරන් මහතා, පා.ම.
19. ගරු ඔෂානි උමංගා මහත්මිය, පා.ම.
20. ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා, පා.ම.
21. ගරු රුවන්තිලක ජයකොඩි මහතා, පා.ම.
22. ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
23. ගරු ටී.කේ. ජයසුන්දර මහතා, පා.ම.
24. ගරු එම්.ඒ.එම්. තාහීර් මහතා, පා.ම.
25. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා, පා.ම.
26. ගරු ලාල් ප්‍රේමනාත් මහතා, පා.ම.
27. ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
28. ගරු සුනිල් රත්නසිරි මහතා, පා.ම.
29. ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.
30. ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා, පා.ම.

**<u>කාරක සභා ලේකම් කාර්යාලයේ වත්මන් කාර්ය මණ්ඩලය</u>**

- සනත් විජේගුණවර්ධන මයා - කාරක සභා ලේකම්/සහකාර අධ්‍යක්ෂ(පරිපාලන)
- ඩී.සී.එස් රූපසිංහ මහත්මිය - ප්‍රධාන නිලධාරි
- ආර්.ඒ.ඩී.එන්. ගියෝවනී මිය - නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි
- ජේ.ටී.එල්.පී. සමීර මයා - සහකාර ප්‍රධාන නිලධාරි
- ජී.ඩී.ජේ.එච්. අයේෂ්මන්ති මෙය - පාර්ලිමේන්තු නිලධාරි
- ජී.එම්. කල්ලෑගොඩ මිය - පාර්ලිමේන්තු නිලධාරි
- එම්.එල්.ඒ.ඩී.එම් කුමාරි මෙය - පාර්ලිමේන්තු නිලධාරි

**<u>කාරක සභා වාර්තා</u>**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කර ගැනීමට හැක.

Select language ⟶ Business of Parliament ⟶ Committees
Select Legislature (10th Parliament) ⟵ Committee Reports
Select Session (1st Session) ⟶ Select Committee Type
Select Committee ⟵ (Comittees for Special Purposes)
(Committee on Public Accounts) ⟶ Search

# පටුන

පිටු අංකය

අ. සභාපතිවරයාගේ සටහන ........ 1

ආ. සංක්ෂිප්ත වාර්තාව ........ 2

ඇ. විශේෂිත නිරීක්ෂණ ........ 4

ඈ. විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු ,නිරීක්ෂණ, නිර්දේශ / නියෝග ........ 8

ඉ. සූචිය ........ 133

## සභාපතිවරයාගේ සටහන

නව වැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2024.05.10 දින සිට 2024.08.08 දින දක්වා සිදු කරන ලද විමර්ශන ඇතුළත් කාරක සභාවේ හයවැනි වාර්තාව මෙලෙස ඉදිරිපත් කරමි. විගණනය නමින් හැඳින්වෙන පශ්චාත් ක්‍රියාවලියේදී හඳුනාගත් දුර්වලතාවලට විසඳුම් ලබා දෙන අතරම, අකාර්යක්ෂමතාවයන් සක්‍රියව වැලැක්වීම වඩාත් ප්‍රතිඵලදායක වන බැවින් අනාගතයේදී අතීත අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනවලට මඟ පෙන්වීම කෙරෙහි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වැඩි අවධානයක් යොමු කරන බව මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි.

ඒ අනුව, මේ වන විට, රාජ්‍ය ආයතන පාර්ලිමේන්තුවට කැඳවා විමර්ශනය කිරීමට සමගාමීව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය ඔස්සේ සියලු රාජ්‍ය ආයතන වාර්ෂිකව ඇගයීමේ ක්‍රියාවලියද සාර්ථකව සිදු කරගෙන යන බව සඳහන් කරමි. මෙමගින් කාරක සභා විමර්ශනයන් වඩා යාවත්කාලීනව සිදු කිරීමට හැකිවන අතර ආයතනවල පවතින දුර්වලතා හා අඩුපාඩු හඳුනාගෙන කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්තිමය තීරණ මගින් ඒවා නිවැරදි කර ගැනීමට මග පෙන්වීමටත් අවස්ථාව සැලසෙන බව මාගේ අදහසයි.

ආයතන විමර්ශනය කිරීමේදී හඳුනාගත් අඩුපාඩු හා වැරදි නිවැරදි කර ගැනීමටත්, පවතින ධනාත්මක ගති ලක්ෂණ සහ ප්‍රවණතා වැඩි දියුණු කිරීමටත්, කාරක සභා රැස්වීම් මෙහෙයවීමේදී රාජ්‍ය නිලධාරීන්ගේ ගෞරවය ආරක්ෂා කිරීමටත් අවශ්‍ය බව මා විසින් කාරක සභාවල කටයුතු කිරීමෙන් ලද දීර්ඝ අත්දැකීම් ඒත්තු ගන්වයි.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාර්ථකත්වය යන්නෙන් අදහස් වන්නේ ඊට දායක වන සියලුම පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාවයේ ප්‍රතිඵලයයි. එබැවින්, මෙම කාරක සභාවේ සියලු සභික මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව රාජ්‍ය මූල්‍ය යාන්ත්‍රණය නිසියාකාරව ක්‍රියාත්මක කරවීම පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සඳහා මා හට ලබාදෙන සහාය මම කෘතඥතා පූර්වකව අගය කරමි.

තවද, විවිධ අභියෝග මධ්‍යයේ වුවද කාරක සභාවේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට ලබාදෙන සහයෝගය වෙනුවෙන් විගණකාධිපතිවරයා ඇතුලු කාර්ය මණ්ඩලයට ද, මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ට ද පාර්ලිමේන්තුවේ මහ ලේකම් ඇතුලු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා කාර්යාංශයේ සියලුම නිලධාරීන්ට ද කාරක සභාව සිය ස්තුතිය හා ප්‍රසාදය පිරිනමනු ලබන බව මෙහි ලා සඳහන් කරනු කැමැත්තෙමි.

**කබීර් හෂීම්**
සභාපති
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව

## සංක්ෂිප්ත වාර්තාව

නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභා වාරයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද ආයතනවලට අදාළව සාකච්ඡා කරන ලද කරුණු, ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් විසින් කරන ලද පැහැදිලි කිරීම්, කාරක සභාව විසින් ලබාදෙන ලද නිර්දේශ මෙම වාර්තාවේ අඩංගු වේ.

**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2024.05.10 දින සිට 2024.08.08 දින දක්වා විමර්ශනය කරන ලද ආයතන හා අදාළ විගණකාධිපති වාර්තා**

| | ආයතනය | සලකා බලන ලද විගණකාධිපති වාර්තා හා සලකා බලන ලද කරුණු | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත් සභාව | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 04 |
| 02 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 05 |
| 03 | බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන | 2020, 2021 මුදල් වර්ෂ සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ එම පළාත් පාලන ආයතනවල වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 06 |
| 04 | ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 06 |
| 05 | ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 2020, 2021, 2022 මුදල් වර්ෂ සඳහා විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 07 |
| 06 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 18 |
| 07 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 18 |

| | ආයතනය | සලකා බලන ලද විගණකාධිපති වාර්තා හා සලකා බලන ලද කරුණු | විමර්ශනය කරන ලද දිනය |
|---|---|---|---|
| 08 | කම්කරු දෙපාර්තමේන්තුව | 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 19 |
| 09 | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජුනි 20 |
| 10 | බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන | 2024.06.06 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම | 2024 ජූලි 10 |
| 11 | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 2020 සහ 2021 මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජූලි 23 |
| 12 | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 2018, 2019, 2020, 2021 සහ 2022 මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජූලි 23 |
| 13 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 2020, 2021 හා 2022 වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 ජූලි 25 |
| 14 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය | 2024 අගෝස්තු 07 |
| 15 | ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා 2024.06.06 දින පැවැත්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශයන් හි ප්‍රගතිය සහ වර්තමාන කාර්යසාධනය | 2024 අගෝස්තු 08 |

## විශේෂිත නිරීක්ෂණ

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අදාළ කාල පරිච්ඡේදය තුළ විමර්ශනය කරන ලද ආයතනවලට අදාළව පහත සඳහන් පොදු ගැටලු නිරීක්ෂණය කරන ලද අතර, ඒ ඒ ආයතනවලට අදාළව මෙහි දක්වා ඇති නිර්දේශ ද ලබා දෙන ලදී.

**1. අභ්‍යන්තර විගණන ඒකක නොපැවතීම හා විගණන හා කළමනාකරණ කමිටු නොපැවැත්වීම.**

***1.1. බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන***

කාර්තුමය වශයෙන් පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අදාළ සියලු නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව පළාත් පාලන ආයතනය තුළ ම පැවැත්විය යුතු බවට කාරක සභාව නිර්දේශ කළේය.

ස්වාධීන විගණනයක් සිදු කිරීම සඳහා පළාත් පාලන ආයතනවල වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම තුළින් ආයතනවල සිදුවන අක්‍රමිකතා අවම කර ගැනීමට හැකි වන බව කාරක සභාවේ අදහස විය.

***1.2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව***

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීම අමාත්‍යාංශයේ වගකීමක් බව අවධාරණය කළ කාරක සභාව, ජූලි 2024 හි ම අදාළ නිලධාරීන් සම්බන්ධ 25 මාසය ඇතුළත දිස්ත්‍රික් කාර්යාල කරගනිමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලෙසත්, රේඛීය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් මෙම ක්‍රියාවලිය දිගටම පවත්වාගෙන යන ලෙසත් නිර්දේශ කළේය.

***1.3. ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය***

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්වීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මැදිහත් විය යුතු බව කාරක සභාව ප්‍රකාශ කළේය.

**2. කාර්ය මණ්ඩල පුරප්පාඩු.**

***2.1. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව***

දුම්රිය දෙපාර්තමේන්තුවේ තෘතීයික මට්ටමේ පුරප්පාඩු 328 ක් පිරවීමට කටයුතු කර නොතිබීම ඇතුළුව සමස්ත දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු රාශියක් පවතින බව අනාවරණය විය.

### *2.2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව*

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ සේවක පුරප්පාඩු රාශියක් පවතින බව කාරක සභාව හමුවේ අනාවරණය විය. මෙම දෙපාර්තමේන්තුවේ පහල ස්ථරයේ සේවක පිරිසට සාපේක්ෂව ඉහළ තනතුරුවල අඩුවක් දක්නට ලැබෙන බවත් විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදුකර දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය නිවැරදි ආකාරයට සකස් කළ යුතු බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.

### *2.3. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව*

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සමස්ථ අනුමත තනතුරු සංඛ්‍යාව 613 ක් වන බවත්, 2024.06.30 දින වන විට ඉන් තනතුරු 494 ක් සම්පූර්ණ කර ඇති අතර දෙපාර්තමේන්තුවේ තෘතීයක මට්ටමේ අනුමත තනතුරු 24 න් මේ වන විට තනතුරු 3 ක් පමණක් සම්පුර්ණ වී ඇති බවත්, ග.නි ප්‍රකාශ කළේය.

### 3. රජයට අයවිය යුතු ආදායම් නියමිත දිනට අයකර ගැනීමේ ප්‍රමාදය.

### *3.1. බස්නාහිර පළාත් සභාව සහ ඊට අයත් පළාත් පාලන ආයතන*

පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ රු. මිලියන 777 ක් ද, පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රු. බිලියන 11 ක් ද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රු. මිලියන 905 ක් ද වශයෙන් හිඟ ආදායම් පවතින බවත්, බස්නාහිර පළාතේ ඇතැම් නගර සභා සහ මහ නගර සභා බල ප්‍රදේශවල දේපළ තක්සේරු කටයුතු වසර ගණනාවකින් සිදු කර නොමැතිවීම නිසා වරිපනම් බදු යාවත්කාලීන වී නොමැති බැවින් සැලකිය යුතු බදු ආදායමක් අහිමි වී ඇති බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය.

### *3.2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ගල්කොරි බලපත්‍රයන්ට අදාළ හිඟ ගාස්තු ගෙවීම සිදු නොකළ ආයතන 143 සඳහා හිඟ ගාස්තු ගෙවන ලෙසට අවසාන නිවේදනය යැවීමෙන් පසුව ද ගෙවීම් කටයුතු සිදු නොකරන ආයතන අසාධු ලේඛනගත කරන ලෙසත් (*Blacklist),* අදාළ බලපත්‍ර හිමියන්ගේ නම් වලින් ලබාගෙන තිබෙන වෙනත් බලපත්‍ර තිබේනම් ඒවාද අහෝසි කරන ලෙසත්, සන්නිවේදන කුළුණු ගාස්තු සම්බන්ධයෙන් අදාළ සන්නිවේදන සමාගම් එකම දිනයක කැඳවා අදාළ ගාස්තු ගෙවීම සඳහා අවසන් දිනයක් නියම කර එදින වනවිට ගාස්තු ගෙවා අවසන් කරන ලෙස දන්වා සිටින ලෙසත් ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව නිර්දේශ කළේය.

## 4. තොරතුරු තාක්ෂණ පද්ධති ඵලදායී ලෙස භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ගැටලු පැවතීම.

### *4.1. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකාවේ ගම්මිරිස් හා කුරුඳු සඳහා භූගෝලීය දර්ශක *(GI)* ලබාගැනීමට සහ ගොවීන්, සැපයුම්කරුවන් හා වෙළෙඳුන් ලියාපදිංචි කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් සකස් කිරීමටත්, ටැබ් පරිගණක 300 ක් මිළදී ගැනීම සඳහාත් රු. එක් කෝටි විසිපන් ලක්ෂයකට (12,500,000) අධික වියදමක් දරා තිබුණ ද, එමගින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොමැති බව කාරක සභාවේදී අනාවරණය විය .

### *4.2. බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන*

තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තක්සේරු කටයුතු ක්‍රමවත් කිරීම පිණිස එම කටයුතු පරිගණකගත කිරීම සඳහා සකස් කළ දත්ත පද්ධතිය මෙතෙක් ක්‍රියාත්මක නොකිරීම, එහි වර්තමාන තත්ත්වය හා එය ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීමට බලපා ඇති ගැටළු පිළිබඳව කාරක සභාව විමසූ අතර මෙම ,දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතින බව තක්සේරු දෙපාර්තමේන්තුවේ ග.නි. සඳහන් කළේය.

### *4.3. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

දෙපාර්තමේන්තුවට මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළේය. දැනට දෙපාර්තමේන්තුව තුළ තිබෙන තාක්ෂණික අංශ *8*හි වෙන වෙනම දත්ත පද්ධතීන් පවත්වාගෙන යන බවත්, ඊට අමතරව පාලන අංශයේ, ආයතනික හා පර්යේෂණ යන අංශවල වෙනම දත්ත පද්ධතීන් ඇති බවත්, එම දත්ත පද්ධති ගබඩා කිරීම සඳහා ටෙරා බයිට් *8*ක ධාරිතාවයෙන් යුත් ක්ලවුඩ් *(Cloud)* පද්ධතියක් මිලදී ගෙන තිබෙන බවත්, ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.

## 5. ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොපැවතීම.

### *5.1.* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජන හා නිවාස සංගණනයට අදාළ දත්ත රැස් කිරීමේ ආකෘති පත්‍රය මඟින් රැස් කරනු ලබන සියලු දත්ත, “ඊ-ග්‍රාම නිලධාරි” ව්‍යාපෘතිය *(e-GN Project)* සඳහා ග්‍රාම නිලධාරීවරුන් විසින් ද වෙනත් ආකෘති පත්‍රයක් භාවිතයෙන් රැස් කරනු ලබන බව අනාවරණය විය. රාජ්‍ය ආයතන කිහිපයක් විසින් එක හා සමාන දත්ත විටින් විට රැස් කිරීම මහජනතාවට පීඩාකාරී වන බවත්, එහිදී රජයේ වියදම වැඩිවීම හා ශ්‍රමය හා කාලය අපතේ යෑම සිදුවන බවත් කාරක සභාව අවධාරණය කළේය.

## *5.2. කම්කරු දෙපාර්තමේන්තුව*

ආරම්භයේදී කම්කරු දෙපාර්තමේන්තුව පමණක් ඩිජිටල්කරණය කිරීමට අපේක්ෂා කළ නමුත්, යෝජිත ජාතික ශ්‍රම වෙළඳපොල තොරතුරු පද්ධතිය (*National Labour Market Information System)* හරහා කම්කරු දෙපාර්තමේන්තුව පාදක වන සියලු කටයුතු ඩිජිටල්කරණය කිරීමට නියමිත බව ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තුව එක් දත්ත පද්ධතියක් හරහා සම්බන්ධ වීම වඩාත් සුදුසු බව මෙහිදී සාකච්ඡාවට ලක් වූ අතර ඒ සඳහා ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට යෝජනා ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි වෙත උපදෙස් දුන්නේය.

## විමර්ශනය කරන ලද එක් එක් ආයතනවල හඳුනාගත් ප්‍රධාන ගැටළු, නිරීක්ෂණ හා නිර්දේශ

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</td></tr>
<tr><td colspan="3">බස්නාහිර පළාත් සභාව<br>(2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)<br>විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 04</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>❖ බස්නාහිර පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය<br>❖ රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)<br>❖ බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය<br>❖ බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා හා සභා කටයුතු අමාත්‍යාංශය<br>❖ බස්නාහිර පළාත්, පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පාරිසරික කටයුතු, ජල සම්පාදන හා මලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය<br>❖ බස්නාහිර පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ඉඩම්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය<br>❖ මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප)<br>❖ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (බ.ප)<br>❖ කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප)</td></tr>
<tr><td>01</td><td><u>බස්නාහිර පළාත් සභාවේ ආදායම් වියදම්</u></td><td>මේ පිළිබඳ විශ්ලේෂණයක් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි)/ ගණන්දීමේ නිලධාරි (ග.නි) විසින් සිදු කරන ලදී.<br>ඒ අනුව, පළාත් සභාව සතු තැන්පතුවේ වටිනාකම රුපියල් බිලියන 38.5 කි. පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතුව ඇති මුද්දර බදු හා දඩ මුදල්වල එකතුව</td></tr>
</table>

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | රුපියල් බිලියන 48 කි.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>පළාත් සභාව විසින් පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු මුදල, තැන්පතු ප්‍රමාණය ඉක්මවා තිබීම පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව, මෙම වෙනසට හේතු ද සමගින් පළාත් සභාවේ ආදායම් හා වියදම් පිළිබඳව පරිගණක ඉදිරිපත් කිරීමක් (Computer Presentation) මීළඟ රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි/ ග.නි වෙත නිර්දේශ කළේය. මේ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරන ලෙස වැඩිදුරටත් නිර්දේශ කරන ලදී. |
| 02 | **<u>හිඟ ආදායම් අයකර ගැනීම</u>**<br>පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ රු. මිලියන 777 ක් ද, පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ රු. බිලියන 11 ක් ද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රු. මිලියන 905 ක් ද වශයෙන් හිඟ ආදායම් පවතින බව කාරක සභාව හමුවේ අනාවරණය විය. | ආණ්ඩුකාරවරයා විසින් පත් කරන ලද, ප්‍රධාන ලේකම්ගේ මූලිකත්වයෙන් යුත් කමිටුවක් මගින් හිඟ ආදායම් අයකර ගැනීම හා ඒ සම්බන්ධයෙන් ඇති ගැටළු පිළිබඳව සාකච්ඡා කරන බව ප්‍ර.ග.නි විසින් සඳහන් කරන ලදී.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>පළාත් ආදායම්, ඉඩම් කොමසාරිස් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් යන අංශ වලින් පළාත් සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකර ගැනීම, ඒවායේ ඉලක්කගත ආදායම තීරණය කිරීම, ආදායම් ආයෝජනය කරන ආකාරය වැනි කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස් කරන ලෙස කාරක සභාව විසින් ප්‍රධාන ලේකම් වෙත නිර්දේශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 03 | **ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ රු. මිලියන 41 ක පමණ මුද්‍රණ තොගවල ඌණතාවයක් ඇතුළු අක්‍රමිකතා රැසක් විගණනයේදී අනාවරණය වී තිබීම.** | මේ පිළිබඳව විශේෂ කමිටුවක් මගින් විමර්ශනයක් සිදු කරමින් පවතින බව ප්‍ර.ග.නි විසින් දැනුම් දෙන ලදී.<br>**නිරීක්ෂණ/ නිර්දේශ**<br>ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ අවිධිමත් පරිපාලනය හා අධීක්ෂණ කටයුතු ඉතා දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් සිදුවී ඇති වංචා සහ අක්‍රමිකතා පිළිබඳව සොයාබැලීම සඳහා ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත්කරන ලෙසත්, ඒ පිළිබඳ වාර්තාවක් මීලඟ රැස්වීමට ඉදිරිපත් කරන ලෙසත් පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/FIN-AP/01/FI/18 (C) හා 2024.06.13 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 04 | **තක්සේරු කටයුතු නිසි පරිදි සිදු නොවීම** | **නිරීක්ෂණ/ නිර්දේශ**<br>මහා නගර සභා සහ නගර සභාවන්හි තක්සේරු කටයුතුවල සිදු වන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය වන්නේ නම් අදාළ අණ පනත් සංශෝධනය කර ගැනීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී. |
| 05 | **කොටස් කර වෙන්දේසි කරන ඉඩම් හා නිවාස යෝජනා ක්‍රමවලින් ඉඩම්/ නිවාස මිලදී ගන්නා ජනතාවට මුහුණපෑමට සිදුවී තිබෙන ගැටළු**<br>ඇතැම් විකිණුම්කරුවන් විසින් අදාළ දේපළ බැංකුවට උකස් කර | මේ සම්බන්ධයෙන් කාරක සභාව දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර, මේ සඳහා විසඳුමක් සෙවීමේදී නාගරික සංවර්ධන අධිකාරියට විශාල කාර්ය භාරයක් පැවරෙන බැවින් 2024 ජූනි මස 06 දින පැවැත්වෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමට නාගරික සංවර්ධන අධිකාරිය කැඳවීමට කාරක සභාව විසින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | තිබෙන අතර, ණය වාරික නොගෙවීම නිසා බැංකුව විසින් එම දේපළ අත්පත් කරගැනීමට කටයුතු කිරීම හේතුවෙන් එම දේපළ මිලදී ගත් ජනතාව අපහසුතාවයට පත්වන බව සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදී. | තීරණය කරන ලදී. |
| 06 | **<u>සණස සමිති අක්‍රිය තත්ත්වයට පත්ව තිබීම.</u>**<br>කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ලියාපදිංචි සමූපකාර සමිති හා සණස සමිති විසින් දිගින් දිගටම නියමිත ක්‍රමවේදයක් අනුගමනය නොකරමින් ණය නිකුත් කිරීම හා ආයෝජන කටයුතු කිරීම නිසා එම සමිති අක්‍රිය තත්ත්වයට පත්ව ඇති බව මෙහිදී අනාවරණය විය. | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>මේ නිසා එම සමිතිවල මුදල් ආයෝජනය කළ තැන්පත්කරුවන් විශාල පිරිසකගේ තැන්පත් මුදල් ආපසු ලබා ගැනීමට නොහැකිව එම ජනතාව අසරණ තත්ත්වයට පත්ව ඇති බවත්, එවැනි තත්ත්වයක් ඇතිවීමට මූලික හේතුව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දුර්වල නියාමනය බවත් කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.<br>සමූපකාර ව්‍යාපාරයේ බිඳවැටීමට හේතු සහ එය යළි නගා සිටුවීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ කාරක සභාව, සමූපකාර සංකල්පය විනාශ වී යා නොදී ආරක්ෂා කිරීම සියළු දෙනාගේ වගකීමක් වන බව ද අවධාරණය කළේය. |
| 07 | **<u>මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරු 02 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් පත් කිරීම</u>**<br>මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරි තනතුරට | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2013 වර්ෂයේ සිදු කරන ලද කාර්ය මණ්ඩල සමාලෝචනයකට අනුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා 818 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවා ගෙන ඇති බව ප්‍ර.ග.නි/ ග.නි විසින් සඳහන් කරන ලදී. එම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | අමතරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 3 ක් ඇති කිරීම හා ඉන් තනතුරු 2 ක් සඳහා සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් දෙදෙනෙකු වැඩ බැලීමේ පදනම මත පත්කර තිබීම පිළිබඳව විගණනය විසින් කාරක සභාවට පෙන්වා දෙන ලදී. | 818 තුළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු 03 ක් පැවති බවත්, 2016 වර්ෂයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ධාවන) යන තනතුරු පුරප්පාඩුවීම නිසා අභ්‍යන්තර නිලධාරීන් දෙදෙනෙකු එම තනතුරු සඳහා වැඩ බැලීමේ පදනම මත අනුයුක්ත කළ බවත් ඔහු සඳහන් කළේය. එම නිලධාරීන් සඳහා වැටුප් ගණනය කිරීමේදී සිදුවූ අතපසුවීමක් හේතුවෙන් වැඩිපුර වැටුප් ගෙවීමක් සිදුවී ඇති බවත්, එම මුදල් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ආපසු ගෙවන ලෙස දැනුම් දී ඇති බවත් ග.නි විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මෙම තනතුරු 02 සඳහා වැඩ බැලීමේ පදනම මත පත්කර ඇති නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටියට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේද, බඳවාගත් නිලධාරීන්ගෙන් කිසියම් නිලධාරියෙකු විසින් ව්‍යාජ සහතික ඉදිරිපත් කරනු ලැබ තිබේ නම් ඒ පිළිබඳ තත්ත්වය හා එම නිලධාරීන් සඳහා වැඩිපුර වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා මීලඟ රැස්වීමේදී කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට කාරක සභාව විසින් ප්‍රධාන ලේකම් වෙත නිර්දේශ කරන ලදී.<br><br>**බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/FIN-AP/01/FI/18(C) හා 2024.08.26 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 08 | **වෙනත් මාර්ගවල ධාවනය සඳහා අවසරපත් ලබා දී ඇති බස් රථවලට අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම සඳහා විශේෂ වාරිකා අවසරපත් නිකුත් කිරීම.** | මේ සම්බන්ධයෙන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ග.නි විසින් සඳහන් කරන ලද්දේ, මගී අවශ්‍යතාවය අනුව වෙනත් මාර්ගයක ධාවනය කිරීමට නියමිත බස් රථ අධිවේගී මාර්ගයේ ධාවනය සඳහා යොදවා ගන්නා බවයි. ඒ සඳහා බලපත්‍රයක් ලෙස විශේෂ වාරිකා බලපත්‍රය යොදා ගන්නා බව ද ඔහු සඳහන් කළේය. |
| 09 | **2022.12.31 දිනට නිකුත් කර තිබූ මගී සේවා අවසරපත්‍ර 6161 ක් අතරින් අවසරපත්‍ර 5064 (82%) ක් ටෙන්ඩර් පටිපාටියෙන් තොරව නිකුත් කර තිබීම.** | 2007 වර්ෂයේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය පිහිටුවීමට පෙර එවැනි බලපත්‍ර නිකුත් කිරීම් සිදුවී ඇති නමුත්, 2007 වසරින් පසු ටෙන්ඩර් පටිපාටියට අනුව පමණක් මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සිදුවන බව ග.නි. විසින් සඳහන් කරන ලදී. |
| 10 | **අධිවේගී මාර්ගයේ බස් රථ ධාවනය නියාමනය කිරීම සඳහා GPS තාක්ෂණය යොදාගැනීම.** | මේ සඳහා මොරටුව විශ්ව විද්‍යාලය මගින් නිපදවන ලද මෘදුකාංගයක් යොදා ගන්නා බවත්, එය නියමු ව්‍යාපෘතියක් ලෙස කඩවත සිට අධිවේගී මාර්ගයේ ධාවනය කරනු ලබන බස්රථ සඳහා භාවිත කිරීමට සැලසුම් කර ඇති බවත් සභාපතිතුමා විසින් කාරක සභාව දැනුවත් කරන ලදී. එමගින් මගීන්ට අවශ්‍ය තොරතුරු මෙන්ම බලධාරීන්ට අවශ්‍ය තොරතුරුද ලබා ගත හැකි බව ප්‍රකාශ කළ සභාපතිතුමා එම ව්‍යාපෘතියේ ප්‍රගතිය මීලඟ කාරක සභා රැස්වීමේදී සලකා බලන බව ද සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව**<br>***(2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 05** | |
| | **කැඳවන ලද ආයතන -**<br>❖ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය<br>❖ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | |
| 01 | **<u>බෙල් සහ ලයිට් පද්ධති ස්ථාපිත කිරීම හා එහි වර්තමාන තත්ත්වය</u>**<br><br>බෙල් සහ ලයිට් පද්ධති 44ක් දැනට අක්‍රීය තත්ත්වයේ පවතින බවත් ඉන් රු. මිලියන 213ක පමණ පාඩුවක් දුම්රිය දෙපාර්තමේන්තුවට සිදුවී ඇති බවත් විගණන අංශ විසින් පෙන්වා දෙන ලදී.<br><br>පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු සිදු කරන අවස්ථාවේ දී මධ්‍යගත නිරීක්ෂණ පද්ධතියක් ඇතුළත් නොකිරීම හා බෙල් සහ ලයිට් පද්ධති බිඳ වැටීම මඟින් මහජන ආරක්ෂාවට සිදුවූ හානිය සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානය යොමු විය. | මෙම ව්‍යාපෘතිය 2013 වසරේ දී ආරම්භ කළ ව්‍යාපෘතියක් බැවින් අදාළ කාලයේ මතුව තිබූ අවශ්‍යතාවය මත අඩු මුල්‍ය ප්‍රතිපාදන පිළිබඳ සැලකිලිමත්ව ප්‍රසම්පාදන කටයුතු සිදු කරන්නට ඇතැයි තමා විශ්වාස කරන බව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>බෙල් සහ ලයිට් ව්‍යාපෘතිය විදේශ ආධාර මත සිදුකළ ව්‍යාපෘතියක් බැවින් මධ්‍යගත පද්ධතියක් නොමැතිව පද්ධතිය සැලසුම් කිරීමට හේතු ලෙස ව්‍යාපෘතිය සඳහා ලද ප්‍රතිපාදන සීමාවීම ලෙස ලබාදුන් උපකල්පිත පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව කාරක සභාව විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>මෙම බෙල් හා ලයිට් පද්ධති ස්ථාපිත කිරීම සඳහා අදාළ සමාගම තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියාපටිපාටිය, වර්තමානය වනවිට ස්ථාපිත ප්‍රමාණය හා නියමාකාරයෙන් ක්‍රියාත්මක වන ප්‍රමාණයන්, මෙම පද්ධතිය නඩත්තු කිරීම හා නිසි අධීක්ෂණයක් නොවීමට බලපෑ හේතු සම්බන්ධයෙන් සහ බෙල් හා ලයිට් පද්ධතිය සඳහා මධ්‍යගත මෙහෙයුම් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | පද්ධතියක් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර 2024 ජූලි 5 වැනි දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.07.17 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 02 | **<u>දුම්රිය දෙපාර්තමේන්තුවේ තෘතීයික මට්ටමේ පුරප්පාඩු 328ක් පිරවීමට කටයුතු කර නොතිබීම ඇතුළු සමස්ත දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු රාශියක් පැවතීම</u>** | රාජ්‍ය සේවයට බඳවා ගැනීම් අත්හිටුවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය හේතුවෙන් පසුගිය වර්ෂ කිහිපය තුළදී තාක්ෂණික අංශයන්ට බඳවා ගැනීම් අවශ්‍ය පරිදි සිදුකර නොතිබුණ බව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. තවද දුම්රිය රියදුරු තනතුරේ අනුමත තනතුරු සංඛ්‍යාව 458 ක් වුවද දැනට සිටින රියදුරු සංඛ්‍යාව 272 ක් පමණක් බවත් 2017 වසරින් අනතුරුව දුම්රිය රියදුරු තනතුර සඳහා බඳවාගැනීම් සිදුකර නොමැති බවත් ඔහු පෙන්වා දුන්නේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>දුම්රිය නියාමක, දුම්රිය රියදුරු ඇතුළු සමස්ත අත්‍යාවශ්‍ය බඳවාගැනීම් කඩිනමින් සිදු කිරීමටත්, අභ්‍යන්තර උසස් වීම් ක්‍රියාවලිය නිසි අයුරින් සිදු කිරීමටත් කාරක සභාව විසින් උපදෙස් ලබා දුන් අතර දුම්රිය සේවයේ බඳවා ගැනීම් හා උසස්වීම් සම්බන්ධයෙන් ඇති බාධාවන් ඉවත් කර කඩිනමින් බඳවාගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟද සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.12.23 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 03 | **<u>වඩා කාර්යක්ෂම හා ලාභදායි භාණ්ඩ ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවය ප්‍රචලිත කිරීම</u>** | දුම්රිය මාර්ග ඔස්සේ භාණ්ඩ ප්‍රවාහන ජාලයක් ඇති කිරීම සඳහා අවධානය යොමුවී ඇති බවත් මේ පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා තම අමාත්‍යාංශය තුළ කමිටුවක් ද පත්කර තිබෙන බවත් ඇ.ඩො.මි. 7.5 ක ලෝක බැංකු ආධාර මුදලක් ද මෙම කටයුත්ත සඳහා ලැබීමට නියමිත බවත්, මෙම මස තුළදී බෙලිඅත්ත සිට කොළඹ දක්වා භාණ්ඩ ප්‍රවාහන නියමු දුම්රියක් ද ධාවනයට එක් කරන බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. |
| 04 | **<u>පූර්ව කාරක සභා රැස්වීමේදී ලබා දුන් නියෝග ක්‍රියාත්මක නොකිරීම</u>**<br>සේවක අතිකාල ගෙවීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දුන් බව පවසන ලිඛිත නියෝගයේ පිටපත් විගණකාධිපතිවරයාට සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස පෙර කාරක සභාවේදී (2019.06.21 දිනැති කාරක සභා කාර්ය | දුම්රිය සේවයේ අතිකාල ගෙවීම ආයතන සංග්‍රහයේ 8 වන පරිච්ජේදයට පටහැනිව සිදුවී ඇති බව ද අතිකාල ගෙවීමේ ක්‍රමවේදය පෙර පරිදිම සිදු කිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත සඳහන් ආකාරයට ලිපියක් නිකුත් කර නොමැති බවද කාරක සභාව හමුවේ ප්‍රකාශ වූ අතර දැනට දුම්රිය සාමාන්‍යාධිකාරවරයා විසින් කලින් කලට ලබාදෙනු ලබන උපදෙස් හා නියම කරනු ලබන සීමාවන්ට යටත්ව අතිකාල ගෙවීම් සිදුකරනු ලබන බව ප්‍රවාහන හා මහාමාර්ග |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | සටහන්හි 8.2 ජේදය) කරන ලද නිර්දේශය ක්‍රියාත්මක නොවීම. | අමාත්‍යාංශයේ ග.නි. විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>අතිකාල ගෙවීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් නිකුත් කර නොමැති බව දුම්රිය දෙපාර්තමේන්තුවේ ග.නි. විසින් ප්‍රකාශ කිරීම තුළ පෙර කාරක සභා රැස්වීමේදී කාරක සභාව නොමග යවා ඇති බව ගම්‍ය වන බැවින් එසේ කාරක සභාව නොමග යැවූ නිලධාරියා කවුරුන්ද යන්නත්, එවැනි ප්‍රකාශයක් කිරීමට හේතු වූ කරුණු කවරේද යන්නත් 2019 ජුනි 21 දින පැවති කාරක සභාවේදී සාකච්ඡා කළ විගණන විමසුම සම්බන්ධ වර්තමාන තත්ත්වය ද ඇතුළත් වාර්තාවක් මාස 2ක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.12.23 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 05 | **<u>දුම්රිය දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ අංශය ශක්තිමත් කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කිරීම.</u>**<br><br>2019 වර්ෂයේදී කෝපා කමිටුව මේ සඳහා අවශ්‍යතාව හඳුනාගෙන අවශ්‍ය නිර්දේශ ලබාදී ඇතත් මේ වනතුරු ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන | දුම්රිය දෙපාර්තමේන්තුව සතු දේපළ බදුදීම සඳහා මාර්ගගත තොරතුරු පද්ධතියක් සකස් කරන ලද බවත් 2024 ජූලි මස 15 දින වනවිට අදාළ බදු දී ඇති දේපළ නියමානුකූල කිරීමට කටයුතු කරමින් පවතින බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ග.නි. ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | නොතිබීම සම්බන්ධයෙන් කාරක සභාව තම අප්‍රසාදය පළ කළේය. | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දුන් කාරක සභාව මේ සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර සම්බන්ධයෙන් සකස් කළ වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.07.17 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 06 | **<u>දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ වත්කම් හා ඒවා බදුදීම පිළිබඳව යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම</u>**<br><br>2019 ජුනි මස 21 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලබාදුන් නිර්දේශ ප්‍රකාරව දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිගණක ගත කිරීම සිදුවී නොමැති බවත් ඉඩම් බදු දීම් වලට අදාළ රු. මිලියන 79ක මුදල් ප්‍රමාණයක් දෙපාර්තමේන්තුවට ලැබී නොමැති බවත් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී. | වර්තමානයේ දී රට පුරා විසිරී පවතින දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් හඳුනාගෙන ඇති බවත්, ආසියානු සංවර්ධන බැංකුව හා එක්ව එම ඉඩම් පරිගණක ගත කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙන බවත්, ප්‍රධාන නගර ආශ්‍රිත දේපළ දැනටමත් පරිගණක පද්ධතියට ඇතුළත් කර ඇති බවත්, දුම්රිය දෙපාර්තමේන්තුව සතු දේපළ වල පදිංචිකරුවන්ට 2024 ජූලි 15 වන දින දක්වා ලියාපදිංචි වීමේ කාලසීමාවක් ද ලබා දී ඇති බවත්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. ඒ අනුසාරයෙන් හඳුනාගත් ලියාපදිංචි වී නොමැති හා අනවසර පදිංචිකරුවන්ට එරෙහිව නෛතික පියවරයන් ගැනීමට බලාපොරොත්තු වන බවද හෙතෙම ප්‍රකාශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/ වත්කම් පිළිබඳව දත්ත ඇතුළත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම පිළිබඳ වාර්තාවක් 2024 අගෝස්තු 5 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙසත් දෙපාර්තමේන්තුව සතු ඉඩම්වල අනවසර පදිංචිවීම් හා ලියාපදිංචිවීම් සංඛ්‍යාව පිළිබඳව සකස් කළ සම්පූර්ණ වාර්තාවක් 2024 සැප්තැම්බර් 15 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.08.05 හා 2024.10.02 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 07 | **<u>වැලිගම දුම්රිය ස්ථානය අසල දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් භූමියෙහි කාමර 14කින් යුතු ගොඩනැඟිල්ලක් අනවසරෙන් ගොඩනැඟීම</u>** | මෙහිදී ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් අදාළ නිලධාරීන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග නොගෙන අදාළ වගකීම එම නිලධාරීන් වෙත පවරමින් වගකීමෙන් නිදහස්වීමට තැත්කිරීම පිළිබඳව කාරක සභාව අප්‍රසාදය පළ කළේය.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>මෙම අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් අත්පත්කර ගැනීම් සම්බන්ධයෙන් අදාළ දුම්රිය ස්ථානාධිපතිවරුන්ට එරෙහිව විනයානුකූල පියවර ගන්නා ලෙසත් මින් ඉදිරියට මෙවැනි දෑ සිදුවීම වැළැක්වීමට කටයුතු කරන ලෙසත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 08 | භාණ්ඩ ලැබීම තහවුරු කර ගැනීමෙන් තොරව දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රු. මිලියන 95ක පමණ වටිනා මුදල් සැපයුම්කරුවන් වෙත ගෙවීම් සිදුකර තිබීම හා 2020 වර්ෂය අවසානය වන විට භාවිතා කළ නොහැකි මට්ටමකින් රු. මිලියන 298ක භාණ්ඩ තොග ගබඩා තුළ තිබීම සම්බන්ධයෙන් ද කාරක සභාවේ අවධානයට ලක්විය. | එමෙන්ම අදාළ සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ ලැබීමකින් තොරව අදාළ මුළු මුදල සැපයුම්කරුවන් වෙත නිදහස් කිරීම අතීතයේ සිට භාවිතා කළ වැරදි ක්‍රියා පටිපාටියක් බවත්, දුම්රිය දෙපාර්තමේන්තුව සුළු ප්‍රමාණයන්ගෙන් භාණ්ඩ මිලදී ගැනීම හේතුවෙන් අදාළ සැපයුම් සඳහා ප්‍රමුඛතාව ලබා ගැනීමට එම ක්‍රියාමාර්ගය අනුගමනය කළ බවත්, වර්තමානයේ භාණ්ඩ ලැබීමට පූර්වයෙන් අදාළ මුදල් ප්‍රමාණයෙන් 80% ක ගෙවීමක් පමණක් සිදුකරීමට නිර්දේශයක් ද සිදුකළ බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>දුම්රිය අමතර කොටස් ආනයනය කිරීම හා තොග කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මීට වඩා විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත කාරක සභාව උපදෙස් දුන්නේය. |
| 09 | **<u>2019 ජුනි මස 21 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේ දී සාකච්ඡාවට භාජනය වූ, ඉන්දියානු ණය ආධාර යටතේ දුම්රිය එන්ජින් 10ක් ආනයනය කිරීම පිළිබඳව හා එසේ ගෙන්වන ලද දුම්රිය එන්ජින් වලින් කිහිපයක් භාවිතයට ගෙන</u>** | මෙවැනි ආනයනන්හි දී තාක්ෂණික වශයෙන් සියලු කාරණා තෘප්ත කිරීම ප්‍රායෝගික නොවන බවත්, අනනුකූලතාවයන් සම්බන්ධයෙන් සැපයුම්කරුවන් සමඟ යම් එකඟතාවයන්ට පැමිණි බවත්, අදාළ ණය පහසුකම ලබාදුන් ඉන්දීය බැංකුව විසින් පනවන ලද ණය කොන්දේසි අනුව ඔවුන් විසින් නම්කළ සැපයුම්කරුවන් අතුරින් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | **<u>නොතිබීම</u>**<br>ඇමෙරිකාවෙන් මීට වඩා අඩු මුදලකට දුම්රිය එන්ජින් ලබාගත හැකිව තිබීම හා ගෙන්වන ලද එන්ජින් සඳහා වූ තාක්ෂණික පිරිවිතර 46 කින් 17ක් අනනුකූල වීමත්, සමස්ත ගනුදෙනුව හරහා රජයට රුපියල් මිලියන 1905 ක පාඩුවක් සිදුවීම පිළිබඳවත් කාරක සභාවේ අවධානයට ලක් විය. | සැපයුම්කරුවෙකු තෝරාගැනීමට සිදුවූ බවත්, මෙහිදී කරුණු දක්වමින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br>එමෙන්ම, ආනයනය කළ දුම්රිය එන්ජින් අතුරින් එක් එන්ජිමක් දරුණු ලෙස අනතුරකට භාජනය වීම නිසා අමතර කොටස් ආනයනය කරන තුරු රත්මලාන දුම්රිය අංගනයේ පවතින බවත් ඉතිරි එන්ජින් 9ම ධාවන තත්ත්වයේ පවතින බවත්, ඉන් 4ක රෝද ගෙවී යාම නිසා රෝද මාරු කිරීම සඳහා නවතා තිබෙන බවත්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. |
| 10 | **<u>විගණකාධිපතිවරයාගේ ලුහුඬු සටහනෙහි අඩංගු කරුණු (2024.06.05 දින රැස්වීමේදී සාකච්ඡාවට නොගත් විගණන ඡේද)</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>2024.06.05 දින රැස්වීම සඳහා විගණකාධිපතිවරයා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද විගණන කෙටි සටහනෙහි (Brief Note) අඩංගු, එහෙත් අද දින සාකච්ඡාවට භාජනය නොකරන ලද විගණන විමසුම් සම්බන්ධ සවිස්තරාත්මක පිළිතුරු වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වන විට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.08.05 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 11 | **<u>අලුතෙන් මෙරටට ගෙන්වන ලද දුම්රිය එන්ජින්වල නඩත්තු කටයුතු සිදුකළ හැකි අයුරින් දුම්රිය අළුත්වැඩියා කිරීමේ අංගන පුළුල් කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙලක් සකස් කිරීමේ අවශ්‍යතාවය</u>** | දුම්රිය සේවය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා ලබා දෙන ලෙසට අමාත්‍ය මණ්ඩලය මගින් කමිටුවක් පත්කර ඇති බවත් එහි වාර්තාව අතිගරු ජනාධිපතිතුමාට ලබාදී ඇති බවත් එම වාර්තාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තවත් කමිටුවක් වෙතින් වාර්තාවක් ඉල්ලා ඇති අතර එය අමාත්‍ය මණ්ඩලයට එළඹෙන සතියේදී පිළිගැන්වීමට නියමිත බවත් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. |
| 12 | **<u>දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ඇති කිරීම, මානව සම්පත කළමනාකරණය කිරීම හා දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනය ප්‍රචලිත කිරීම</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතියක් ඇති කිරීම, මානව සම්පත කළමනාකරණය කිරීම හා දුම්රියෙන් භාණ්ඩ ප්‍රවාහනය ප්‍රචලිත කිරීම යන කරුණු සම්බන්ධයෙන් දුම්රිය දෙපාර්තමේන්තුව ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර පිළිබඳව සකස් කළ වාර්තාවක් 2024 අගෝස්තු 05 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/04/14/03/02-2024 හා 2024.08.05 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |

| | | |
|---|---|---|
| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| **බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන**<br>***(2020, 2021 මුදල් වර්ෂ සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන වාර්තා සහ එම පළාත් පාලන ආයතනවල වර්තමාන කාර්යසාධනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 06** | | |
| කැඳවන ලද ආයතන -<br>❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>❖ බස්නාහිර පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය<br>❖ පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)<br>❖ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (බ.ප)<br>❖ පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)<br>❖ මීගමුව මහා නගර සභාව<br>❖ කළුතර මහා නගර සභාව<br>❖ කඩුවෙල මහා නගර සභාව<br>❖ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව<br>❖ පෑලියගොඩ නගර සභාව<br>❖ මහරගම නගර සභාව<br>❖ මහර ප්‍රාදේශීය සභාව<br>❖ කළුතර ප්‍රාදේශීය සභාව<br>❖ බේරුවල ප්‍රාදේශීය සභාව<br>❖ නාගරික සංවර්ධන අධිකාරිය<br>❖ රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>ඉඩම් කට්ටි කර විකිණීමේදී පොදු කටයුතු සඳහා ඉඩම් කොටස් වෙන් කිරීම.</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>ඉඩම් වෙන්දේසි කිරීමේදී පොදු කටයුතු සඳහා වෙන් කරනු ලබන ඉඩම් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය වන බව කාරක සභාව පෙන්වා දුන්නේය. ඒ අනුව, පසුගිය වසර 20ක පමණ කාලය තුළ ඉඩම් කට්ටි කර විකිණීමේදී පොදු කටයුතු සඳහා වෙන් කර ඇති ඉඩම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලෙස බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br>**බස්නාහිර පළාත් පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අංක CMWP/ACC 3/9/2 – 2023 හා 2024.07.08 දිනැති ලිපිය මගින් අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත.** |
| 02 | **<u>ඉඩම් හා නිවාස විකිණුම්කරුවන්ගේ වංචනික ක්‍රියා නිසා ගැණුම්කරුවන් මුහුණපාන ගැටළු</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>බොහෝ වෙන්දේසිකරුවන් විසින් විකුණනු ලබන ඉඩම් හා නිවාස ඔවුන් විසින් බැංකු වලට උකස්කර තිබීම නිසා ඒවා මිලදී ගන්නා ජනතාව විශාල ගැටළුවලට මුහුණපාන බව අවධාරණය කළ කාරක සභාව, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, ප්‍රධාන ලේකම් (බ.ප), පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප) සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටුවක් මගින් ඒ සඳහා විසඳුම් යෝජනාවලියක් සකස්කර 2024 ජූලි 10 වන විට කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කළේය.<br>ඉහත කමිටුව මගින් ඉදිරිපත් කරනු ලබන විසඳුම් යෝජනාවලියට පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු බව ද කාරක සභාව නිර්දේශ කළේය.<br>• නිවාස යෝජනා ක්‍රම වලින් නිවාස හෝ වෙන්දේසිකරුවන්ගෙන් ඉඩම් මිලදී ගන්නා ජනතාව, විකිණුම්කරුවන්ගේ වංචනික ක්‍රියා නිසා ගැටළු වලට මුහුණපෑම වැළැක්වීම සඳහා යෝජනා.<br>• නිවාස යෝජනා ක්‍රමවල සහ වෙන්දේසි ඉඩම්වල ජලය, විදුලිය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ඇතුළු යටිතල පහසුකම් නිසි පරිදි ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග. <br> • ඉඩම් කට්ටිකර විකිණීමේදී පොදු කටයුතු සඳහා සුදුසු ඉඩම් කොටස් වෙන් කිරීම. <br> **බස්නාහිර පළාත් පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අංක CMWP/ACC 3/9/2 – 2023 හා 2024.07.08 දිනැති ලිපිය මගින් අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත.** |
| 03 | **<u>ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී සියලුම පළාත් පාලන ආයතන සඳහා පොදු ක්‍රමවේදයක් හඳුන්වා දීම</u>** | නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා හඳුන්වා දීමට යෝජිත මාර්ගගත ක්‍රමවේදය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ ගණන්දීමේ නිලධාරි විසින් කාරක සභාව හමුවේ කරුණු දැක්වීමක් සිදු කරන ලදී. <br> **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** <br> යෝජිත වැඩ පිළිවෙළ ඉතාමත් කාලෝචිත මෙන්ම අක්‍රමිකතා අවම කරගත හැකි ක්‍රමවේදයක් බැවින් කඩිනමින් එය ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී. ඒ සඳහා පළාත් පාලන අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධීකරණයෙන් අවශ්‍ය චක්‍රලේඛ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කළ යුතු බවත්, එහි පිටපත් විගණකාධිපතිවරයාට ද යොමු කරන ලෙසත්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br>**මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් අමතන ලද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක PL/7/4/8/2 – 2024 තාව හා 2024.07.05 දිනැති ලිපියේ පිටපත එවා ඇත.**<br>ඊට අමතරව, 2024 වර්ෂයේ සිට පළාත් පාලන ආයතනවල සියලුම සේවාවන් සඳහා මාර්ගගත ක්‍රමවේදය (Online System) අනුගමනය කළ යුතු බව දන්වමින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතන වෙත දැනටමත් යවා ඇති චක්‍රලේඛ පිටපත් විගණකාධිපතිවරයා වෙත යොමු කරන ලෙසත් එම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br>**අදාළ චක්‍රලේඛ පිටපත් විගණකාධිපති වෙත යොමු කළ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ අංක PL/7/4/8/2–2024/තාව හා 2024.07.05 දිනැති ලිපියේ පිටපත එවා ඇත.**<br>එම චක්‍රලේඛයන්ට අනුගත නොවන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල ලේකම්වරුන් සහ අදාළ පළාත් පාලන කොමසාරිස්වරුන් විසින් එහි වගකීම භාරගත යුතු බවත්, නැවත වරක් 2024 අගෝස්තු 09 වැනි දින කාරක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සභාව හමුවට කැඳවනු ලබන බවත්, 2024 සැප්තැම්බර් 18 දින වනවිට මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රගතිය කාරක සභාව විසින් විමර්ශණය කරනු ලබන බවත් කාරක සභාව අවධාරණය කළේය. |
| 04 | <u>දේපළ තක්සේරු කටයුතු ප්‍රමාදවීම</u><br><br>බස්නාහිර පළාතේ ඇතැම් නගර සභා සහ මහ නගර සභා බල ප්‍රදේශවල දේපළ තක්සේරු කටයුතු වසර ගණනාවකින් සිදු කර නොමැතිවීම නිසා වරිපනම් බදු යාවත්කාලීන වී නොමැති බව ද, මේ නිසා සැලකිය යුතු බදු ආදායමක් අහිමි වී ඇති බව ද කාරක සභාව හමුවේ අනාවරණය විය. | වසර 5 න් 5 ට දේපළ තක්සේරුවක් කළ යුතු වුවත්, අදාළ පළාත් පාලන ආයතනයේ ඉල්ලීමකින් තොරව තම දෙපාර්තමේන්තුවට තක්සේරු කටයුතු සිදු කළ නොහැකි බව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු සඳහන් කළේය. අදාළ නිලධාරීන්ගේ හිඟය ද තක්සේරු කටයුතු ප්‍රමාද වීමට බලපා ඇති බැවින් නව නිලධාරීන් 196 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතින බව ද අනාවරණය විය.<br><br>2025 වසර අවසන් වනවිට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලු කටයුතු පරිගණකගත කළ යුතු බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කර ගෙන ඇති එකඟතාවයට අනුව මේ වනවිට ඒ සඳහා අවශ්‍ය දත්ත පද්ධතිය සකස් කර ඇති බවද මෙහිදී අනාවරණය විය.<br><br><u>නිරීක්ෂණ/ නිර්දේශ</u><br><br>තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා කොට, පළාත් පාලන ආයතනවල දේපළ තක්සේරු කිරීමේ කාර්යය නියමිත කාල පරාසයන් තුළ සිදු කිරීමට හැකි වන පරිදි ක්‍රමවේදයක් සකස් කරන ලෙස බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තක්සේරු කටයුතු පරිගණකගත කිරීම සඳහා සකස්කර ඇති දත්ත පද්ධතියේ වර්තමාන තත්ත්වය හා එය මෙතෙක් සම්පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීමට බලපා ඇති ගැටළු පිළිබඳ වාර්තාවක් 2024.06.11 දිනට පෙර කාරක සභාවට යොමු කරන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිර්දේශ කළේය.<br>**රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු ගේ අංක CV/01/25 සහ 2024.06.12 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 05 | **<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>දිස්ත්‍රික්කයේ සියලුම පළාත් පාලන ආයතනවල නියෝජිතයින් සහකාර කොමසාරිස් කාර්යාලයට කැඳවා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සාර්ථක ක්‍රමවේදයක් නොවන බව පෙන්වා දුන් කාරක සභාව, කාර්තුමය වශයෙන් පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අදාළ සියලු නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව පළාත් පාලන ආයතනය තුළ ම පැවැත්විය යුතු බවට නිර්දේශ කළේය.<br>**බස්නාහිර පළාත් පළාත් පාලන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ අංක CMWP/ACC 3/9/2 – 2023 හා 2024.07.08 දිනැති ලිපිය මගින් ඉහත දැනුවත් කිරීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 06 | <u>**පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු**</u> | පළාත් පාලන ආයතනවල විෂයයක් භාරව කටයුතු කරන නිලධාරියකු අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා පත් කිරීම තුළින් ස්වාධීන විගණනයක් අපේක්ෂා කළ නොහැකි බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී. ඒ සඳහා වෙනම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම තුළින් ආයතනවල සිදුවන අක්‍රමිකතා අවම කර ගැනීමට හැකි වන බව කාරක සභාවේ අදහස විය.<br><br>මෙම කරුණ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිත ඉල්ලීම් තම අමාත්‍යාංශය මගින් සිදු කර ඇති නමුත් මෙතෙක් විසඳුමක් ලබා දී නොමැති බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සඳහන් කරන ලදී. පළාත් මට්ටමින් කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කිරීමේ අවශ්‍යතාවය ද මෙහිදී අවධාරණය කෙරිණි.<br><br><u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u><br><br>මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව, පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවන ලෙසට කර ඇති ඉල්ලීමට, පවතින නීතිමය ප්‍රතිපාදන පිළිබඳව ද සැලකිලිමත් වෙමින් සුදුසු විසඳුමක් සොයා කාරක සභාව වෙත දන්වන ලෙස ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 07 | **<u>කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණනයක් සිදු කිරීම</u>**<br>කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති කිහිපයක සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය. | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>i. රු. මිලියන 16 ක පමණ මුදලක් වැය කර ඉදිකිරීම් ආරම්භ කර ඇතත්, ඉදිකිරීම් අවසන් නොකළ පෝරේ ආදාහනාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතියේ සිදුවී ඇති අක්‍රමිකතා පිළිබඳ විගණනයක් සිදු කරන ලෙසත්,<br>ii. වැය කළ මුදලට සාපේක්ෂව ජනතාවට ප්‍රතිලාභයක් ලැබී නොමැති රන්පැලැස්ස කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම තුළින් සිදුවී ඇති මුදල් අක්‍රමිකතාවයන් පිළිබඳව ද විගණනයක් සිදු කරන ලෙසත්,<br>iii. පසුගිය වසර 05 තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති අතුරින් එකම ව්‍යාපෘතිය සඳහා කඩුවෙල පළාත් පාලන ආයතන විසින් ද ප්‍රතිපාදන අනුමත කරගෙන තිබේද යන්න පිළිබඳව විමර්ශනය කරන ලෙසත්,<br>විගණකාධිපතිවරයා වෙත නිර්දේශ කළ කාරක සභාව ඒ පිළිබඳ වාර්තාවක් 2024 ජූලි 10 දින වන විට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ද දන්වා සිටියේය.<br>**විගණකාධිපතිවරයා විසින් 2024.07.10 දින පැවති කාරක සභා රැස්වීමේදී මේ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදී.**<br>**i. මෙම ඉදිකිරීම් අතරමග නැවතී තිබුණද මෙයින් රජයට මූල්‍යමය අලාභයක් සිදුවී නැති බව විගණනයට අනුව තහවුරු වී ඇත.**<br>**ii. විගණනය විසින් පරීක්ෂා කරන අවස්ථාව වනවිට අළුත්වැඩියා** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **කටයුත්තක් සඳහා මෙම ව්‍යාපෘතියේ කටයුතු තාවකාලිකව නතර කර තිබූ බවත්, කසල බැහැර කිරීමේ ප්‍රශ්නයට මෙය ආදර්ශවත් ව්‍යාපෘතියක් බවත්, මෙමගින් යම් ප්‍රමාණයක විදුලි උත්පාදනයක් සිදුවන බවත් විගණනය මගින් පෙන්වා දී ඇත.** |
| 08 | **<u>හිඟ වරිපනම් අය කර ගැනීම</u>** | පළාත් පාලන ආයතන විසින් හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ කටයුතු ඉතා මන්දගාමීව සිදුවන බැවින් එම කටයුතු කඩිනම් කිරීමේ අවශ්‍යතාවය කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. 2023.12.31 දිනට බස්නාහිර පළාත තුළ පමණක් මුද්දර ගාස්තු හැර හිඟ වරිපනම් බදු ප්‍රමාණය රු. මිලියන 12 ඉක්මවන බව ද විගණනය විසින් අනාවරණය කරන ලදී.<br><br>ආදායම් එකතු කිරීමේ නිලධාරීන්ගේ හිඟයක් පවතතින්නේ නම් එම කාර්යය බාහිර පාර්ශවයකට (Out Source Method) පැවරීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා විය.<br><br>තවද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සම්බන්ධයෙන් ද කාරක සභාවේ දී සාකච්ඡා විය. |
| 09 | **<u>2024.06.06 දින කාරක සභා රැස්වීමේදී සාකච්ඡාවට නොගත්, විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව වාර්තා ඉදිරිපත් කිරීම.</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මෙදින සාකච්ඡාව සඳහා විගණකාධිපති විසින් සකස් කළ කෙටි සටහනෙහි අඩංගු එහෙත් රැස්වීමේදී සාකච්ඡාවට භාජනය නොකළ එක් එක් විගණන විමසුම පිළිබඳව වෙන වෙනම විස්තර ඇතුළත් |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | වාර්තාවක් 2024 ජූලි 10 දින වනවිට කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස බස්නාහිර පළාත් සභා ප්‍රධාන ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/FIN-AP/01/FI/18 (C) හා 2024.07.10 දිනැති ලිපිය මගින් පිළිතුරු ඉදිරිපත් කර ඇත.** |
| **ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**<br><br>***(2020, 2021 සහ 2022 මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ වත්මන් කාර්යසාධනය)***<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 06** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය<br>❖ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | | |
| 01 | **<u>ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ තනතුරු පුරප්පාඩු</u>**<br><br>ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ මේ වන විට පුරප්පාඩු 32 ක් පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව ඒ පිළිබඳව විමසීය. | ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ වර්තමානය වන විට අනුමත තනතුරු සංඛ්‍යාව 110 වන බවත්, කාර්යාලයේ කාර්ය භාරය ඉටු කර ගැනීම සඳහා වෘත්තීමය නිපුණතාවය සහිත නිලධාරීන් අවශ්‍ය බවත්, බුද්ධිමය දේපල නිලධාරී තනතුරුවල රාජකාරී කටයුතු, රජය විසින් දැනටමත් බඳවා ගෙන ඇති උපාධිධාරී සංවර්ධන නිලධාරීන්ගෙන් ඉටු කර ගන්නා බවත්, කෙසේ නමුත් මේ වන විට බුද්ධිමය දේපල නිලධාරී තනතුරු සහ පේටන්ට් පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින නමුත් මේ වන විටත් බඳවා ගෙන ඇති සංවර්ධන නිලධාරීන් හට පුහුණුවීම් ලබා දී බුද්ධිමය දේපළ නිලධාරී තනතුරු සහ පේටන්ට් පරීක්ෂක තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමතිය ලබාදී |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | නොමැති අතර එම නිලධාරීන්ව විවෘත තරඟ විභාගයක් පවත්වා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබාදී ඇති බවත්, එම තනතුරු පුරප්පාඩු, පුරවා ගැනීම සඳහා විවෘත විභාගයක් පැවැත්වීමට විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවූ බවත් මේ වන විට එහි කටයුතු අවසන් අදියරේ පවතින බවත් ප්‍ර.ග.නි/ ග.නි විසින් ප්‍රකාශ කළේය. අදාළ විභාගය 2024 අගෝස්තු මස පැවැත්වීමට කටයුතු යොදා ඇතිබව විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දූරකතනය ඔස්සේ සම්බන්ධ කර ගැනීමේදී තහවුරු කරන ලදී.<br>**බුද්ධිමය දේපල නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා පුරප්පාඩු මේ වන විටත් ගැසට් පත්‍රයේ පළ කර ඇති බව සහ පේටන්ට් පරීක්ෂක තනතුරු සඳහා විවෘත තරඟ විභාගයකින් බඳවා ගැනීම් සිදු කිරිමට අයඳුම්පත් කැඳවීමේ නිවේදනය විභාග දෙපාර්තමේන්තුව වෙත යවන බව වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/ADM/03/CoPA හා 2024.07.31 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 02 | **<u>සුරක්ෂිතාගාරය, අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානය ඇති කිරීමේ ව්‍යාපෘතිය.</u>**<br>ජාතික බුද්ධිමය කාර්යාලය සඳහා සුරක්ෂිතාගාරයක්, අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් සහ පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම | මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කළ සතොස ආයතනයට අයත් පරිශ්‍රය පසු කළෙක මිශ්‍ර සංවර්ධිත (Mixed Development) ව්‍යාපෘතියක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ නිසා ජාතික බුද්ධිමය කාර්යාලය සඳහා සුරක්ෂිතාගාරය, අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය සහ පුහුණු මධ්‍යස්ථානය ඇති කිරීමේ ව්‍යාපෘතිය නැවත්වීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | වෙනුවෙන් වැය කරන ලද රු.22,978,101/- ක මුදල ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් මේ දක්වා ප්‍රතිපූරණය කර නොතිබීම පිළිබඳව කාරක සභාව විමසීය. | කැබිනට් මණ්ඩලය තීරණය කළ බවත් අදාළ මුදල් ආපසු ලබා ගැනීමට ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයෙන් අවශ්‍ය ඉල්ලීම් සිදු කළ ද මේ දක්වා එම මුදල් නොලැබුණ බවත් ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 03 | <u>**ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ඇති ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය (Digitization Project)**</u><br>2015 සිට 2023 දක්වා වෙළඳ ලකුණු සඳහා අයදුම්පත් 88,797 ක් ලැබී ඇති බවත් ඉන් 54,520 ක් ලියාපදිංචි කර ඇති බවත් ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ දත්ත පද්ධතියකට අමතරව ලිපිගොනු භාවිතයෙන් ද රාජකාරී කටයුතු සිදු කරනු ලබන බවත් කාරක සභාව හමුවේ අනාවරණය විය. | ලෝක බුද්ධිමය දේපල සංවිධානයේ (World Intellectual Property Organization – WIPO) ආධාර යටතේ ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතියක් සිදු කිරීමට නියමිත බවත්, ලිපිගොනු තබා ගැනීම සඳහා ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් නොමැති නිසා එම ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපහසු වී ඇති බවත් ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් ප්‍රකාශ කළ අතර, මෙම ව්‍යාපෘතිය සඳහා තාවකාලිකව ලිපිගොනු කොටස් වශයෙන් තබා ගත හැකි වන සේ ඉඩ පහසුකම් ලබා දීමට කටයුතු කළ බව වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. එහෙත් ලිපිගොනු රාජකාරී කටයුතු සඳහා නිරන්තරයෙන් භාවිතා කරන බැවින් එසේ කොටස් වශයෙන් ලිපිගොනු අදාළ ස්ථානයට රැගෙන යාම සිදු කළ නොහැකි බව ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් කරුණු දැක්වීය.<br><u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u><br>මේ වන විට ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ පවතින ලිපිගොනු සංඛ්‍යාව, සහ ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය අවසන් කිරීම සම්බන්ධයෙන් දින වකවානු සහිත ක්‍රියාකාරී සැලැස්ම (Action Plan) පිළිබඳ ලිඛිත වාර්තාවක් 2024.06.20 වන දිනට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙසත්, අදාළ ලිපිගොනු ස්කෑන් කිරීම සඳහා අවශ්‍ය සහාය ජාතික බුද්ධිමය දේපල කාර්යාලය වෙත ලබා දෙන ලෙසත් වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි. <br><br> ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය (Digitization Project) අවසන් කර අවුරුදු 1ක් ඇතුළත මාර්ග ගත ක්‍රමය (online) හරහා අයදුම්පත් භාර ගැනීමේ පහසුකම් ඇති කළ හැකි බව ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. <br><br> **ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක අංක 2/4/8 VOL III හා 2024.06.20 දිනැති ලිපියෙන් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 04 | **<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) සේවාදායකය (Server) මිලදී ගැනීමේ ගිවිසුම.</u>** <br><br> ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) සේවාදායකය මිලදී ගැනීමේ ගිවිසුම ප්‍රකාරව රුපියල් මිලියන 32.5 ක් ගෙවා තිබුණ ද එම සේවාදායකය ලබා දී නොතිබු අතර මුදල් ආපසු ලබා දීමක් ද සිදු නොවීම පිළිබඳ කාරක සභාව විමසීය. | මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසීමේ දී අදාළ ආයතනය සමඟ සාකච්ඡා කරන ලෙස නීතිපතිවරයා විසින් දන්වා එවන ලද බවත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරු අතර සාකච්ඡා පැවැත්වුව ද මේ වන විටත් සේවාදායකය හෝ මුදල් නොලැබුණ බවත්, මේ වන විට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් සේවාදායකය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති බැවින් වෙනත් ආයතනයකින් සේවාදායකය මිලදී ගැනීම සඳහා නව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමේ ගැටළුකාරී තත්වයක් ඇති බවත්, කෙසේ නමුත් තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා (Data Repository) නව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සේවාදායකය මිලදී ගැනීමට අවශ්‍ය වන බවත් ප්‍ර.ග.නි/ග.නි ප්‍රකාශ කළේය. තවද සේවාදායකය මිලදී ගැනීම සඳහා නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ඇති බාධාව පිළිබඳ කරුණු සොයා බලන බව වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි ප්‍රකාශ කළේය. |
| 05 | **<u>ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ඉඩකඩ පිළිබඳ විගණනය කිරීම (Space Audit)</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>කමිටුවක් පත්කර ඒ මගින් බුද්ධිමය දේපල කාර්යාලයේ ඉඩකඩ පිළිබඳ විගණනය කර ඒ පිළිබඳ වාර්තාවක් 2024.07.10 වන දිනට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.<br>**වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/ADM/03/CoPA හා 2024.07.15 දිනැති ලිපියෙන් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 06 | **<u>ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ඇති ලිපිගොනු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීම.</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ලිපිගොනු විශාල ප්‍රමාණයක් පැවතිය ද ඉඩකඩ පහසුකම් සීමා සහිත බැවින් පැරණි ලිපිගොනු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරන ලෙස ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිර්දේශ කළ අතර ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකරන ලෙස වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කරන ලදි. |
| 07 | **<u>ලියාපදිංචිය ප්‍රමාද වූ වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම්.</u>**<br>2023.12.31 දිනට ලියාපදිංචි කර තිබූ වෙළඳ ලකුණු අයදුම්පත් 3762 කින් අයදුම්පත් 892 ක් 1995 - 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් කර තිබූ ඒවා වූ අතර ඉන් අයදුම්පත් 27ක් සම්බන්ධයෙන් සිදු කළ නියදි පරීක්ෂාවේ දී වර්ෂ 2 සිට වර්ෂ 28 දක්වා වූ කාලයක් ඒ සඳහා ගෙන තිබූ බව කාරක සභාවේ දී අනාවරණය වූ අතර මෙතරම් කාලයක් ප්‍රමාද වීම පිළිබඳව කාරක සභාව විමසීය. | ලොව බොහෝ රටවල් වෙළෙඳ ලකුණු ලියාපදිංචිය සඳහා අවම වශයෙන් අවුරුදු 1 ක පමණ කාල සීමාවක් ගනු ලබන බව ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි ප්‍රකාශ කළාය. එසේම මෙම ප්‍රමාදයන් සඳහා ප්‍රධාන වශයෙන් ආයතනය තුළ පවතින නිලධාරීන්ගේ හිඟකම හේතු වන බවත්, ඊට අමතරව අයදුම්පත්‍ර ඉදිරිපත් කරන්නන්ගෙන් සිදුවන ප්‍රමාද, වෙළඳ ලකුණු ලියාපදිංචියේ දී තුන්වන පාර්ශව විසින් ගොනු කරනු ලබන විරෝධතා, ඒකපාර්ශවික විභාග, ජාත්‍යන්තර අයදුම්පත් සම්බන්ධයෙන් ජාත්‍යන්තර සම්මුතීන්ගේ කොන්දේසි ඉටු කිරීමට සිදු වීම වැනි හේතූන් බලපානු ලබන බව ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |
| 08 | **<u>වෙළඳ ලකුණු ලියාපදිංචිය ප්‍රමාද වීම වැළැක්වීම සඳහා කැලි ක්‍රමයට (piece rate) ගෙවීම් සිදු කිරීම.</u>**<br>ලියාපදිංචිය ප්‍රමාද වූ වෙළෙඳ ලකුණු අයදුම්පත්, ලියාපදිංචිය කඩිනම් කිරීමට ගත හැකි විසඳුම් සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | අතපසු වූ මෙම වැඩ (Backlog) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් අනුමත කර ඇති කැලී ක්‍රමය යටතේ (Piece Rate) ක්‍රියාත්මක කිරීමට ජාතික බුද්ධිමය දේපල කාර්යාලය අපේක්ෂා කළ ද ඒ සඳහා දෛනිකව ගෙවනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බැවින් යම් පසුබෑමක් ඇති බවත්, එම නිසා කැලී ක්‍රමය (Piece Rate) යටතේ වැඩි මුදලක් ගෙවීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම යෝග්‍ය බවත් වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි ප්‍රකාශ කළ අතර කෙසේ නමුත් පවතින අතපසු වූ වැඩ ප්‍රමාණය ඉතා අධික බැවින් ඒවා අවසන් කළ හැකි නිශ්චිත දිනයක් දැක්විය නොහැකි බවත් ඉදිරියේ දී මෙවැනි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ප්‍රමාදයන් ඇති වීම වැළැක්වීම සඳහා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පමණක් භාර ගැනීම සුදුසු බවත් ඔහු තවදුරටත් පැහැදිලි කළේය. මෙහි දී නියමිත අවස්ථාවේ දී මුදල් නොගෙවීම වැනි හේතු ද මේ සඳහා බලපාන බව ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් ප්‍රකාශ කළාය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>වෙළඳ ලකුණු ලියාපදිංචිය ප්‍රමාද වීම වැළැක්වීම සඳහා කැලි ක්‍රමයට ගෙවීම් සිදු කිරීමේ දී (Piece Rate) වැඩ නිමකිරීම සඳහා ඒ ඒ නිලධාරියාට ලබා දුන් ලිපිගොනු සංඛ්‍යාව, නිලධාරියාගේ නම, තනතුරු නාමය සහ ඒ ඒ නිලධාරියාට ගෙවූ මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් 2024.06.20 වන දිනට හෝ ඊට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස හා ලියාපදිංචිය ප්‍රමාද වූ වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම් පිළිබඳ ඒවා ලියාපදිංචි කිරීමේ දී ඉටු කළ යුතු පියවරයන් තුළ ප්‍රමාද වී ඇති කාලවකවානු සම්බන්ධයෙන් (age analysis) ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ දත්ත පද්ධතිය අනුව වාර්තාවක් 2024.07.04 දින හෝ ඊට පෙර කාරක සභාව වෙත ලබා දෙන ලෙස ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදි.<br><br>**ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක අංක 2/4/8 VOL III හා 2024.06.20 දිනැති ලිපියෙන් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 09 | <u>භූ ගෝලීය දර්ශක ලියාපදිංචිය</u> | මුල් අවස්ථාවේ දී භූ ගෝලීය දර්ශක වෙළඳ ලකුණු යටතේ ලියාපංදිචි කළ බවත්, නව ක්‍රමවේදයක් යටතේ ලියාපදිංචි |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපල පනත 2022 වර්ෂයේ සංශෝධනය කළ බවත් ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් ප්‍රකාශ කළේය. කෙසේ නමුත් මේ දක්වා අදාළ රෙගුලාසි ගැසට් කර නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය වූ අතර ඊළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කර එය ගැසට් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය. |
| 10 | <u>**ජාතික බුද්ධිමය කාර්යාලයේ මැඩ්රිඩ් ව්‍යාපෘතිය**</u> | 2016 අය වැය මඟින් වෙළඳ හා සේවා ලකුණු ජාත්‍යන්තරව ලියාපංදිචි කිරීම සඳහා ජාතික බුද්ධිමය කාර්යාලයේ මැඩ්රිඩ් ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 78 ක මුදලක් වෙන් කර තිබුණ ද, 2023 වර්ෂය අවසන් වන විටත් මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීමේ කාර්යයන් අවසන් කිරීමට නොහැකි වී තිබූ බැවින් වෙළඳ ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීමේ කටයුතු සිදුකර නොමැති බව විගණනයේ දී පෙන්වා දෙන ලදී. |
| **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**<br>***(2020, 2021, 2022 මුදල් වර්ෂ සඳහා විගණකාධිපති වාර්තා හා වර්තමාන කාර්යසාධනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 07** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය<br>❖ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ | | |
| 01 | <u>**ජන හා නිවාස සංගණනය - 2021 වර්ෂය**</u> | ජන හා නිවාස සංගණනය 2021 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කළ නමුත් 2020 වර්ෂයේ ඇති වූ කොවිඩ් වසංගතය සහ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණකන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | 2022 වර්ෂයේ රට තුළ ඇති වූ ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සංගණනයට අවශ්‍ය ටැබ්ලට් යන්ත්‍ර මිලදී ගැනීමේ ක්‍රියාවලියට බාධා ඇති වූ බව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගණකන් දීමේ නිලධාරී (ග.නි.) ප්‍රකාශ කළේය.<br><br>ජන හා නිවාස සංගණනයක් අදියර 04ක් යටතේ සිදු කරනු ලබන බව හා පළමු අදියර යටතේ, මුළු දිවයිනම "සංගණන කාණ්ඩ" ලෙස කොටස් කර සිතියම්ගත කරනු ලබන බවත් එහි පළමු අදියර යටතේ මේ වන විට මුළු දිවයිනම ඩිජිටල් දත්ත පද්ධතියකට ඇතුළත් කර ඇති බවත් GIS තාක්ෂණය (භූගෝලීය තොරතුරු පද්ධතිය) භාවිතා කර ග්‍රාම නිලධාරී කොට්ඨාශ සියල්ල ඩිජිටල්කරණය කර (Digitalize) ඒ තුළ හඳුනාගත් සංගණන කාණ්ඩ ද ඩිජිටල්කරණය කර ඇති බව ග.නි. ප්‍රකාශ කළේය.<br><br>සංගණනයේ දෙවන අදියර යටතේ, දැනට භාවිතයේ පවතින සියළුම ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමේ කාර්යය 2023 වර්ෂයේදී ආරම්භ කළ බව ග.නි. ප්‍රකාශ කළේය. ටැබ්ලට් යන්ත්‍ර මිලදී ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම, 2018 වර්ෂයේ අනුමත කළ ගෙවීම් චක්‍රලේඛ අනුව 2023 වර්ෂයේදී ගෙවීම් සිදු කිරීම ඇතැම් නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම ගෙවීම් වැඩි කිරීමට සිදුවීම, හා ඇතැම් නිලධාරීන් රාජකාරිවලින් ඉවත්වීම හේතුවෙන් වෙනත් නිලධාරීන් ඒ සඳහා අනුයුක්ත කිරීමට සිදුවීම වැනි කරුණු හේතුවෙන් ගොඩනැගිලි ලැයිස්තුගත කිරීමේ ක්‍රියාවලියේ යම් ප්‍රමාදයක් ඇති වී ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | බවද අනාවරණය විය.<br>ජන හා නිවාස සංගණනයෙන් පසු පිළියෙල කරනු ලබන මූලික වාර්තාව නිකුත් කළ හැකි දිනය පිළිබඳව කාරක සභාව විමසූ අතර, 2024 වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී මූලික වාර්තාව පිළියෙල කර අවසන් කිරීමට අපේක්ෂා කරන බව ග.නි. ප්‍රකාශ කළේය.<br>**<u>නිර්දේශ</u>**<br>ජන හා නිවාස සංගණනයට අදාළ ඒ ඒ පියවරයන් සමඟ අවසාන වාර්තාව සකස් කිරීමට අපේක්ෂිත දින වකවානු සහිත වාර්තාවක් 2024.06.14 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත නිර්දේශ කළේය.<br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/10/C & S/CoPA/2024 හා 2024.06.24 දිනැති ලිපිය මගින් 2024 වර්ෂයේ ජන හා නිවාස සංගණනය සඳහා කාල රාමුව ඉදිරිපත් කර ඇත. ඒ අනුව, 2024.07.01 දින සිට ගණන්ගන්නා නිලධාරීන් පුහුණු කිරීමෙන් ආරම්භ කරනු ලබන මෙම වැඩසටහනේ අවසාන වාර්තාව 2025.03.31 දින වන විට ප්‍රකාශ කරන බවට දන්වා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | **<u>ජන හා නිවාස සංගණනය-2021 වර්ෂය, ආර්ථික සංගණනය, ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය (HIES) හා ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය (DHS) නොපැවැත්වීම.</u>** | ජන හා නිවාස සංගණනය ප්‍රමාද වීමත් සමඟ අනෙකුත් සංගණන / සමීක්ෂණ ද ප්‍රමාද වූ බව ග.නි. ප්‍රකාශ කළ අතර ජීවන හා පරිභෝජන රටාව සාමාන්‍ය මට්ටමක පවතින වර්ෂයක දී ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය (HIES සමීක්ෂණය) සිදු කළ යුතු බැවින් සහ මේ වන විට නිවාස ව්‍යුහය බොහෝ සෙයින් වෙනස් වී ඇති බැවින් 2011 වර්ෂයේදී සකස් කළ සංගණන රාමුව අනුව HIES සමීක්ෂණය නොපවත්වන ලෙසට උපදේශකවරුන්ගෙන් උපදෙස් ලැබුණු බව ග.නි. ප්‍රකාශ කළේය. බොහෝ සමීක්ෂණ සඳහා HIES සමීක්ෂණයේ දත්ත යොදා ගන්නා බැවින් දත්ත අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා 2023 වර්ෂයේ දී ඒ වෙනුවෙන් ක්ෂණික සමීක්ෂණයක් (Quick Survey) පැවැත්වූ බවත් අනාවරණය විය. |
| 03 | **<u>"ඊ-ග්‍රාම නිලධාරි" ව්‍යාපෘතිය (e-GN Project)</u>**<br>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජන හා නිවාස සංගණනයට අදාළ දත්ත රැස් කිරීමේ ආකෘති පත්‍රය මඟින් රැස් කරනු ලබන සියලු දත්ත, "ඊ-ග්‍රාම නිලධාරි" ව්‍යාපෘතිය (e-GN Project) සඳහා ග්‍රාම නිලධාරීවරුන් විසින් ද වෙනත් ආකෘති පත්‍රයක් භාවිතයෙන් රැස් කරනු ලබන බවත්, ජන හා නිවාස සංගණනයට රැස්කරනු ලබන දත්තවලට අමතරව "ඉ-ග්‍රාම නිලධාරි" ව්‍යාපෘතිය සඳහා අමතර දත්ත සුළු ප්‍රමාණයක් පමණක් | රාජ්‍ය ආයතන කිහිපයක් විසින් එක හා සමාන දත්ත විටින් විට රැස් කිරීම මහජනතාවට පීඩාකාරී වන බව කාරක සභාව විසින් පෙන්වා දුන් අතර එහිදී රජයේ වියදම වැඩිවීම හා ශ්‍රමය හා කාලය අපතේ යෑම සිදුවන බවද අවධාරණය කළේය. දත්ත රැස් කිරීමේදී සෑම ආයතනයකටම අවශ්‍ය වන පොදු දත්ත එක් ආකෘති පත්‍රයක් මගින් එක් ආයතනයක් විසින් රැස් කිරීමත් අවශ්‍ය අනෙකුත් ආයතනවලට එම දත්ත සඳහා ප්‍රවේශය (access) ලබා දීමත් වඩා ඵලදායී බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br>"ශ්‍රී ලංකාවේ සංඛ්‍යාලේඛන සංවර්ධනය පිළිබඳ ක්‍රමෝපායක්" සකස් කිරීමට මේ දිනවල කටයුතු කරමින් පවතින බවත් ඒ සඳහා වූ මෙහෙයුම් කමිටුවේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | ග්‍රාම නිලධාරීවරුන් විසින් රැස්කරනු ලබන බවත් අනාවරණය විය. | සභාපතීත්වය මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දරන බවත් එම සංඛ්‍යාලේඛන පද්ධතිය (Statistical System) ස්ථාපනයට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පමණක් නොව අනෙකුත් රාජ්‍ය ආයතනද එකාබද්ධව කටයුතු කරන බවත් ඒ හරහා දත්ත වෙනත් ආයතනයකට භාවිතා කිරීමේ හැකියාව පවතින බවද ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පරිපාලන දත්ත එකතු කර ආරක්ෂිතව පවත්වා ගැනීමට අවශ්‍ය නෛතික බලය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට ලබා දීමට නව පනතක් කෙටුම්පත් කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත් එය අවසන් අදියරේ පවතින බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>යෝජිත නව පනත් කෙටුම්පත, නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරනු ලබන දිනය, අමාත්‍ය මණ්ඩලයට යොමු කරන දිනය, හා එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර සම්මත කිරීම සම්බන්ධයෙන් දින වකවානු සහිත වාර්තාවක් 2024.06.14 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/10/C & S/CoPA/2024 හා 2024.06.24 දිනැති ලිපිය මගින් මෙම** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **කාලරාමුව ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව, යෝජිත නව පනත් කෙටුම්පත 2024.06.24 දින නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන බව දක්වා ඇත.**<br>රාජ්‍ය ආයතනයන් විසින් එක හා සමාන දත්ත රැස් කිරීමේ සංගණනයන්/ සමීක්ෂණයන් පැවැත්වීමට අදාළව අනවශ්‍ය වියදම් අවම කර එම සංගණනයන්/සමීක්ෂණයන් පැවැත්වීමට, අදාළ රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණයක් ඇති කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙස කාරක සභාව විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කළේය.<br>ඒ සඳහා තාක්ෂණ අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වැඩපිළිවෙලක් පවතින බවද දැනට ඉදිරිපත් කර ඇති ඩිජිටල් උපායමාර්ගවලට අනුව සියලු රාජ්‍ය ආයතනවලට අවශ්‍ය දත්ත පද්ධති සඳහා අවශ්‍ය උපදේශන සේවා ලබාදීමට එක් ආයතනයක් ස්ථාපිත කිරීමට නියමිත බවත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සාකච්ඡා සිදු කරමින් පවතින බවත් ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.<br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/10/C & S/CoPA/2024 හා 2024.07.04 දිනැති ලිපියෙන්, ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය මගින් රැස් කරනු ලබන තොරතුරු දැනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා යොදා ගත නොහැකි බැවින් 2031 වසරේදී පැවැත්වීමට නියමිත** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **මීළඟ සංගණනයේදී මෙම දත්ත හුවමාරු කරගැනීමට හා ඒ සඳහා අදාළ ආයතන අතර එකඟතාවයකින් යුතුව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලද බව වාර්තා කර ඇත.**<br>තවද, ඉ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතියට අදාළ දත්ත රැස් කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරන ලෙස දන්වමින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත ලිපියක් යොමු කරන ලෙස කාරක සභාවේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br>**ඉහත ලිපිය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ලේකම් විසින් අංක ර.ගි.කා.ස./09/05/2024 හා 2024.06.14 දිනැතිව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත.** |
| 04 | <u>තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සැලැස්ම 2016 - 2025</u> | 2016 වර්ෂයේදී ප්‍රථම වරට ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය (DHS) ටැබ්ලට් පරිගණක යන්ත්‍ර භාවිතයෙන් පවත්වා වාර්තාවක් නිකුත් කර ඇති බවත්, දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් මාධ්‍ය නිවේදන වෙබ් අඩවිය හරහා නිකුත් කර ඇති බවත්, ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය හා එළඹෙන වසරේ පැවැත්වීමට සැලසුම්කර ඇති ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය ටැබ්ලට් පරිගණක යන්ත්‍ර භාවිතයෙන් සිදු කිරීමට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අපේක්ෂිත බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br>2016-2025 කාලසීමාව සඳහා සැලසුම් කරන ලද තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන ක්‍රියාකාරකම් ඇතුළත්ව ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත්කර ඇති වාර්තාවේ ප්‍රගතිය පිළිබඳව ද කාරක සභාවේ දී සාකච්ඡාවට ලක් විය.<br>කාලානුරූපීව මිනිස් පරිභෝජන රටාවන් වෙනස් වන බැවින් මිල දර්ශකවල පාදක වර්ෂය වරින් වර වෙනස් වන බවත් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පාදක වර්ෂය 2021 වන බවත් කාරක සභාව නිරීක්ෂණය කළ අතර දිවයිනම ආවරණය කරමින් භාණ්ඩ මිල රැස්කිරීමේ ක්‍රමවේදය පිළිබඳවද කාරක සභාවේදී සාකච්ඡාවට ලක්විය. |
| 05 | <u>ඒක පුද්ගල ගෘහ ඒකක වියදම</u> | සාමාන්‍ය මාසික ඒක පුද්ගල ගෘහ ඒකක වියදම රු.17,000 ක් පමණ වන බවත් ඒ ඒ දිස්ත්‍රික්කය අනුව එහි යම් යම් වෙනස්කම් පවතින බවත් ග.නි. ප්‍රකාශ කළ අතර, සෑම මසකම 21වන දින නිකුත් කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයට අනුකූලව දිස්ත්‍රික්ක සහ ජාතික මට්ටමින් ඒක පුද්ගල වියදම ප්‍රකාශයට පත් කරන බවද ප්‍රකාශ කළේය. 2024 වර්ෂයේ ජන හා නිවාස සංගණන දත්ත සහ 2025 වර්ෂයේ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණ දත්ත භාවිතා කර කෙටි කාලීන තීරණ ගැනීමට අවශ්‍ය දර්ශක සැකසීමට අපේක්ෂා කරන බවද ග.නි. වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br>පසුගිය කාල වකවානුවේ පැවති ආර්ථික අර්බුදය ගෘහ ආර්ථිකයට බලපෑවේ කෙසේද යන්න හා එම ගැටළු වලට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | නිවැසියන් විසින් ගනු ලැබූ උපායමාර්ග (Strategies) පිළිබඳ පරීක්ෂා කිරීමට 2023 වර්ෂයේ පැවැත්වූ සමීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කර ඇති බවද ග.නි. ප්‍රකාශ කළේය.<br>**<u>නිර්දේශ</u>**<br>2022 වර්ෂයේ ගෘහ ඒකක වියදම 2023 වර්ෂයේ ගෘහ ඒකක වියදමෙන් වෙනස් වූ ආකාරය පිළිබඳව සංසන්දනාත්මක වාර්තාවක් සතියක් තුළ කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය.<br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/10/C & S/CoPA/2024 හා 2024.06.24 දිනැති ලිපිය මගින් මෙම වාර්තාව ඉදිරිපත් කර ඇත.** |
| 06 | **<u>ලෝක බැංකු ආධාර හා රජයේ අරමුදල් වැයකර දෙපාර්තමේන්තුව සඳහා 2015 වර්ෂයේ මහල් 12කින් යුතු ගොඩනැගිල්ලක් ඉදිකර එහි කාර්යාල කටයුතු ආරම්භ කර තිබීම.</u>**<br>ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ සම්පූර්ණ වාර්තාව හා වගකීම් සහතිකය කොන්ත්‍රාත්කරු වෙතින් ලබා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබීම, ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට සති දෙකක කාලයක් තිබියදී රැඳවුම් මුදලින් 88%ක් එනම් | මේ වනවිට ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාළ මුළු ගෙවීම් ගෙවා ඇති බව හා රැඳවුම් මුදල (Retention Fee) නිදහස් කර (Release) ඇති බව අනාවරණය විය. ගොඩනැගිල්ල වෙනුවෙන් වූ අවසන් ගෙවීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇති බවද ග.නි. ප්‍රකාශ කළේය.<br>රැඳවුම් මුදලින් (Retention Fee) මිලියන 05ක් පමණ රජයේ ආදායමට බැරකර තිබූ බවත් පෞද්ගලික උපදේශකගේ (Engineering Consultants limited) නිර්දේශය මත එම රැඳවුම් මුදල නිදහස් කර ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. පළමු අදියරේදී ලෝක බැංකු ණය ආධාර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | රු.35,673,850ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබීම, වර්ෂා දිනවලදී ඉහළ මහලවල ජලය කාන්දුවීම හා අභ්‍යන්තර කාර්යාල පරිශ්‍ර තුලට ජලය ගලාඒම වැනි අඩුපාඩු විගණනයට නිරීක්ෂණය වී ඇත. | යටතේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා ගැඹුරු අත්තිවාරම් දැමීමේ කටයුතු (Piling) සිදු වූ බවත් ඒ සඳහා රු. මිලියන 109ක් වැය වූ බවත් දෙවන අදියරේදී රජයේ අරමුදල් වැයකර ගොඩනැගිල්ල ඉදිකර ඇති බවත් ඒ සඳහා රු. මිලියන 1070ක් පමණ වැය වී ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේය. කොන්ත්‍රාත්කරු සමඟ පවතින අඩුපාඩු සම්බන්ධයෙන් සාකච්ඡා කළද ඔවුන් ඊට ප්‍රතිචාර දක්වා නොමැති අතර කොන්ත්‍රාත්කරු සමඟ ඇති කර ගත් ගිවිසුම මේ වන විට අවසන් ව ඇති බවත් අනාවරණය විය.<br><br><u>නිර්දේශ</u><br><br>ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුව සකස් කිරීම හා ගොඩනැගිල්ල සඳහා වන ගිවිසුම් අත්සන් කිරීම සිදු කළේ කවුරුන් විසින්ද යන්නත් රජයේ ආයතනයක නිර්දේශයක් නොමැතිව පෞද්ගලික උපදේශන ආයතනයක නිර්දේශය මත ගෙවීම් සිදු කිරීම හා රැඳවුම් මුදල නිදහස් කිරීම සිදු කරනු ලැබුයේ කෙසේද යන්නත් ඇතුළත් සවිස්තර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>CECB ආයතනයෙන් තාක්ෂණික විගණනයක් (Technical Audit) සිදු කිරීමට 2020 වර්ෂයේ ඇස්තමේන්තුවක් ලබා දුන් නමුත් ඒවන විට ප්‍රතිපාදන නොතිබූ බැවින් එය සිදු කිරීමට නොහැකි වූ බවත් මෙම වර්ෂයේදී එය සිදු කිරීමට අපේක්ෂා කරන බවත් ග.නි. ප්‍රකාශ කළේය. ගොඩනැගිල්ලේ ජලය කාන්දුවීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | හා කාර්යාල පරිශ්‍ර තුළට ජලය ගලා ඒම වැළැක්වීමට කළ යුතු පිළිසකර වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් මේවන විට ඇස්තමේන්තුවක් ලැබී ඇති බවත් ඊට අදාළ ප්‍රසම්පාදන කටයුතු මේවන විට සිදුකර ගෙන යනු ලබන බවත් ග.නි. ප්‍රකාශ කළේය.<br><br>ප්‍රධාන ගොඩනැගිල්ල සම්බන්ධයෙන් රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවෙන් හෝ CECB ආයතනයෙන් එයට අදාළ ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙසත්, ගොඩනැගිල්ලේ අඩුපාඩු නිවැරදි කරගැනීමට ගතයුතු පියවර පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්කරන ලෙසත්, කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළ අතර වහාම ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරන ලෙසද නිර්දේශ කළේය.<br><br>**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF06/10/C & S/CoPA/2024 හා 2024.06.24 දිනැති ලිපිය මගින් මෙම තොරතුරු ඇතුළත් වාර්තාවන් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගනු ලබන බව වාර්තා කර ඇත.**<br><br>ඉහත ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් නිර්දේශ කරමින් සහතිකය ලබා දුන් පෞද්ගලික උපදේශක සමාගම විසින් අදාළ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් නිවැරදි සහතිකයක් ලබා දී නොමැති බැවින් එම සමාගම අසාධු ලේඛනගත කිරීමට (Blacklist) කටයුතු කරන මෙන් කාරක සභාව විසින් ප්‍ර.ග.නි. වෙත නිර්දේශ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කළේය.<br>**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DCS/ACC/F13/04 හා 2024.12.18 දිනැති ලිපියෙන් ඉහත කරුණු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 07 | **<u>මුද්‍රණ අංශයේ හා පැරණි කාර්යාල පරිශ්‍රයේ පවතින අඩුපාඩු</u>**<br>දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී මුද්‍රණ අංශය එම ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීමට සැලසුම්කර නොතිබීම සම්බන්ධයෙන් විගණනය කරුණු අනාවරණය කළේය. මුද්‍රණ අංශය දෙපාර්තමේන්තුව පිහිටා ඇති නව ගොඩනැගිලි පරිශ්‍රය වෙත ගෙන ඒමේ හැකියාව සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසන ලදි. | මුද්‍රණ අංශයේ විශාල යන්ත්‍ර ප්‍රමාණයක් ඇති බැවින් ඒවා ක්‍රියාත්මක කිරීමේ දී අනෙකුත් අංශ සමඟ එම අංශය පවත්වා ගෙන යාමේ ගැටලු ඇති බව ග.නි. පෙන්වා දුන්නේය.<br>**<u>නිර්දේශ</u>**<br>මුද්‍රණ අංශය ස්ථාපිත ගොඩනැගිල්ල ඵලදායී ලෙස භාවිතයට ගන්නා ලෙස කාරක සභාව නිර්දේශ කළේය.<br>එම ගොඩනැගිල්ල පිළිසකර කර එම අංශය විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව ග.නි. ප්‍රකාශ කළේය. |

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

***(2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)***

**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 18**

**කැඳවන ලද ආයතන -**
- කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

| | | |
|---|---|---|
| 01 | **<u>2016 මාර්තු 11 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ</u>** | සැලැස්මක් සකස් කර තිබුණද, එම සැලැස්ම අපේක්ෂිත ඉලක්ක කරා යාමට තරම් ප්‍රමාණවත් නොවන බව අවබෝධ වී ඇති බැවින් 2030 වර්ෂය දක්වා නව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **<u>ක්‍රියාත්මක කිරීම.</u>**<br><br>**<u>අපනයන ආදායම් ඉලක්ක ලඟාකර ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම</u>**<br><br>2016 වර්ෂයේ දී ඩොලර් බිලියන 0.5 ක්ව පැවති අපනයන ආදායම 2020 වර්ෂය වන විට ඩොලර් බිලියන 1ක් දක්වා වැඩි කර ගැනීම සඳහා සැලසුම් සකස් කර ඇති බව පූර්ව කාරක සභා රැස්වීමේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සඳහන් කර තිබුණද, එම ඉලක්කය සපුරා ගැනීමට අසමත් වී ඇති බව විගණකාධිපතිවරයා විසින් අනාවරණය කරන ලදී. නිවැරදි සැලැස්මක් නොමැතිවීම හා නිසි අධීක්ෂණයක් නොමැතිවීම මෙම තත්ත්වයට හේතු විය හැකි බව ද විගණකාධිපතිවයා පෙන්වා දුන්නේය. | සැලැස්මක් සකස් කොට ඇති බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි (ග.නි.) ප්‍රකාශ කළේය. එම සැලැස්මට අනුව එක් එක් වගාවන්ට යෝග්‍ය බිම් හඳුනා ගෙන ඒ අනුව වගා කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් ඔහු සඳහන් කළේය. ඊට අමතරව, වගා බිම් ප්‍රමාණය පුළුල් කිරීම සඳහා නව වගා බිම් හඳුනාගැනීම සහ නිෂ්පාදන සඳහා අගය එකතු කර (Value Add) ආනයනය කිරීම මගින් අපනයන ආදායම වර්ධනය කරගැනීමට අපේක්ෂා කරන බව ද ප්‍ර.ග.නි./ ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>විද්‍යානුකූල පදනමක් මත ගොවිජන සේවා කොට්ඨාශ මට්ටමින් වගා කටයුතු කිරීම සුදුසු බවට හඳුනා ගන්නා ලද භෝග වර්ග ප්‍රවර්ධනය සඳහා සහ ඉලක්කගත අපනයන ආදායම් සපුරා ගැනීම සඳහා සැලැස්මක් සකස් කොට 2024 ජූලි 31 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/01/40/2024 හා 2024.07.29 දිනැති ලිපිය මගින් අදාළ සැලැස්ම ඉදිරිපත් කර ඇත.** |
| 02 | **<u>වල්ලපට්ට ශාක අපනයනය කිරීම</u>**<br><br>වල්ලපට්ට ශාක අපනයනයෙන් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් | **<u>නිරීක්ෂණ</u>**<br><br>අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් දැනට අපනයන බෝග ලෙස |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | උපයා ගත හැකි බැවින්, නෛතික පදනමක් මත එම ශාක වගා ප්‍රවර්ධනය සඳහා අවධානය යොමු කරන ලෙස පූර්ව කාරක සභා රැස්වීමේදී උපදෙස් ලබා දී ඇත. එසේ වුවත්, වල්ලපට්ට ශාක වගා කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බව විගණකාධිපතිවරයා විසින් කාරක සභාවට පෙන්වා දෙන ලදී. | හඳුනාගෙන ඇති බෝග වර්ග 14 ට අමතරව විදේශීය වෙළෙඳපොළේ ඉල්ලුමක් ඇති නව වගාවන් වෙත යොමු විය යුතු බව කාරක සභාව විසින් මෙහිදී පෙන්වා දෙනු ලැබීය.<br><br>අදාළ පනතෙහි අපනයන බෝග නිර්වචනය කර ඇත්තේ "තේ, පොල්, රබර් හා කජු නොවන්නාවූ ද, වාර්ෂික නිෂ්පාදනයෙන් යටත් පිරිසෙයින් 50% ක් වත් අපනයනය කරන්නා වූ වාර්ෂික බෝගයන් ඇතුළත් වේ" යනුවෙන් බවත්, එම නිසා වාර්ෂික බෝග නොවන්නා වූ බෝග අපනයනය පිණිස වගා කිරීම සඳහා පනතෙහි ප්‍රතිපාදන නොමැති බවත් ප්‍ර.ග.නි/. ග.නි. විසින් පෙන්වා දෙන ලදී.<br><br><u>නිර්දේශ</u><br><br>වල්ලපට්ට ඇතුළු අපනයනය තුළින් විදේශ විනිමය ඉපයිය හැකි සියලුම බෝග, අපනයන කෘෂිකර්ම බෝග හෝ වැවිලි බෝග ලෙස නම් කිරීමට අදාළ නීති ප්‍රතිපාදන සකස් කිරීමට කටයුතු කර ඒ පිළිබඳ වාර්තාවක් 2024 ජූලි 31 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/01/40/2024 හා 2024.07.29 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**<br><br>**වල්ලපට්ට ශාකය නීත්‍යානුකූල කිරීමේ කටයුතු වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බවත්, අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය වූ පසු අදාළ භෝග නම්** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **කිරීමේදී වල්ලපට්ට ශාකය ඇතුළත් කළ හැකි බවත් අදාළ වර්තාවේ සඳහන් වේ.** |
| 03 | **<u>රජයට හා පෞද්ගලික අංශයට අයත් ඉඩම් කොටස් 29 ක් පවරා ගැනීමට කටයුතු නොකිරීම.</u>**<br>රජයට හා පෞද්ගලික අංශයට අයත් අක්කර 350 කට වැඩි විශාලත්වයක් සහිත ඉඩම් කොටස් 29 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ බව විගණනය විසින් පෙන්වා දෙනු ලැබීය. | රජයට හා පෞද්ගලික අංශයට අයත් ඉඩම් කොටස් 49 ක් පැවති බවත්, ඒ අතුරින් ඉඩම් කොටස් 31 ක් මේ වනවිට පවරා ගෙන ඇති බවත්, අදාළ ආයතන ඒකාබද්ධව ඉතිරි ඉඩම් කොටස් පවරා ගැනීමට හා අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පවතින බවත් ප්‍ර.ග.නි./ ග.නි. සඳහන් කර සිටියේය.<br>එම ඉඩම් පවරා ගැනීමේ කටයුතුවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br>**අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/01/40/2024 හා 2024.07.29 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.**<br>**ඉඩම් කැබලි පවරා ගැනීමට අදාළ කටයුතු එක් එක් අදියරේ පවතින අතර, එම පවරා ගැනීම් වල වර්තමාන තත්ත්වය එමගින් වාර්තා කර ඇත.** |
| 04 | **<u>ටැබ් පරිගණක 300 ක් මිළදී ගැනීම සහ පරිගණක මෘදුකාංගයක් සකස් කිරීම සඳහා විශාල වියදමක් දරා තිබුණ ද, එමගින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම.</u>**<br>ශ්‍රී ලංකාවේ ගම්මිරිස් හා කුරුඳු සඳහා භූගෝලීය දර්ශක (GI) | ගම්මිරිස් හා කුරුඳු සඳහා භූගෝලීය තත්ත්ව දර්ශක (GI) ලබාගැනීමට එම ගොවීන් ලියාපදිංචි කිරීම අත්‍යවශ්‍ය කරුණක් බැවින් ඒ සඳහා මෙම මෘදුකාංගය සකස් කළ බවත්, ගොවීන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා ටැබ් පරිගණක මිළදී ගැනීමට හා පරිගණක මෘදුකාංගය සංවර්ධනය කිරීමට රු. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | ලබාගැනීමට සහ ගොවීන්, සැපයුම්කරුවන් හා වෙළෙඳුන් ලියාපදිංචි කිරීම සඳහා පරිගණක මෘදුකාංගයක් සකස් කිරීමටත්, ටැබ් පරිගණක 300 ක් මිළදී ගැනීම සඳහාත් රු. එක් කෝටි විසිපන් ලක්ෂයකට (12,500,000) අධික වියදමක් දරා තිබුණ ද, එමගින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය. | මිලියන 12.5 කට අධික මුදලක් වැය කර ක්ෂේත්‍ර නිලධාරීන් වෙත ලබා දුන් බවත් ග.නි. සඳහන් කළේය. විශාල දත්ත ප්‍රමාණයක් ඇතුළත් කිරීමේදී දත්ත උඩුගතවීමේ ප්‍රමාදයක් පැවතීම නිසා අදාළ මෘදුකාංග සමාගම (Software Developer) ලවා අවස්ථා කීපයකදී පද්ධතිය අළුත්වැඩියා කරගත් නමුත් ඉන් අපේක්ෂිත ප්‍රතිඵලය නොලැබුණු බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.<br>**නිර්දේශ/ නියෝග**<br>නිසි සැලසුමකින් තොරව මෙවන් ව්‍යාපෘති ආරම්භ කිරීම නිසා විශාල මුදල් නාස්තියක් සිදුවී ඇති බව පෙන්වා දුන් කාරක සභාව, මෙම මෘදුකාංගය ඵලදායී ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් ගත හැකි පියවර පිළිබඳ වාර්තාවක් 2024 ජූලි 31 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br>**අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 08/01/40/2024 හා 2024.07.29 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.** |

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

***(2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)***

**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 18**

**කැඳවන ලද ආයතන -**

- කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 01 | <u>**විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම හා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**</u><br><br>විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම පිළිබඳව සාකච්ඡා කළ අතර, මෙම දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ සිට පිළිතුරු ලබා නොදුන් විගණන විමසුම් සංඛ්‍යාව 98 ක් බව අනාවරණය විය. | විගණන විමසුම් සඳහා නියමිත කාලය තුළ පිළිතුරු සැපයීම සෑම ආයතනයකම වගකීමක් බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.<br><br>2019 වර්ෂයේ සිට තම දෙපාර්තමේන්තුවට විගණන විමසුම් 407 ක් ලැබුණු බවත්, ඉන් වැඩි ප්‍රමාණයකට පිළිතුරු සපයා ඇති බවත් ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි (ග.නි.) සඳහන් කළේය.<br><br><u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u><br><br>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්වීම අමාත්‍යාංශයේ වගකීමක් බව අවධාරණය කළ කාරක සභාව, 2024 ජූලි මාසය ඇතුළත දිස්ත්‍රික් කාර්යාල 25 හි ම අදාළ නිලධාරීන් සම්බන්ධ කරගනිමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලෙසත්, මෙම වසරේ ඉතිරි කාර්තු 2 සඳහා ද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට දින නියම කර ගන්නා ලෙසත්, රේඛීය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් මෙම ක්‍රියාවලිය දිගටම පවත්වාගෙන යන ලෙසත් කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ අංක DAD/FIN/PRO/04/COPA-ii හා 2024.07.15 දිනැති ලිපිය මගින් 2024 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වූ සහ පැවැත්වීමට නියමිත දින ඇතුළත් වාර්තාව ඉදිරිපත් කර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | **<u>සේවක පුරප්පාඩු</u>**<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ සේවක පුරප්පාඩු රාශියක් පවතින බව කාරක සභාව හමුවේ අනාවරණය විය. | **<u>නිරීක්ෂණ</u>**<br>මෙම දෙපාර්තමේන්තුවේ පහල ස්ථරයේ සේවක පිරිසට සාපේක්ෂව ඉහළ තනතුරු වල අඩුවක් දක්නට ලැබෙන බවත් විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදුකර දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය නිවැරදි ආකාරයට සකස් කළ යුතු බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය. තවද, සංවර්ධන නිලධාරි වැනි තනතුරුවල සේවය කරනු ලබන ප්‍රාදේශීය නිලධාරීන්ට උසස්වීම් ලබා ගැනීමේ අවස්ථාව ඉතා අඩු බව ද විගණනය විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.<br>සේවක පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් කර ඇති ඉල්ලීම් සම්බන්ධයෙන් අදහස් දැක්වූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහන් කර සිටියේ මෙම වසරේ සිදු කිරීමට නියමිත සේවක සමාලෝචනයකින් අනතුරුව අවශ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳව ඉල්ලීම් ඉදිරිපත් කරන ලෙස ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇති බවයි. |
| 03 | **<u>වාර්ෂික කාර්ය සාධන වාර්තා සභාගත කිරීම</u>**<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීමේ විශාල ප්‍රමාදයක් පවතින බව කාරක සභාවේ දී අනාවරණය විය. 2019 වසරේ සිට වාර්ෂික කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර නොමැති බව විගණකාධිපතිවරයා විසින් සඳහන් කරන ලදී. | නිලධාරීන් ස්ථාන මාරු කිරීම වැනි හේතූන් මත කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව සඳහන් කළ ප්‍ර.ග.නි/ ග.නි, 2023 වර්ෂය දක්වා වූ සියලුම කාර්ය සාධන වාර්තා මේ වනවිට සකස් කර අවසන් බව ද සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 04 | <u>ගොවිජන සංවර්ධන සභා පිහිටුවීම</u><br><br>2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සම්මත වී වසර 24 ක කාලයක් ඉකුත් වී තිබුණ ද, එම පනත අනුව පිහිටුවිය යුතු ගොවිජන සංවර්ධන සභා පිහිටුවීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාවේ දැඩි අප්‍රසාදය පලවිය. | ගොවිජන සංවර්ධන සභා වලට අදාළ නියෝග සකස් කර නොතිබීම නිසා සභා පිහිටුවීම මෙතෙක් සිදු කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි/ග.නි., නියෝග සකස් කිරීමේ කටයුතු 2024 වසර තුළ අවසන් කිරීමට හැකි වනු ඇති බව ද සඳහන් කර සිටියේය.<br><br><u>නිර්දේශ</u><br><br>ගොවිජන සංවර්ධන සභා පිහිටුවීමට අදාළ නියෝග සෑදීම සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමා සමග සාකච්ඡා කර එම කටයුතු අවසන් කළ හැකි දින වකවානු ඇතුළත් වාර්තාවක් 2024 ජූලි 15 දින වනවිට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත කාරක සභාව නිර්දේශ කළේය.<br><br>මේ සම්බන්ධයෙන් ගොවි සංවිධාන හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන්ගේ සංගම් ඇතුළු අදාළ පාර්ශ්ව සමග ද සාකච්ඡා කරන ලෙස කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**2024.06.27 දින පැවති රැස්වීමකදී මීට අදාළ අවසන් කෙටුම්පත සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය හිමි වූ බවත්, කඩිනමින් අදාළ ගැසට් නිවේදනය නිකුත් කරන බවත් ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ අංක DAD/FIN/PRO/04/COPA-ii හා 2024.07.15 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.** |
| 05 | <u>ගොවිජන බැංකු වල දුර්වල ක්‍රියාකාරිත්වය</u> | <u>නිරීක්ෂණ</u><br><br>ගොවි ජන බැංකු 559 ක් ක්‍රියාත්මකව |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | පැවතිය ද, ණය ලබා දීම සිදු වන්නේ වී වගා කරන ගොවීන්ගෙන් 1% ක් වැනි සුළු පිරිසක් සඳහා පමණක් බව මෙහිදී අනාවරණය විය. මෙම බැංකු වල මූල්‍ය ප්‍රකාශන ආකෘති නිවැරදි නොවන බවත්, ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය නොකරන බවත් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙනු ලැබීය. |
| 06 | **<u>ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීමේදී මූල්‍ය අක්‍රමිකතා රැසක් සිදුවී තිබීම.</u>** | ඉටු නොකළ වැඩ සඳහා රු. ලක්ෂ 35 කට වැඩි ගෙවීම් සිදු කර තිබූ බව විගණනයේදී අනාවරණය වූ බවත්, මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොමැති බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.<br><br>මෙම සිදුවීම 2018, 2019 කාල වකවානුව තුළ සිදුවී තිබෙන බව සඳහන් කළ ප්‍ර.ග.නි./ග.නි., මේ වනවිට වගකිව යුතු නිලධාරීන්ට චෝදනා පත්‍ර භාරදී ඇති බවත්, ඒ අනුව, විනය පරීක්ෂණ සිදු කරනු ලබන බවත් සඳහන් කළේය. |
| 07 | **<u>වැව් ප්‍රතිසංස්කරණ කටයුතු වලදී සිදුවන පරිසර හානි</u>**<br><br>පරිසරයට හානි සිදුවන ආකාරයට වයඹ පළාතේ වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලබන බව කාරක සභාව හමුවේ අනාවරණය විය. | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සුළු වාරිමාර්ග 5000 ක් පමණ පිහිටා තිබෙන බවත්, එම වැව් හැරීමේ දී වගකිව යුතු කිසිවෙකුගේ අධීක්ෂණයක් නොමැතිවීම නිසා එය වැලි ගොඩ දැමීමේ ව්‍යාපාරයක් බවට පත්ව ඇති බවත් විගණකාධිපතිවරයා සඳහන් කළේය. වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර 237 කට ආසන්න සංඛ්‍යාවක් ලබා දී තිබෙන බවද මෙහිදී සඳහන් විය. එමෙන්ම ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන දෙපාර්ශ්වය විසින්ම වැව් ප්‍රතිසංස්කරණ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | කටයුතු සිදු කරනු ලබන බව ද මෙහිදී අනාවරණය විය.<br>මෙම වැව් ප්‍රතිසංස්කරණ කටයුතු වලදී සිදුවන පරිසර හානි අවම කරගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට සහ වැව් වල අයිතිය පිළිබඳව පවතින ව්‍යාකූල තත්ත්වය නිරවුල් කර ගැනීම සඳහා පළාත් සභා අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වයඹ පළාත් පරිසර අධිකාරිය යන ආයතන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මීලඟ රැස්වීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හමුවට කැඳවීමට කාරක සභාව නිර්දේශ කළේය. |
| 08 | **<u>අයථා ලෙස කුඹුරු ඉඩම් ගොඩකිරීම</u>** | **<u>නිරීක්ෂණ</u>**<br>කුඹුරු ඉඩම් ගොඩකිරීමෙන් අනතුරුව කුඹුරු නාම ලේඛනයෙන් ඉවත් කොට ගොඩ ඉඩම් වශයෙන් සහතික ලබා දී ඇති බව කාරක සභාව අනාවරණය කළේය. කුඹුරු ඉඩම් පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදුකර වගා කළ හැකි කුඹුරු ඉඩම් සහ වගා කළ නොහැකි කුඹුරු ඉඩම් වෙන්කොට හඳුනාගෙන, වගා කළ නොහැකි කුඹුරු ඉඩම් වෙනත් ඵලදායී කාර්යයන් සඳහා යොදා ගැනීමට අවසර ලබා දීම සුදුසු බව කාරක සභාව සඳහන් කළේය.<br>කාරක සභාව විසින් පෙන්වා දුන් ආකාරයේ කටයුතු පිළිබඳව පසුගිය කාලය තුළ තම දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබුණු බව සඳහන් කළ ප්‍ර.ග.නි/ග.නි, එවැනි කටයුතු වැළැක්වීම සඳහා මේ වනවිට වැඩ පිළිවෙළක් සකස් කර ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | බව සඳහන් කළේය. දිවයින පුරා පිහිටි සියලුම කුඹුරු ඉඩම් ඩිජිටල් ක්‍රමයට මැනීම් සිදු කර පරිගණකගත කිරීමට පියවර ගෙන ඇති බවත්, දැනට 95% ක් පමණ කුඹුරු ඉඩම් මැනුම් කටයුතු අවසන් කර ඇති බවත් ඔහු වැඩි දුරටත් සඳහන් කළේය.<br><br><u>නිර්දේශ</u><br><br>කුරුණෑගල, ගැටිටුවාන, රත්නපුර නාමල්දෙණිය හා ගම්පහ දිස්ත්‍රික්කයේ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අයථා ලෙස කුඹුරු ඉඩම් ගොඩකිරීම් සිදුවන බව පෙන්වා දුන් කාරක සභාව,<br><br>i. එම ගොඩකිරීම් නිර්දේශ කළ නිලධාරීන්, අනුමැතිය ලබා දුන් දිනයන් සහ ඒවායේ වර්තමාන තත්ත්වය ඇතුළත් සවිස්තර වාර්තාවක් 2024 ජූලි මස 15 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්,<br><br>ii. දිස්ත්‍රික්ක 25 තුළ පසුගිය වසර තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීම සඳහා අවසර ලබා දුන් ඉඩම් නාම ලේඛනය කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් නිර්දේශ කළේය.<br><br>**ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ අංක DAD/FIN/PRO/04/COPA-ii හා 2024.07.15 දිනැති ලිපිය මගින් මෙම කුඹුරු ඉඩම් ගොඩකිරීම නිර්දේශ කළ නිලධාරීන්ගේ නම්, අනුමැතිය ලබා දුන් දිනයන් හා ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 09 | **<u>වී මිළදී ගැනීම සම්බන්ධ ගැටළු</u>**<br><br>2021 යල කන්නයේ පුත්තලම හා පොලොන්නරුව දිස්ත්‍රික්කවල ගොවීන්ගේ වී මිළදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ලද මුදල් අදාළ කාර්යය සඳහා යොදවා නොමැති බව විගණනය විසින් පෙන්වා දෙන ලදී. විශේෂයෙන් පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මිළදී ගැනීම සඳහා ලබා දුන් රු. මිලියන 214 ක මුදලක් අදාළ කාර්යය සඳහා යොදවා නොමැති බවත්, එම මුදල් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ලබා දී නොමැති බවත් විගණනයේදී අනාවරණය වූ බව විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී. | මෙම කරුණ තම අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ නොවන බව සඳහන් කළ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි, මේ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්ගෙන් විමසීම සුදුසු බව දන්වා සිටියේය.<br><br>අදාළ වී මිළදී ගැනීම සමුපකාර හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා සිදුවිය හැකි බව සඳහන් කළ කාරක සභාව, මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් වාර්තාවක් කැඳවන ලෙස උපදෙස් ලබා දෙන ලදී. |
| 10 | **<u>වගා ළිං 400 ක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය</u>**<br><br>2019 වර්ෂයේ වගා ළිං 400 ක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගොවීන්ට ණය මුදලක් ලබා දී ඇති අතර, එම මුදල් ලබා ගත් ඇතැම් ගොවීන් විසින් වගා ළිං සකස් කර නොමැති බවත්, ණය මුදල් ආපසු ගෙවා නොමැති බවත් විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙන ලදී. | මෙම කාර්යය සඳහා ලබා දුන් රු. ලක්ෂ 2 ක ණය මුදලින් 75% ක අත්තිකාරම් මුදලක් (රු. 150,000/-) ළිඳ ඉදිකිරීමට පෙර ගොවීන්ට ලබා දුන් බවත්, ඉතිරි 25% ළිඳ ඉදි කිරීමෙන් පසුව ලබා දුන් බවත් ප්‍ර.ග.නි/ග.නි, ප්‍රකාශ කළේය. ඇතැම් ගොවීන් විසින් අත්තිකාරම් මුදල ලබා ගෙන ඇති නමුත් ළිං ඉදිකර නොමැති බවත් ඔහු සඳහන් කළේය.<br><br>**<u>නිර්දේශ</u>**<br><br>මෙම ව්‍යාපෘතිය යටතේ ණය ලබා දුන් ගොවීන්ගේ නාම ලේඛනය, නොගෙවා ඇති මුදල් ප්‍රමාණයන් හා එම ළිං ඉදිකිරීමේ ප්‍රගතිය පිළිබඳ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර ගේ නිර්දේශය සහිත වාර්තාවක් 2024 ජූලි 15 |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | දිනට පෙර කාරක සභාවට ලබා දෙන ලෙස නිර්දේශ කළේය.<br><br>**ගොවිජන කොමසාරිස් ජනරාල්ගේ අංක DAD/FIN/PRO/04/COPA-ii හා 2024.07.15 දිනැති ලිපිය මගින් ආධාර ලබා දුන් ගොවීන්ගේ නාම ලේඛනය, නොගෙවා ඇති මුදල් ප්‍රමාණයන් හා වගා ළිං ඉදිකිරීමේ ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| **කම්කරු දෙපාර්තමේන්තුව**<br><br>***(2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)***<br><br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 19** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය<br>❖ කම්කරු දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් පවතින ගැටලු</u>** | **<u>නිරීක්ෂණ</u>**<br><br>2016.04.07 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදි ලබාදී තිබුණු නිර්දේශය පරිදි සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමේ කටයුතු මෙතෙක් සිදුකර නොමැති බව බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වූ නඩුවක් අනුව සේවක අර්ථසාධක අරමුදල් පනතේ 38(2) වගන්තිය යටතේ සහතික පත්‍ර ක්‍රමයට නඩු පැවරිය නොහැකි බවට මතයක් පැවතීම හේතුවෙන් සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කළ යුතු බවට තීරණය කළද, පසුකාලීන ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ නඩු තීන්දුවලින් කම්කරු කොමසාරිස්හට සහතික ක්‍රමයට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නඩු පැවරීමේ හැකියාව පවතින බව තහවුරු කර ඇති බවත්, ඒ අනුව අදාළ ගැටලුව නිරාකරණය වී ඇති බැවින් සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින බවත් ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය. ඒ පිළිබඳව විගණකාධිපතිවරයා වෙත වාර්තා කර ඇති බවද ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය.<br><br>අර්ථසාධක අරමුදල් අය නොවන ආයතන නිශ්චිතව හඳුනාගැනීමේ ක්‍රමවේදය පිළිබඳව කාරක සභාව විමසූ අතර, සේවායෝජකයින් කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පසුව “සී” වාර්තා මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට අර්ථසාධක අරමුදල් යැවිය යුතු බවත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෑම මාස හයකට වරක් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන යාවත්කාලීන කරන ලද දත්ත පදනම් කර ගැනීමෙන් සහ කම්කරු නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් අර්ථසාධක අරමුදල් නොගෙවන ආයතන හඳුනාගන්නා බවත්, මෙම ආයතන පිළිබඳ තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ දත්ත පද්ධතිය හරහා පරීක්ෂා කළ හැකි බවත් ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය. පනහකට වැඩි සේවක සංඛ්‍යාවක් සිටින ආයතන දැනටමත් මාර්ගගත ක්‍රමයට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අර්ථසාධක අරමුදල් ගෙවීම සිදුකරනු ලබන බවත්, සේවක සංඛ්‍යාව පහළොවට වැඩි ආයතනවල ගෙවීම් මාර්ගගත ක්‍රමයට සිදු කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බවත් ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අතර සේවක අර්ථසාධක අරමුදල් පනතේ නව සංශෝධන අනුව ප්‍රාදේශීය කාර්යාල හරහා මාර්ගගත ක්‍රමයට සාමාජිකයින් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති බව ද දන්වා සිටියේය.<br>දත්ත පද්ධති සම්බන්ධ කාර්යයන් සඳහා 2021 වර්ෂයේදී රුපියල් මිලියන 241 ක්, 2022 වර්ෂයේදී රුපියල් මිලියන 75 ක් සහ 2023 වර්ෂයේදී රුපියල් මිලියන 240 ක් ප්‍රතිපාදන ලෙස ලබා දී ඇති නමුත් එම එක් එක් වර්ෂයේදී අදාළ ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රුපියල් මිලියන 37ක්, 35ක් හා 22ක් පමණක් වැය කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය.<br>ආරම්භයේදී කම්කරු දෙපාර්තමේන්තුව පමණක් ඩිජිටල්කරණය කිරීමට අපේක්ෂා කළ නමුත්, යෝජිත ජාතික ශ්‍රම වෙළඳපොල තොරතුරු පද්ධතිය (National Labour Market Information System) හරහා කම්කරු දෙපාර්තමේන්තුව පාදක වන සියලු කටයුතු ඩිජිටල්කරණය කිරීමට නියමිත බව ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකා මහ බැංකුව හා කම්කරු දෙපාර්තමේන්තුව එක් දත්ත පද්ධතියක් හරහා සම්බන්ධ වීම වඩාත් සුදුසු බව මෙහිදී සාකච්ඡාවට ලක් වූ අතර ඒ සඳහා ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට යෝජනා ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි වෙත උපදෙස් දුන්නේය. එසේම, මෙ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ සියලු නිලධාරීන් එක්ව සාකච්ඡාවක් පවත්වන ලෙස ද කාරක සභාව නිර්දේශ කළේය.<br>සේවා නියුක්තිකයන්ගේ හිමිකම් ප්‍රතිලාභ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | නොලැබීම් සම්බන්ධව 2023 දෙසැම්බර් 31 දිනට අක්‍රිය තත්ත්වයේ නඩු 5,923ක් පැවතියද එම නඩු සක්‍රිය තත්ත්වයට ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම ද කාරක සභාවේ අවධානයට ලක්විය. <br><br> ඉහත නඩු අක්‍රිය හා විවෘත වරෙන්තු තත්ත්වයට පත් වී ඇත්තේ ආයතනවල අධ්‍යක්ෂකවරුන් විදේශගත වීම, පරීක්ෂණ සිදු කරන දින වන විට ආයතන වසා දමා තිබීම හෝ ලිපිනය වෙනස් කිරීම හේතුවෙන් බව පෙන්වා දුන් ප්‍ර.ග.නි./ ග.නි., ග්‍රාම නිලධාරීවරුන්, මැතිවරණ කොමිෂන් සභාව හා ආගමන විගමන දෙපාර්තමේන්තුව හරහා සේවායෝජකයින්ගේ වර්තමාන ස්ථිර පදිංචි ලිපිනයන් පරීක්ෂා කරගැනීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කර ඇති බව ප්‍රකාශ කළේය. <br><br> ප්‍රතිලාභ ලබාගැනීමේ අයදුම්පත්වල සාමාජිකයාගේ තොරතුරුවල අඩුපාඩු පැවතීම මත ප්‍රතිලාභීන්ගේ අරමුදල් ලබාගැනීම ප්‍රමාද වීම මඟහරවා ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ද කාරක සභාව පෙන්වා දුන්නේය. ආයතන විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් ලියාපදිංචි කිරීමේදී සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දායක මුදල් ගෙවීමේදී ලබා දී ඇති තොරතුරුවල පරස්පරතා පැවතීම මෙම ගැටලුවට හේතු වන බවත්, ඒ සඳහා විසඳුමක් ලෙස දැනට ලබා දී ඇති තොරතුරු මාර්ගගතව පරීක්ෂා කර නිවැරදි කර ගැනීම සඳහා e-සේවාවක් කම්කරු දෙපාර්තමේන්තුවේ නව වෙබ් අඩවිය යටතේ ආරම්භ කර ඇති බවත්, ඒ පිළිබඳ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කඩිනමින් ජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන බවත් ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය.<br>**<u>නිර්දේශ</u>**<br>සියලු දිස්ත්‍රික්කවලට අදාළව ඒ ඒ වර්ෂය අනුව දිස්ත්‍රික් මට්ටමින් මේ දක්වා සේවක අර්ථසාධක අරමුදල් ගෙවනු ලබන ආයතන සංඛ්‍යාව, ගැටළුවකින් තොරව අදාළ ගෙවීම් සිදුකරනු ලබන ආයතන කවරේද යන්න හා සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් සිදුකිරීම පිළිබඳ ගැටළු පවතින ආයතන මොනවාද යන්නත්, ඉන් බලපෑමට ලක්වන සේවකයින් සංඛ්‍යාව සහ ගෙවිය යුතුව පවතින හිඟ මුදල් අදාළ වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන තොරතුරු ඇතුළත් වාර්තාවක් 2024.07.19 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නිර්දේශ කළ කාරක සභාව, මෙම කාර්යය සම්බන්ධයෙන් දිස්ත්‍රික් නිලධාරීන් වගකීම දැරිය යුතු බව ද අවධාරණය කළේය.<br>**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ML/AC/01/37/02-2024 හා 2024.07.17 දිනැති ලිපියෙන් දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් අදාළ තොරතුරු වාර්තා කර ඇත.** |
| 02 | **<u>2002 වසරේදී පැහැර ගැනීමකින් නැති වූ වාහනය සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීම.</u>** | ඉහත වාහනයේ ලියාපදිංචිය අවලංගු කරන ලෙස දැනුම් දී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළ අතර, ඒ සම්බන්ධ විස්තර විගණන අංශය වෙත ලබාදීමට කටයුතු කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. වෙත උපදෙස් දුන්නේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 03 | **<u>කාන්තා හා ළමා අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය</u>** | ළමා ශ්‍රමිකයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට ජාතික ළමාරක්ෂක අධිකාරියට හැකියාවක් නොමැති බැවින් ළමුන් සේවයේ යෙදවීම පිළිබඳව ජාතික ළමාරක්ෂක අධිකාරිය වෙත යොමු කෙරෙන පැමිණිලි කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි කළමනාකරණ පද්ධතිය වෙත සෘජුවම යොමු කිරීම සඳහා ඉඩ සලසා ඇති බව ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය. |
| 04 | **<u>2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/90 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ කාර්යයේ දුර්වලතා පැවතීම.</u>**<br>2023 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි කර්මාන්තශාලා 32,948 ක් අතරින් කර්මාන්තශාලා 28,555 ක් 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/90 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව ලියාපදිංචි කර නොතිබීම සම්බන්ධව කාරක සභාව අවධානය යොමු කළ අතර සේවක ආරක්ෂාවට අවදානමක් නොපවතින බවට සහතික වීම සඳහා මෙම කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේ වැදගත්කම ද කාරක සභාව පෙන්වා දුන්නේය. | කර්මාන්තශාලා ආඥා පනත යටතේ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම අවශ්‍ය නොවුණු බව පෙන්වා දුන් ප්‍ර.ග.නි./ ග.නි., 1950 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වරින් වර ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර කර්මාන්තශාලා 32,948 ක් ලේඛනගත කර ඇති බවත්, ඒ අතරින් දැනට ක්‍රියාත්මකව පවතින ආයතන ලියාපදිංචි කිරීම සඳහා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂණ ඉංජිනේරු කාර්යාල සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල හරහා කටයුතු කරමින් පවතින බවත්, අදාළ ආයතන වෙත අවශ්‍ය සිහිකැඳවීම් හා දැනුවත් කිරීම් සිදු කරන බවත් ප්‍රකාශ කළේය. නව නීති යටතේ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමේදී ගොඩනැගිලි පිඹුරුපත් කම්කරු දෙපාර්තමේන්තුව හරහා අනුමත කරගැනීම අනිවාර්ය බව ද ප්‍ර.ග.නි./ ග.නි ප්‍රකාශ කළේය. 2019 වර්ෂයේ සිට රටේ පැවති වාතාවරණය මත මෙම ලියාපදිංචි කිරීම් කටයුතුවල ප්‍රමාදයන් සිදු වූ නමුත් මේ වන විට එම කාර්යය ඉටු කිරීම සඳහා පියවර ගෙන ඇති බව ප්‍ර.ග.නි. / ග.නි තවදුරටත් සඳහන් කළ අතර, සියලුම කර්මාන්තශාලා පරීක්ෂා කර අවසන් කිරීම |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | සඳහා වසර තුනක පමණ කාලයක් ගතවන බවද හෙතෙම ප්‍රකාශ කළේය.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>සියලු කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ දැනට සිටින නිලධාරීන් ප්‍රමාණවත් නොවන බව පෙන්වා දුන් කාරක සභාව, සියලු කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම සඳහා සංවර්ධන නිලධාරීන් හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් හෝ යෙදවීමට කටයුතු කරන ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් දුන්නේය. ඒ අනුව අවශ්‍යතාවය පරිදි මෙම කාර්යය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සිටින සංවර්ධන නිලධාරීන් යම් දීමනාවක් ගෙවීම යටතේ අනුයුක්ත කරගැනීමට කටයුතු කිරීම සුදුසු බව ද කාරක සභාව පෙන්වා දුන්නේය.<br>මෙම තොරතුරු ලබාගැනීම සඳහා ආකෘතියක් (format) සහ සියලු කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර 2024.07.19 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, මෙම කාර්යය සඳහා සියලු දිස්ත්‍රික් කම්කරු කොමසාරිස්වරුන් සම්බන්ධ කරගන්නා ලෙසත් කාරක සභාව නිර්දේශ කළේය. එසේම ආයතන වෙත වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමේදී මෙම ලියාපදිංචිය අනිවාර්ය කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කටයුතු කරන ලෙසද කාරක සභාව නිර්දේශ කළේය.<br>**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ML/AC/01/37/02-2024 හා 2024.07.17 දිනැති ලිපියෙන් කර්මාන්තශාලා ලියාපදිංචිය වැඩි කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොදවා ගැනීම පිළිබඳ සැලසුම්ගත යාන්ත්‍රණය අදාළ ආකෘති සමග වාර්තා කර ඇති අතර, කර්මාන්තශාලා සාමාන්‍ය ක්‍රමවේදයට ලියාපදිංචි කිරීමට අමතරව ජංගම ලියාපදිංචි කිරීමේ වැඩසටහන් ද ආරම්භ කිරීම සහ අක්‍රිය කර්මාන්තශාලාවලට අදාළ ගොනු වසා දැමීම එම යාන්ත්‍රණයේ ප්‍රධාන පියවර වේ.**<br>**ඉහත ලිපියෙන්, කර්මාන්තශාලා පවත්වාගෙන යෑම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී කර්මාන්තශාලා ආඥා පනත යටතේ ලියාපදිංචි කර තිබීම අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත් කර ගැනීම සඳහා එම බලපත්‍ර නිකුත් කරන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන අයත් අමාත්‍යාංශවල එකඟතාවය මත ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු ආරම්භ කර ඇති බව ද දන්වා ඇත.** |
| 05 | **<u>2021 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඡේද අංක 1.6.1 (ආ)(i)</u>**<br>හිඟ අර්ථසාධක අරමුදල්, සේවක වන්දි හා පාරිතෝෂිකවලට අදාළව උසාවි නියෝග මත 2023 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු රුපියල් මිලියන 352 ක පමණ මුදලක් අදාළ ප්‍රතිලාභීන්ට | උසාවි නියෝග මත වාරික සම්පූර්ණයෙන් ගෙවා අවසන්ව නොමැති රුපියල් මිලියන 62 ක් හැර ඉතිරි මුදල් මේ වන විට නිරවුල් කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. සේවක අර්ථසාධක අරමුදල් ලැබෙන වාරික ප්‍රමාණය අනුව සමානුපාතිකව සාමාජිකයන් වෙත ලැබෙන සේ ගිණුම්ගත කිරිමට කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | ගෙවීමට කටයුතු කර නොතිබීම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළේය. | කර ඇති බව ද ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |
| 06 | **<u>ආයෝජන ප්‍රවර්ධන කලාපවල පිහිටුවා ඇති කාන්තා නේවාසිකාගාර සම්බන්ධයෙන් පවතින ගැටලු</u>**<br>ආයෝජන ප්‍රවර්ධන කලාපවල පිහිටුවා ඇති කාන්තා නේවාසිකාගාර අතරින් බියගම කාන්තා නේවාසිකාගාරය 2018 ජුනි 15 දින සිට වසා දමා තිබීම සහ කොග්ගල හා කටුනායක කාන්තා නේවාසිකාගාරවල වැසිකිලි පද්ධතියේ අලුත්වැඩියාවන් සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබීම පිළිබඳ වර්තමාන තත්ත්වය කාරක සභාව විමසීය. | නේවාසිකාගාර පවත්වාගෙන යාම කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයට අයත් නොවන බව පෙන්වා දුන් ප්‍ර.ග.නි./ ග.නි., බියගම කාන්තා නේවාසිකාගාරය පිහිටි ගොඩනැගිල්ල අන්තරාදායක බවට ඉංජිනේරු අංශයෙන් වාර්තා කළ බැවින් 2018 වර්ෂයේදී එය වසා දැමූ බව ප්‍රකාශ කළේය.<br>මෙම ගොඩනැගිලි ඒවා පිහිටි ඉඩම් අයත් වන ආයතන වෙත පැවරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරක සභාව උපදෙස් දුන්නේය. |
| 07 | **<u>පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් වර්තමාන තොරතුරු</u>** | 1996.02.02 දින සිට පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් ලියාපදිංචි කිරීම සිදු නොකරන බවත්, 1976 වර්ෂයට පෙර ලියාපදිංචි කරන ලද පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් 117 ක් දැනට ක්‍රියාත්මක වන බවත්, පවතින නීතිය යටතේ එම අරමුදල් සඳහා තවදුරටත් සේවකයින් බඳවා ගැනීමේ බාධාවක් නොමැති බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. සේවක අර්ථසාධක අරමුදල් පනතේ, අනුමත අර්ථසාධක අරමුදල් සම්බන්ධයෙන් වන 27 වන වගන්තිය යටතේ මෙම අරමුදල් පිහිටුවා ඇති බව ප්‍ර.ග.නි. කාරක සභාවට පෙන්වා දුන්නේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>සේවකයින්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල්වල පාලක මණ්ඩල මගින් එම අරමුදල් ආයෝජනය කිරීම් හා වරප්‍රසාද ලබාදීම් කටයුතු නියාමනය කිරීමේ වැදගත්කම කාරක සභාව මෙහිදී අවධාරණය කළේය.<br><br>පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යනු ලබන ආයතන කවරේද යන්නත්, එම අරමුදල්වල වර්තමාන තත්ත්වය හා එක් එක් අරමුදලේ පාලනාධිකාරිය කවුරුන්ද යන්නත්, අරමුදල මගින් සපයනු ලබන සේවාවන් සහ ගෙවනු ලබන පොලී අනුපාත යන තොරතුරු ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් 2024.07.19 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, අවශ්‍ය වන්නේ නම් එම අරමුදල් නියාමනය සම්බන්ධයෙන් නව රෙගුලාසි සකස් කිරීමට කටයුතු කරන ලෙසත් කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි වෙත නිර්දේශ කළේය.<br><br>**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ML/AC/01/37/02-2024 හා 2024.07.17 දිනැති ලිපියෙන් මේ වන විට පරීක්ෂා කර ඇති අරමුදල් 107 ක වත්මන් තත්ත්වය වාර්තා කර ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| **ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** <br> ***(2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)*** <br> **විමර්ශනය කරන ලද දිනය - 2024 ජුනි 20** | | |
| **කැඳවන ලද ආයතන -** <br> ❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය <br> ❖ ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | |
| 01 | **<u>විගණන කළමනාකරණ කමිටු සහ අනෙකුත් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කමිටු පැවැත්වීම.</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** <br> රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්යසාධනය පිළිබඳව මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීමේදී ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පෙර වර්ෂවලදී ඉහළ කාර්යසාධනයක් දැක්වූවද මෑත කාලීනව එමගින් ලබාගත් ලකුණු සංඛ්‍යාවේ සාපේක්ෂව අඩුවීමක් දක්නට ලැබෙන බවත් විගණන හා කළමනාකරණ කමිටු විධිමත් පරිදි කැඳවා නොතිබීම මේ සඳහා බලපෑ කාරණයක් බවත් නිරීක්ෂණය කළ කාරක සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්වීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මැදිහත් විය යුතු බව ප්‍රකාශ කළේය. <br> අනෙකුත් දිස්ත්‍රික් කමිටු රැස්වීම් පැවැත්වීමේ ද අඩුපාඩු පවතින බවද පෙන්වා දුන් කාරක සභාව, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පවත්වනු ලබන කමිටු වර්ග, එක් එක් කමිටුව පැවැත්වීමේ අවම අවශ්‍යතාවය, එම එක් එක් කමිටුව අදාළ වන අමාත්‍යාංශය සම්බන්ධීකරණය කරනු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ලබන්නේ කවුරුන්ද යන්න, කමිටු පැවැත්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ කාලීන අවශ්‍යතාවයන් අනුව යාවත්කාලීන කළ යුතු වේ නම් ඒ පිළිබඳ තොරතුරු යන කරුණු ඇතුළත් වාර්තාවක් 2024.07.20 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.)/ගණන් දීමේ නිලධාරී (ග.නි.) වෙත නිර්දේශ කළේය. <br> **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/F/MA/02/PAC-GAM හා 2024.07.19 දිනැති ලිපියෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු පිළිබඳව ඉහත වාර්තාව යොමු කර ඇත.** |
| 02 | **<u>සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දැක්ම, මෙහෙවර හා කාර්යභාරය ඵලදායී ලෙස සකස් කිරීම.</u>** | **<u>නිරීක්ෂණ</u>** <br> මීට පෙර අවස්ථාවලදී මුදල් අමාත්‍යාංශය සමග පැවති සාකච්ඡාවලදී ද මේ පිළිබඳව අවධානය යොමු කළ බව ප්‍රකාශ කළ කාරක සභාව, එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා ගැළපෙන පරිදි දැක්ම, මෙහෙවර හා කාර්යභාරය ඵලදායී ලෙස සකස් කිරීමට මාර්ගෝපදේශයක් ලබා දීම සුදුසු බව පෙන්වා දුන්නේය. |
| 03 | **<u>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගැටලු පැවතීම</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** <br> දිස්ත්‍රික්ක තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අධික කාලයක් ගත වන බව හා ඒ හේතුවෙන් මෙම ව්‍යාපෘති සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුව ඇති බව කාරක සභාව පෙන්වා දුන්නේය. අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කරවා ගත් පසු ආයතන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | මගින් නියමිත කාලසීමාව තුළ අදාළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් නොකරන බවත්, ප්‍රජා සමිති වෙත ව්‍යාපෘති ලබාදීමේ ක්‍රියාවලියේ අඩුපාඩු පවතින බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සම්බන්ධීකරණයෙන් ප්‍රජා සමිතිවලට ව්‍යාපෘති ලබාදීම සහ අර්ධ වශයෙන් නිම වී ඇති ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන මුදල් යෙදවීම සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳව වාර්තාවක් සකස් කර 2024.07.20 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව නිර්දේශ කළ අතර, මෙම වාර්තාව සකස් කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල මහජන නියෝජිතයින්ගෙන්ද අදහස් ලබාගැනීම සුදුසු බව ද නිර්දේශ කළේය.<br><br>**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/IA/නිම නොකළ ඉදිකිරීම්/2024 හා 2024.07.23 දිනැති ලිපියෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හා ඒ යටතේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළව සිදුකරමින් පැවති, එහෙත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මේ දක්වා නිම නොකළ ඉදිකිරීම් සම්බන්ධව තොරතුරු වාර්තාවක් යොමු කර ඇත.**<br><br>අර්ධ වශයෙන් නිම වී ඇති ව්‍යාපෘති සම්බන්ධයෙන් එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් වාර්තාවක් ලබාගෙන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ඉදිරි වර්ෂවලදී ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතු බවත්, ඒ අනුව එක් එක් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය,ඒ සඳහා දැනට වැය කර ඇති මුදල් ප්‍රමාණය, එහි වර්තමාන තත්ත්වය, ව්‍යාපෘතිය ඉදිරියටත් පවත්වාගෙන යාම ප්‍රායෝගික වන්නේද යන තොරතුරු ඇතුළත් වාර්තාවක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ද පිටපතක් සහිතව ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව නිර්දේශ කළේය.<br>**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/F/MA/02/PAC-GAM හා 2024.07.19 දිනැති ලිපියෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ අර්ධ වශයෙන් නිම වී ඇති ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සකස් කර වාර්තාවක් යොමු කර ඇත.** |
| 04 | **<u>විශ්‍රාම වැටුප් ගෙවීමේදී සිදුවන අක්‍රමිකතා හා ගැටලු</u>** | **<u>නිරීක්ෂණ</u>**<br>රාජ්‍ය නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හා වංචාවන් හේතුවෙන් විශ්‍රාම වැටුප් සම්බන්ධව අක්‍රමිකතා සිදු වන බවත්, ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීමේදී අක්‍රමිකතා වැඩි වශයෙන් වාර්තා වන බවත් කාරක සභාව නිරීක්ෂණය කළ අතර මෙවැනි තත්ත්වයන් මගහරවා ගැනීමට ප්‍රමාණවත් පියවර මෙතෙක් ගෙන නොමැති බවද අනාවරණය කරගන්නා ලදී. විදේශගත වන විශ්‍රාමිකයින්ට සහ අනෙකුත් විශ්‍රාමිකයින්ට තම තොරතුරු විශ්‍රාම වැටුප් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා යාවත්කාලීන කිරීමට ඉඩ සලසා දෙන ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් දුන් කාරක සභාව, විශ්‍රාමිකයින්ගේ අඩුපාඩු හෝ පරිපාලනමය කරුණු මත විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී ප්‍රායෝගිකව මතු වන ගැටලු කඩිනමින් විසඳා ගැනීම සඳහා විශ්‍රාමිකයන්ගේ තොරතුරු ගෙන්වා ගැනීමට ආකෘතියක් සකස් කිරීම සුදුසු බව ද යෝජනා කළේය. මේ සඳහා ඩිජිටල්කරණය සමග ජාතික වැඩපිළිවෙලකට යොමු වීමේ වැදගත්කමද කාරක සභාව අවධාරණය කළේය. |
| 05 | **<u>2014 වර්ෂයේදී මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේප්පුවේ පැවති රුපියල් 1,082,245 ක මුදල් අතුරුදහන් වීමේ සිදුවීම</u>**<br><br>මෙම සිදුවීම සම්බන්ධයෙන් පැවති පරීක්ෂණයේ වාර්තාව අනුව ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී, මුදල් සහකාර සහ සරප් යන නිලධාරීන් හතරදෙනාගෙන් එම මුදල මෙතෙක් සම්පූර්ණයෙන් අයකරගෙන නොමැති බව කාරක සභාවේදී අනාවරණය විය. | **<u>නිර්දේශ</u>**<br><br>මෙම සිදුවීමට අදාළව අතුරුදහන් වූ මුදල අයකර ගත යුතු බවට නිර්දේශ කර ඇති බව දිස්ත්‍රික් ලේකම් ප්‍රකාශ කළ අතර ප්‍රාදේශීය ලේකම්, ගණකාධිකාරී, මුදල් සහකාර සහ සරප් යන නිලධාරීන් 4 දෙනාගෙන් අයවිය යුතු අලාභය අයකර ගැනීම සඳහා ඔවුන් දැනට සේවය කරනු ලබන ආයතනවලට නැවත සිහිකැඳවීම් යවන ලෙසත්, ඒ සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාරය පිළිබඳව කාරක සභාවට වාර්තා කරන ලෙසත් කාරක සභාව නිර්දේශ කළේය.<br><br>**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/F/MA/02/PAC-GAM හා 2024.07.19 දිනැති ලිපියෙන් ඒ දක්වා නැවත අය කර ගන්නා ලද මුදල් ප්‍රමාණයන් වාර්තා කර ඇති අතර, 2024.07.09 දිනැතිව නැවත වරක් සිහිකැඳවීම් ලිපි යොමුකරන ලද බව දන්වා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 06 | **<u>2011 පෙබරවාරි 10 සිට 2013 ජූලි දක්වා කාලය තුළ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ කළමනාකරණ සහකාරවරියක් විසින් රුපියල් 1,400,429 ක මහජනාධාර මුදල් වංචා කර තිබීමේ සිදුවීම</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** <br> අදාළ නිලධාරිනියට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත්, අදාළ මුදල මෙතෙක් සම්පූර්ණයෙන් ආපසු අයකර ගෙන නොමැති බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය. එසේම මෙසේ වංචා කරන ලද මුදල එක් වර අයකර නොගෙන වාරික වශයෙන් අය කළ යුතු බවට තීරණය කර තිබීම ද සුදුසු නොවන බව කාරක සභාවේ අදහස විය. <br> රාජ්‍ය නිලධාරීන්ගේ නොසැලකිලිමත්භාවය හා වංචා දූෂණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් දඬුවම් ලබාදෙන පරිදි විනය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය කළ කාරක සභාව එමගින් වැරදි පූර්වාදර්ශයක් ලබාදෙන බව පෙන්වා දුන්නේය. <br> මහජන මුදල් වංචා කිරීම්වලට වගකිව යුතු වන රාජ්‍ය නිලධාරීන්ගෙන් එම මුදල් ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් පවතින වර්තමාන තත්ත්වය අධ්‍යයනය කර එවැනි මුදල් වංචා සම්බන්ධයෙන් වාරික අයකිරීමෙන් තොරව මුදල් කඩිනමින් නැවත අයකර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කර 2024.07.20 දිනට පෙර කාරක සභාවට වාර්තා කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කළේය. <br> **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/F/MA/02/PAC-GAM හා 2024.07.19 දිනැති ලිපියෙන්** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **අදාළ අලාභයට වගකිව යුතු නිලධාරිනියගෙන් රජයට අයවිය යුතු අලාභය ඇයගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් හා ගෙවිය යුතු හිඟ මුදල විශ්‍රාම වැටුපෙන් අයකිරීමෙන් අනතුරුව රජයට තවදුරටත් අයවිය යුතු ශේෂයක් පවතී නම් එම මුදල අදාල නිලධාරිනියගෙන් සම්පූර්ණයෙන් එකවර අයකර ගැනිමට කටයුතු කරන ලෙස ජා-ඇල ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බව වාර්තා කර ඇත.** |
| 07 | **<u>රජය සතු වාහන සහ ගොඩනැගිලි රැසක් නිෂ්කාර්යව පැවතීම.</u>** | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>ආයතනවල අවශ්‍යතාවයන් සඳහා නොගැළපෙන වාහන රාශියක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාවිතයට නොගෙන නිෂ්කාර්යව පවතින බවත්, රජයට අයත් ගොඩනැගිලි හා ඉඩම් රාශියක් ද මෙසේ භාවිතයට නොගෙන පවතින බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.<br><br>දිවයින පුරා නිෂ්කාර්යව පවතින රජයට අයත් වාහන හා ගොඩනැගිලි පිළිබඳව තොරතුරු වාර්තා සකස් කර ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. එලෙස නිෂ්කාර්යව පවතින වාහන සහ ගොඩනැගිලි පිළිබඳව සකස් කර ඇති වාර්තා කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි./ ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**ඉහත වාර්තා මෙතෙක් ඉදිරිපත් කර නොමැත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 08 | **<u>අනතුරට ලක් වූ අංක PF 9743 දරන මිට්සුබිෂි කැබ් රථය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම.</u>** | මෙම රථය අලුත්වැඩියාවට යොමු කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළ අතර අදාළ රක්ෂණ ආයතනය විසින් මේ සඳහා ගෙවනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධව ගැටලු පවතින බවද සඳහන් කළේය. <br> මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ හා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සම්බන්ධ වී සමස්ත වශයෙන් රජයේ වාහන සඳහා රක්ෂණාවරණ වන්දි මුදල් ගෙවීම පිළිබඳ පැහැදිලි ක්‍රමවේදයක් සකස් කරන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි. ට උපදෙස් දුන්නේය. |
| 09 | **<u>ලියා තබා ගෙන තිබුණු චෙක්පත්වල වලංගු කාල සීමාව ඉක්මවා යන තෙක් එම චෙක්පත් නිකුත් නොකර තිබූ අවස්ථා පැවතීම</u>** | **<u>නිරීක්ෂණ</u>** <br> නියමිත දිනට භාණ්ඩ නොලැබීම හෝ කාර්යයන් අවසන් නොකිරීම හේතුවෙන් ලියා තබා ගෙන තිබුණු චෙක්පත්වල වලංගු කාල සීමාව ඉක්මවා යන තෙක් එම චෙක්පත් නිකුත් නොකර තිබූ අවස්ථා පවතින බව නිරීක්ෂණය කළ කාරක සභාව වර්ෂ අවසානයේ චෙක්පත් ලියා තබා ගැනීම මූල්‍ය විනයට පටහැනි බවත්, මෙවැනි ප්‍රමාදයන් අවම කරගැනීමට කටයුතු කළ යුතු බවත් අවධාරණය කළේය. |
| 10 | **<u>ග්‍රාමීය ජල ව්‍යාපෘති අක්‍රිය තත්ත්වයට පත් වීම</u>** | මේ සම්බන්ධව පවතින ගැටලු විසඳා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතු බව කාරක සභාව මෙහිදී පෙන්වා දුන්නේය. එසේම, ප්‍රජා සහභාගීත්ව ප්‍රවේශය අනුගමනය කරමින් ක්‍රියාත්මක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | කළ හැකි සංවර්ධන ව්‍යාපෘති තෝරාගැනීමේදී බල ප්‍රදේශය තුළ ප්‍රමුඛතාවය ලබා දිය යුතු ක්ෂේත්‍ර සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතු බව ද කාරක සභාව අවධාරණය කළේය. |
| 11 | **<u>වසා දමනු ලබන පාසල් ඵලදායී ලෙස භාවිතයට නොගැනීම.</u>** | **<u>නිර්දේශ</u>** <br> ගම්පහ දිස්ත්‍රික්කය තුළ පවතින වසා දමන ලද පළාත් සභා පාසල් ලේඛනය සහ වසා දමන ලද පාසල් ඵලදායී ලෙස භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ වාර්තාවක් සකස් කර 2024.07.20 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව නිර්දේශ කළේය. <br> **රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HA/F/MA/02/PAC-GAM හා 2024.07.19 දිනැති ලිපියෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ තුළ පවතින වසා දමන ලද පාසල් ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් යොමු කර ඇත.** |
| 12 | **<u>ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කාර්යාල සියල්ල ආවරණය වන පරිදි පරීක්ෂාවන් සිදු කර නොතිබීම සහ නිලධාරීන්ගේ ස්ථාන මාරු නියමිත පරිදි සිදු කර නොතිබීම.</u>** | 2022 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කාර්යාල සියල්ල ආවරණය වන පරිදි පරීක්ෂාවන් සිදු කර නොතිබුණු බව කාරක සභාවේදී අනාවරණය වූ අතර, මේ වන විට අනිවාර්යයෙන් මාස තුනකට වරක් වත් සියලු කාර්යාල පරීක්ෂා කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් ලබා දී ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. <br> ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 තුළ වසර |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | 05 කට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සේවයේ නිරත නිලධාරීන් විශාල සංඛ්‍යාවක් ස්ථාන මාරු කර නොතිබීම කෙරෙහිද අවධානය යොමු කළ කාරක සභාව ඉදිරියේදී එවැනි නිලධාරීන් ස්ථාන මාරු කිරීම සඳහා පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි./ ග.නි. වෙත උපදෙස් දුන්නේය. |
| 13 | **<u>ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන යටතේ 2017 වර්ෂයේදී පිහිටුවන ලද සමිති</u>** | මෙම සමිති අතරින් අක්‍රියව පවතින සමිතිවල ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත දැනුම් දී ඇති බවත්, එම සමිතිවල ගිණුම්වල පවතින මුදල් සක්‍රිය සමිති වෙත හෝ රජයට ලබාගැනීමට අපේක්ෂා කරන බවත් ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |
| 14 | **<u>ගම්පහ දිස්ත්‍රික්කය තුළ ගංවතුර ආපදාවන් වළක්වා ගැනීම</u>** | ගම්පහ දිස්ත්‍රික්කය තුළ ගංවතුර ආපදාවන් වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු බව කාරක සභාව අවධාරණය කළ අතර, මීට සති දෙකකට පමණ පෙර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ පළාත් පාලන ආයතන ඒකාබද්ධව පිහිටුවන ලද කමිටුවක් මගින් ගංවතුර අවම කිරීම සඳහා සැලැස්මක් සකස් කර ඇති බව ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |

<table>
<tr><th></th><th>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</th><th>ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</th></tr>
<tr><td colspan="3">බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන<br><br>(2024.06.06 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම)<br><br>විමර්ශනය කරන ලද දිනය - 2024 ජූලි 10</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>❖ බස්නාහිර පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලය<br>❖ පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.)<br>❖ පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)<br>❖ මීගමුව මහා නගර සභාව<br>❖ කළුතර මහා නගර සභාව<br>❖ කඩුවෙල මහා නගර සභාව<br>❖ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව<br>❖ පැලියගොඩ නගර සභාව<br>❖ මහරගම නගර සභාව<br>❖ මහර ප්‍රාදේශීය සභාව<br>❖ කළුතර ප්‍රාදේශීය සභාව<br>❖ බේරුවල ප්‍රාදේශීය සභාව<br>❖ ආර්ථික සංවර්ධන කාර්යාංශය<br>❖ නාගරික සංවර්ධන අධිකාරිය</td></tr>
<tr><td>01</td><td><u>2024.06.06. දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u><br><br><u>නියෝග අංක 1</u>.<br><br>පසුගිය වසර 20 ක පමණ කාලය තුළ බස්නාහිර පළාතේ ඉඩම් කට්ටි කර විකිණීමේදී පොදු කටයුතු සඳහා වෙන් කර ඇති ඉඩම්වල වර්තමාන තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම.</td><td>කාරක සභාවේ නිර්දේශය පරිදි බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සමීක්ෂණයේ තොරතුරු කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක 3 තුළ වෙන්දේසි ඉඩම්වල පොදු කටයුතු සඳහා වෙන්කර ඇති ඉඩම් කොටස් පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත පමණක් එම වාර්තාවේ ඇතුළත් විය.<br><br>පොදු පහසුකම් සඳහා ඉඩම් කොටස් වෙන්කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව සඳහන් කළ කාරක සභාව, එම ඉඩම් කොටස් වැඩි ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා යොදා ගැනීමට සුදුසු තත්ත්වයේ නොමැතිවීම ගැටළුවක් බව අවධාරණය</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණකන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කළේය.<br><br>මෙම කරුණ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සමග ද සාකච්ඡා කළ බවත්, එහිදී පොදු පහසුකම් ඉඩම් සඳහා අනුමැතිය ලබා දීමේදී සැලසුම් කමිටුව විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීම සුදුසු බවට තීරණය කළ බවත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගණකන්දීමේ නිලධාරි (ග.නි) විසින් සඳහන් කරන ලදී.<br><br>අදාළ සාකච්ඡාවේදී ඇති කරගත් එකඟතාවයන්ට අනුව, ඉඩම් කට්ටිකර වෙන්දේසි කිරීමේදී අනුගමනය කළ යුතු රෙගුලාසි ඇතුළත් චක්‍රලේඛයක් කෙටුම්පත් කරමින් පවතින බව නාගරික සංවර්ධන අධිකාරියේ ගණකන්දීමේ නිලධාරි විසින් සඳහන් කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමෙන් අනතුරුව, මහර බ්ලූ මවුන්ටන් (Blue Mountain) හා ගම්පහ ප්‍රයිම් ලෑන්ඩ්ස් (Prime Lands) යන වෙන්දේසි ඉඩම්වල පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස් සඳහා අදාළ පළාත් පාලන ආයතනවල සැලසුම් කමිටු විසින් අනුමැතිය ලබා දී තිබේද යන්න හා එම සැලසුම් කමිටුවල සාමාජිකයින් වශයෙන් කටයුතු කර ඇති නිලධාරීන් කවුරුන්ද යන තොරතුරු ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | **2024.06.06. දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය**<br><br>**නියෝග අංක 2.**<br><br>ඉඩම් වෙන්දේසිකරුවන්ගේ වංචනික ක්‍රියාවන්ගෙන් පාරිභෝගික ජනතාව ආරක්ෂා කරගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුළත් විසඳුම් යෝජනාවලියක් සකස් කිරීම. | ඉඩමක් වෙන්දේසි කිරීම සඳහා මූලික අනුමැතිය ලබා ගැනීමට පෙර වෙන්දේසිකරුවන් විසින් දැන්වීම් පලකිරීම හා ඉඩමේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සිදු කරන බව පෙන්වා දුන් කාරක සභාව, මේ නිසා විදුලිය, ජලය වැනි යටිතල පහසුකම් පවා නොමැතිව ඉඩම් කොටස් මිලදී ගැනීමට ජනතාව පෙළඹෙන බව සඳහන් කළේය. ඊට අමතරව, ඉඩම් ඔප්පුවේ නිරවුල්භාවය පිළිබඳව පාරිභෝගික ජනතාවට දැන ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු බව ද කාරක සභාව සඳහන් කළේය.<br><br>කෙටුම්පත් කර ඇති ඉහත චක්‍රලේඛය මගින් මෙම ගැටළු විසඳීම සඳහා ද රෙගුලාසි ඇතුළත් කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ ග.නි. සඳහන් කළේය. එම චක්‍රලේඛයේ ඇතුළත් රෙගුලාසි කීපයක් කාරක සභාවේ නියමය පරිදි ග.නි. විසින් කාරක සභාව හමුවේ ඉදිරිපත් කරන ලදී.<br><br>තම බල ප්‍රදේශය තුළ අනවසර ඉඩම් වෙන්දේසි කිරීම් සම්බන්ධයෙන් අදාළ පළාත් පාලන ආයතන වලට නෛතික පියවර ගත හැකි වන පරිදි රෙගුලාසි ඇතුළත් කර ඇති බව මෙහිදී අනාවරණය විය.<br><br>**නිරීක්ෂණ/ නිර්දේශ**<br><br>නීති නිලධාරීන්ගේ ද උපදෙස් ලබා ගෙන අදාළ චක්‍රලේඛය සකස් කරන ලෙස උපදෙස් ලබා දුන් කාරක සභාව, කෙටුම්පත් කර ඇති චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර එහි අවසන් කෙටුම්පත 2024 අගෝස්තු මස 22 දින වනවිට කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස නාගරික |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණකන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණකන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ කරන ලදී.<br><br>**නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.08.09 දිනැති ලිපිය මගින් අදාළ චක්‍රලේඛ කෙටුම්පත ඉදිරිපත් කර ඇත.** |
| 03 | **<u>2024.06.06. දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>**<br><br>**<u>නියෝග අංක 3</u>**<br><br>ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කර ඇති මාර්ගගත ක්‍රමවේදය (Online System) සම්බන්ධයෙන් පළාත් පාලන අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය සමග එකතුව අවශ්‍ය චක්‍රලේඛ පළාත් පාලන ආයතන වෙත නිකුත් කිරීම. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා මේ වනවිට පළාත් පාලන ආයතන කීපයක් විසින් මාර්ගගත ක්‍රමවේදය (Online System) භාවිත කරනු ලබන බව පළාත් පාලන අමාත්‍යාංශයේ ග.නි. විසින් සඳහන් කරන ලදී.<br><br>එක් එක් ආයතන විසින් තම අභිමතය පරිදි සකස් කර ගන්නා ලද මාර්ගගත ක්‍රමවේදයන්හි කිසිදු ආරක්ෂිත බවක් නොමැති බව සඳහන් කළ නාගරික සංවර්ධන අධිකාරියේ ග.නි., තම ආයතනය විසින් හඳුන්වා දීමට යෝජිත පද්ධතිය පිළිගත් තොරතුරු තාක්ෂණ ආයතනයක පළපුරුදු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සකස් කරන ලද්දක් බව ද සඳහන් කළේය. තවද, සියලුම ආයතන වලට පොදු ක්‍රමවේදයක් මේ සඳහා පැවතිය යුතු බව ද ඔහු සඳහන් කළේය.<br><br>නාගරික ප්‍රදේශවල වර්ග අඩි 9000 ට වැඩි ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම තම අධිකාරිය විසින් සිදු කරනු ලබන බවත්, ඒ සඳහා 2018 වර්ෂයේ සිට භාවිත කරනු ලබන්නේ මාර්ගගත ක්‍රමවේදය බවත් නාගරික සංවර්ධන අධිකාරියේ ග.නි. මෙහිදී පෙන්වා දුන්නේය. යම් පුද්ගලයකු විසින් ඉදිරිපත් කළ ගොඩනැගිලි |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | අයදුම්පතක වර්තමාන තත්ත්වය එමගින් ඕනෑම අවස්ථාවක පරීක්ෂා කිරීමේ හැකියාව පවතින බව ද ඔහු වැඩි දුරටත් සඳහන් කළේය. පළාත් පාලන ආයතන මෙම පද්ධතියට ඇතුළත් කිරීම සඳහා පද්ධතියේ සුළු වැඩි දියුණු කිරීමක් පමණක් කළ යුතු බව තවදුරටත් අනාවරණය විය.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>ඉදිරිපත් වූ කරුණු සලකා බැලූ කාරක සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් පාලන අමාත්‍යාංශය සහ බස්නාහිර පළාත් සභාව යන ආයතන එක්ව විශ්ලේෂණයක් සිදුකර සියලුම ආයතන වලට පිළිගත හැකි පොදු ක්‍රමවේදයක් මේ සඳහා සකස්කරන ලෙසත්, එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම දක්වා දින වකවානු ඇතුළත් වාර්තාවක් 2024 අගෝස්තු 22 දිනට පෙර කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ කළේය. |
| 04 | **<u>2024.06.06. දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>**<br>**<u>නියෝග අංක 04</u>**<br>තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තක්සේරු කටයුතු ක්‍රමවත් කිරීම පිණිස එම කටයුතු පරිගණකගත කිරීම සඳහා සකස් කළ දත්ත පද්ධතිය මෙතෙක් ක්‍රියාත්මක නොකිරීම, එහි වර්තමාන තත්ත්වය හා එය | දැනට පවතින ක්‍රමය අනුව තක්සේරු කිරීම් පිළිබඳ තොරතුරු පොත්වල සටහන් කිරීම සඳහා දෛනිකව සැලකිය යුතු කාලයක් යොදවන අතර, මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් කාලය ඉතිරි වන බැවින් එම කාලය ද තක්සේරු කටයුතු සඳහා යොදවා ගැනීමට හැකි වන බව තක්සේරු දෙපාර්තමේන්තුවේ ග.නි. Zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ වෙමින් සඳහන් කළේය. එමගින් දැනට ප්‍රමාද වී පවතින තක්සේරු කටයුතු වඩාත් කාර්යක්ෂම කර ගැනීමට හැකි වන බව ද, දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | ක්‍රියාත්මක කිරීම ප්‍රමාදවීමට බලපා ඇති ගැටළු | අවසන් අදියරේ පවතින බව ද ඔහු සඳහන් කළේය. |
| 05 | **<u>2024.06.06. දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>**<br><br>**<u>නියෝග අංක 06</u>**<br><br>පළාත් පාලන ආයතන සඳහා අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීම | බොහෝ පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණකවරයකු නොමැතිවීම නිසා අභ්‍යන්තර විගණනය ක්‍රමානුකූලව සිදු නොවන බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇතත්, මෙතෙක් ඒ පිළිබඳව කටයුතු කර නොමැති බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ගණන්දීමේ නිලධාරි විසින් සඳහන් කරන ලදී.<br><br>මේ සම්බන්ධයෙන් මුදල් කොමිෂන් සභාව සමග සාකච්ඡා කළ බවත්, 2024 ජූලි මස 23 වැනි දින නැවත සාකච්ඡාවක් පැවැත්වීමට නියමිත බවත්, එහිදී මේ පිළිබඳව අවසන් තීරණයකට එළඹීමට අපේක්ෂා කරන බවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරි සඳහන් කළේය.<br><br>පළාත් පාලන ආයතනවල ශක්තිමත් අභ්‍යන්තර ඒකකයක් පැවතීම අත්‍යවශ්‍ය බව විගණකාධිපතිවරයාගේ ද අදහස විය. පසුගිය වසරේ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 49 න් තත්වාගණනය නොකළ මතයක් ලැබී ඇත්තේ ආයතන 4 කට පමණක් බවත්, 90% කට වැඩි සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ලැබී ඇත්තේ යහපත් මතයක් නොවන බවත් සඳහන් කළ විගණකාධිපතිවරයා ඊට හේතුව එම ආයතනවල නිසි ගිණුම් පරීක්ෂාවක් සිදු නොවීම බව ද සඳහන් කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 06 | **<u>2024.06.06. දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය</u>**<br><br>**<u>නියෝග අංක 07</u>**<br><br>කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් විගණනයක් සිදු කිරීම. | පෝරේ ආදාහනාගාරය ඉදිකිරීම් ව්‍යාපෘතියේ සිදුවී ඇති අක්‍රමිකතා පිළිබඳ විගණනයක් සිදු කරන ලෙස කාරක සභාව විසින් කරන ලද නිර්දේශයට අනුව විගණකාධිපතිවරයා විසින් ඒ පිළිබඳව සිදු කරන ලද විගණනයේ තොරතුරු කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලදී.<br><br>මෙම ව්‍යාපෘතිය 2021 වසරේ අග භාගයේදී ආරම්භ කර ඇති අතර, අදාළ කොන්ත්‍රාත්කරු වැඩ අතපසු කිරීම නිසා කොන්ත්‍රාත්තුව අතරමග අවලංගු කිරීමට කටයුතු කර තිබෙන බවත්, මෙයින් රජයට මූල්‍යමය අලාභයක් සිදුවී නැති බවත් විගණනය විසින් පෙන්වා දෙන ලදී.<br><br>නැවත ටෙන්ඩර් කැඳවා මෙම ආදාහනාගාරයේ ඉදිකිරීම් යළි ආරම්භ කිරීම සඳහා බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඉල්ලා ඇති බව ග.නි. විසින් සඳහන් කරන ලදී. නව ඇස්තමේන්තුව අනුව රු. මිලියන 80 ක් පමණ අවශ්‍ය වන බවත්, එම නිසා පැරණි ඇස්තමේන්තුවට අනුව ඉදිකිරීම් කිරීමට අපේක්ෂා කරන බවත් ග.නි. වැඩි දුරටත් සඳහන් කළාය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මෙම ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස කාරක සභාව විසින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙත නිර්දේශ කරන ලදී.<br><br>තවද, රන්පැලැස්ස කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය දැනට අළුත්වැඩියා කටයුත්තක් නිසා අක්‍රිය තත්ත්වයේ පවතින බවත්, මෙමගින් යම් ප්‍රමාණයක |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | විදුලි උත්පාදනය කිරීමක් සිදුවන බවත් විගණනය විසින් අනාවරණය කරන ලදී.<br>මෙය සංකල්පයක් වශයෙන් ආදර්ශවත් ව්‍යාපෘතියක් බැවින් ඉදිරියට පවත්වාගෙන යන ලෙස කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>මීට අමතරව, පසුගිය වසර 04 තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් හෝ කඩුවෙල මහා නගර සභාව විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ද්විත්ව ගෙවීම් (Double Payment) සිදුවී නැති බව විගණනයේදී අනාවරණය වූ බව විගණකාධිපතිවරයා විසින් කාරක සභාව හමුවේ සඳහන් කරන ලදී. |
| 07 | <u>විගණකාධිපති වාර්තාවෙන් පැන නගින කරුණු</u><br>කඩුවෙල මහා නගර සභාව විසින් රු. මිලියන 66 කට මිලදී ගෙන ඇති මාර්ගවල කාපට් ඇතිරීම සඳහා යොදාගන්නා යන්ත්‍ර 6 න් 4 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දිරාපත් වෙමින් පවතින බව විගණනය විසින් අනාවරණය කරන ලදී. | මෙම යන්ත්‍ර 2017 වර්ෂයේ එවකට නගර සභාවේ පාලකයින් විසින් කිසිදු ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මිලදී ගෙන ඇති බව සඳහන් කළ ග.නි., ඉන් යන්ත්‍ර 2 ක් පමණක් ප්‍රයෝජනයට ගෙන ඉතිරි යන්ත්‍ර 4 ගාල් කර තිබෙන බව සඳහන් කළේය. මෙම යන්ත්‍ර නැවත අලෙවි කිරීම සම්බන්ධයෙන් අදාළ සැපයුම් සමාගම සමග සාකච්ඡා කර ඇති බව ද ග.නි. විසින් සඳහන් කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| **ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**<br>***(2020 සහ 2021 මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්යසාධනය පරීක්ෂා කිරීම)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජූලි 23** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය<br>❖ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සහ පවතින පුරප්පාඩු</u>** | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සමස්ථ අනුමත තනතුරු සංඛ්‍යාව 613 ක් වන බවත්, 2024.06.30 දින වන විට ඉන් තනතුරු 494 ක් සම්පූර්ණ කර ඇති අතර එම නිලධාරීන්/ සේවකයින් කලාප කාර්යාල 7 ක සේවයේ යෙදී සිටින බවත්, මේ අතරින් තනතුරු 96 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන බවත්, එම තනතුරු 96 තුළ අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු වලට අමතරව ඉංජිනේරුවන් 79 ක්, ගෘහ නිර්මාණ ශිල්පීන් 13 ක් සහ ගණකාධිකාරීවරුන් 6 ක් සිටින බවත්, දෙපාර්තමේන්තුවේ තෘතීයක මට්ටමේ අනුමත තනතුරු 24 න් මේ වන විට තනතුරු 3 ක් පමණක් සම්පූර්ණ වී ඇති බවත්, තෘතීයක මට්ටම ලෙස හැදින්වෙන්නේ තාක්ෂණ නිලධාරීන්ගේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්ගේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් වන බවත්, ද්විතීයක මට්ටම වන සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර සේවා නිලධාරීන් 258 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු වන කම්කරු සහ සංචාරක බංගලා භාරකරු තනතුරු 137 ක සේවකයින් මේ වන විට දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන බවත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | <u>ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යභාරය</u> | රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනයන් හි ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු වලදී අවශ්‍ය උපදේශන සේවය සැපයීම, වාර්ෂික ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR) සැකසීම හා යාවත්කාලීන කිරීම, සේවා දායක ආයතනවල ව්‍යාපෘතීන් හි ඉදිකිරීම්වල තත්ත්ව පරීක්ෂාවන් සිදු කිරීම, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල ඉදිකිරීම් සම්බන්ධයෙන් අධිකරණය විසින් ඉල්ලා සිටින වාර්තා ලබාදීම, රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනයන් හි පවත්නා ගොඩනැගිලි සඳහා තත්ත්ව වාර්තා සැපයීම, විශ්වවිද්‍යාල හා තාක්ෂණික ආයතන වලින් සමත්වන සිසුන්ට අවශ්‍ය පරිදි වරලත් පුහුණුව සහ අනේවාසික පුහුණුව ලබාදීම සහ සභාධිපත්‍ය දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබාදීම තම ආයතනයේ කාර්යභාරය වන බව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ග.නි විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වන වාර්ෂිකව සකස් කරනු ලබන "ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (BSR)" දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පලකළ පමණින් එම මිල ගණන් ඉදිකිරීම් කටයුතු වලදී අදාළ කර ගැනීමට අනෙකුත් රාජ්‍ය ආයතනවලට අනිවාර්ය නෛතික බලපෑමක් නොමැති බැවින් සාමාන්‍යයෙන් අනෙකුත් රාජ්‍ය ආයතන එම මිල ගණන් භාවිතා නොකරන බව අනාවරණය කරගත් කාරක සභාව, මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ ද මැදිහත්වීම සහිත කමිටුවක් පත්කර ගොඩනැගිලි ගාස්තු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | උපලේඛනයෙන් වාර්ෂිකව ලබා දෙන්නා වූ මිල ගණන් සිය ඉදිකිරීම් කටයුතු වලදී අනිවාර්යයෙන් ආදාළ කරගත යුතු බවට සියළු රාජ්‍ය ආයතන දැනුවත් කර ඒ මඟින් ගොඩනැගිලි ගාස්තු උපලේඛනයට නෛතික වලංගුභාවයක් ලබා දෙන ලෙසත්, එම කටයුත්ත සඳහා මේ වන විට සියළුම පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලිය අධ්‍යයනය කර සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙසත්, ප්‍ර.ග.නි, සහ ග.නි වෙත නිර්දේශ කර එම කමිටුවේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත ලබා දෙන ලෙසට ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී. තවද, ගොඩනැගිලි ගාස්තු උපලේඛනය යාවත්කාලීන කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යභාරයක් වන බැවින් ඒ සඳහා විශේෂ අවධානය යොමු කර මෙම වසරට අදාල ගොඩනැගිලි ගාස්තු උපලේඛනය වහාම දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පලකරන ලෙස ග.නි වෙත නිර්දේශ කරන ලදී. |
| 03 | **<u>කොන්ත්‍රාත්තු සම්බන්යෙන් පවතින අක්‍රමිකතා.</u>**<br><br>අතරමඟදී කොන්ත්‍රාත්තුව හැර ගිය කොන්ත්‍රාත්කරුවෙකු අසාදු ලේඛණගත කිරීමට 2014. 09. 09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී ලබා දුන් නිර්දේශයක් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක නොකර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් එම කොන්ත්‍රාත්කරුට වසරක | තම ආයතනය මුල් කාලයේදී කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛණගත නොකර ඔවුනට වසරක කාලයක් සඳහා ප්‍රසම්පාදන ලියවිලි නිකුත් නොකිරීමට කටයුතු කළ බවත්, පසුව ඔවුන්ව අසාදු ලේඛණගත කිරීමට ක්‍රියාමාර්ගයන් ගන්නා විට රටෙහි පැවති උද්ධමනය හා අනෙකුත් ආර්ථික අපහසුතා කොන්ත්‍රාත්කරුවන්ටද බලපා තිබූ බැවින් එම ක්‍රියාදාමය ද පසුවට කල් තැබූ බවත්, එහෙත් 2024 වසරේ සිට කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛණගත |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | කාලයක් සඳහා ප්‍රසම්පාදන ලියවිලි නිකුත් නොකිරීම පමණක් සිදු කිරීම, 2017 දී පැවරූ කොන්ත්‍රාත්තු 2 ක්ම අතරමගදී නවතා දැමූ තවත් කොන්ත්‍රාත්කරුවෙකු අසාදු ලේඛණගත කළ යුතු වුවද ඔහු හට 2018 දී රුපියල් මිලියන 81 ක කොන්ත්‍රාත්කරුවක් ප්‍රදානය කිරීම හා ආර්. ඩී. බිල්ඩර්ස් (R. D. Builders) ආයතනයට 2019 වසරේ ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුව ඔවුන් විසින් අතරමඟ නවතා දමා තිබියදීත් ඊට පසු වර්ෂවලදී කොන්ත්‍රාත්තු පිරිනැමීම යන කරුණු පිළිබඳව කාරක සභාව කරුණු විමසුවේය. | කිරීම නැවත ක්‍රියාත්මක කර ඇති බවත්, මේ වන විට වැඩ පැහැර හැර ඇති කොන්ත්‍රාත්කරුවන් හට ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු දක්වන ලෙස ලිඛිතව දැනුවත් කර ඇති බවත්, 2014 වර්ෂයේ කාරක සභා නිර්දේශය අනුව කොන්ත්‍රාත්කරුවන් අසාදු ලේඛණගත නොකිරීමට කටයුතු කරන ලද්දේ එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තනි කැමැත්ත මත බවත්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ග.නි විසින් කාරක සභාවට දැන්වූවේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>2014 වසරේදී අසාදු ලේඛනගත කළ යුතු බවට නිර්දේශ නිකුත් කළ කොන්ත්‍රාත්කරුවන් එලෙස අසාදු ලේඛණගත නොකිරීම එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරන ලද බරපතල වරදක් බව තීරණය කළ කාරක සභාව, එම අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ වන විට විශ්‍රාම ගොස් සිටියද ඉදිරි කාරක සභාවකදී අවශ්‍ය වුවහොත් ඔහුගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට සිදු වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් වහාම කාරක සභාව වෙත ලබා දෙන ලෙසත් ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී. |
| 04 | **<u>2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතට අනුව සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට</u>** | මේ වන විට ඉහත ඉල්ලීම් 2,352 න් 2,302 ක් සඳහා ආරක්ෂණ සහතික නිකුත් කර ඇති බවත්, තවදුරටත් ඉතිරිව ඇත්තේ "සොන්ඩර්ස් ප්ලේස් (Sonder's Place)" නම් සහාධිපත්‍ය දේපළෙහි නිවාස 50 ක් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | **<u>සහතික නිකුත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම.</u>** <br> ඉහත පනතට අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යුතු සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත වන බවට වන සහතික සඳහා ඉදිරිපත් වූ ඉල්ලීම් 2,352 න් සහතික නිකුත් කර ඇත්තේ ඉන් 1017 ක් සඳහා වන බැවින් එම ආරක්ෂණ සහතිකය නොමැතිවීම මත මෙම සභාධිපත්‍ය දේපළ සඳහා ඔප්පු නිකුත් කිරීමට නොහැකි වී ඇති බව කාරක සභාවේදී අනාවරණය විය. | පමණක් බවත්, එම නිවාස ද නියමිත කාලය තුළදී පරීක්ෂා කිරීමට නොහැකි වූයේ රටෙහි පැවති "කොවිඩ් - 19" වාතාවරණය නිසා සහ ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අසම්පූර්ණ ලේඛන ඉදිරිපත් කිරීම වන බවත්, මේ වන විට එම නිවාසවලද භෞතික පරීක්ෂාව සිදු කිරීම සඳහා දිනයක් එහි පාලනාධිකාරියෙන් ඉල්ලා ඇති බවත්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ග.නි විසින් ප්‍රකාශ කරන ලදී. තවද, සුනාමි ව්‍යසනයෙන් පසු ගොඩනගන ලද ගොඩනැගිලි පරීක්ෂා කර බලා ඒවා පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කිරීම පිණිස වසර පහක කාලයකට මෙම විශේෂිත වගකීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පැවරුණු බවත්, එලෙස ලබා දුන් කාලය 2023 අගෝස්තු 18 වැනි දින විට ඉක්ම ගොස් ඇති බැවින් මෙම කාර්යය ඉදිරියට කරගෙන යාමට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා ගත යුතු බැවින්, එකී අනුමතිය ලැබුණු පසු ඉතිරි නිවාස සඳහා ද ආරක්ෂණ සහතිකපත්‍ර නිකුත් කළ හැකි බව ප්‍ර.ග.නි විසින් කාරක සභාවට දන්වන ලදී. <br> **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** <br> සභාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් අසම්පූර්ණ ලේඛන ඉදිරිපත් කිරීමේ ගැටළුව විසඳීම සඳහා, මින් ඉදිරියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලිපිලේඛන භාරගැනීමේදී ඒ සඳහා නිශ්චිත අයදුම්පතක් සහ මාර්ගෝපදේශයක් සකස් කර ගන්නා ලෙස කාරක සභාව විසින් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ග.නි වෙත නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 05 | **2021 – 2025 වර්ෂ වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්ම (Corporate plan) ප්‍රකාරව ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයේ තාක්ෂණයන්හි ජාත්‍යන්තර ප්‍රමිති අඛණ්ඩව වෙනස්වීම තක්සේරු කිරීම සහ අමුද්‍රව්‍ය, ශ්‍රමය ආදිය පිළිබඳව ශ්‍රී ලංකා සම්මතයන් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මේ වන විට ගෙන ඇති පියවරයන්.** | දැනටමත් ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටින බවත්, ඉදිරියේදී එම කටයුතු තවදුරටත් යාවත්කාලීන කිරීමට සුදුසු පියවරයන් ගන්නා බවටත්, ග.නි විසින් කාරක සභාව දැනුවත් කරන ලදී. |
| 06 | **ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සතුටුදායක තත්ත්වයක නොපැවතීම සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කාරක සභාව විසින් ස්ථාපිත ලකුණු ලබාදීමේ දත්ත පද්ධතියේ අවම ලකුණු ලබාගත් ආයතනයක් බවට පත්වී තිබීම.** | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සතුටුදායක තත්ත්වයක නොපැවතීමට සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, කාරක සභාව විසින් ස්ථාපිත ලකුණු ලබාදීමේ දත්ත පද්ධතියේ අවම ලකුණු ලබාගත් ආයතනයක් බවට පත්වී තිබීමට එක් හේතුවක් වන්නේ දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ මැදිහත්වීම අවම මට්ටමක පැවතීම වන බව අවධාරණය කළ කාරක සභාව මින් මතු දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් මීට වඩා වැඩි අවධානයක් යොමු කර ඒ සඳහා මැදිහත් වන ලෙස ප්‍ර.ග.නි වෙත උපදෙස් දුන්නේය. |
| 07 | **විගණකාධිපතිවරයාගේ 2024.07.23 දිනැති කෙටි සටහනෙහි ඇතුළත් අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රගතිය.** | විගණකාධිපතිවරයාගේ 2024.07.23 දිනැති කෙටි සටහනෙහි ඇතුළත් එහෙත් මෙදින සාකච්ඡාවට භාජනය නොවූ කරුණු පිළිබඳ ප්‍රගතිය මසක කාලයක් තුළ කාරක සභාව වෙත වාර්තා කරන ලෙස කාරක සභාව විසින් අමාත්‍යාංශයේ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී. |
| **ආයුර්වේද දෙපාර්තමේන්තුව**<br>***(2018, 2019, 2020, 2021 සහ 2022 මුදල් වර්ෂ සඳහා වූ විගණන වාර්තා සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් කාර්යසාධනය පරීක්ෂා කිරීම)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 ජූලි 23** | | |
| **කැඳවන ලද ආයතන -**<br>❖ සෞඛ්‍ය අමාත්‍යාංශය<br>❖ ආයුර්වේද දෙපාර්තමේන්තුව | | |
| 01 | **<u>2017.08.09 දින පවත්වන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශයන්ට අනුව දෙපාර්තමේන්තුවේ, අභ්‍යන්තර විගණන අංශයට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබා දී, එය ශක්තිමත් කිරීමට විශේෂ අවධානයක් යොමු කිරීමෙහි ප්‍රගතිය පරීක්ෂා කිරීම.</u>** | මේ වන විට අභ්‍යන්තර විගණන අංශයට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර, ඉතිරි තනතුරු 3 අතුරින් එක් (1) තනතුරක පුරප්පාඩුවක් සම්පූර්ණ කර ඇති බවත්, 2022 හා 2023 වර්ෂ සඳහා නියමිත පරිදි විගණන සහ කළමනාකරණ කමිටු 4 බැගින් පවත්වා ඇති බවත්, 2024 වර්ෂය සඳහා මේ වන විට විගණන සහ කළමනාකරණ කමිටු 2 ක් පවත්වා ඇති බවත්, ඒ අනුව එම අංශයේ කටයුතු වර්තමානයේ දී සාර්ථකව ඉටු කරනු ලබන බවත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක විසින් පැහැදිලි කරන ලදී. |
| 02 | **<u>ආයුර්වේද වෛද්‍ය සිසුන් සඳහා සීමාවාසික පුහුණුව ලබාදීම ප්‍රමාදවීම, දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාල සියල්ල සඳහා පොදු විෂය නිර්දේශයක් නොපැවතීම සහ ඇතැම් විශ්වවිද්‍යාලවල විෂයමාලා අනුමත නොවූ පාඨමාලා සඳහා ද සිසුන් බඳවා ගැනීම යන ගැටළු.</u>** | විශ්ව විද්‍යාලවලින් පිටවන සියලුම ආයුර්වේද වෛද්‍ය සිසුන්ට සීමාවාසික පුහුණුව ලබාදී වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලබන බවත්, මේ වන විට ආයුර්වේද වෛද්‍ය සිසුන් 418 ක් සීමාවාසික පුහුණුව ලබමින් සිටින බවත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි කිසිවකුගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් නොවන පරිදි සීමාවාසික පුහුණුව ප්‍රමාදයකින් තොරව ලබාදීමට මේ වනවිට කටයුතු සිදුකර ඇති බවත්, ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ ගැටළුව විසඳීම |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | සඳහා දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාල හතරෙහිම සායනික ඇගයීම් සඳහා එක් පොදු ප්‍රශ්නපත්‍රයක් භාවිතා කිරීම තුළින් පොදු ජ්‍යෂ්ඨතා ලේඛනයක් සෑදීමට උපදෙස් ලබා දී ඇති බවත්, පොදු විෂය නිර්දේශයක් නොපැවතීම සහ ඇතැම් විශ්වවිද්‍යාලවල විෂයමාලා අනුමත නොවූ පාඨමාලා සඳහා ද සිසුන් බඳවා ගැනීම යන ගැටළු, එම විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර විසඳා ගැනීමට කටයුතු කරමින් පවතින බවත්, අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි විසින් කාරක සභාවට දන්වා සිටින ලදී. |
| 03 | **<u>පාරම්පරික දැනුම සංරක්ෂණය හා දේශීය වෙදකම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් සඳහා රුපියල් මිලියන 350 ක මුදලකට අනුමැතිය ලබා දුන්නද, එම කටයුත්ත සඳහා අවශ්‍ය වන්නා වූ මාධ්‍ය අංශය නියමිත ආකාරයෙන් ස්ථාපනය නොකිරීම සහ එම ව්‍යාපෘතියේ මුදල්වලින් මිළදී ගත් රුපියල් ලක්ෂ 55 ක වටිනාකමක් ඇති ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ මේ වන විට අස්ථානගත වීම.</u>** | දෙපාර්තමේන්තුවට මාධ්‍ය ඒකකයක් ස්ථාපනය කර එහි සේවය සඳහා කොන්ත්‍රාත් පදනමින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම 2018 වසරේදී අනුමත කරනු ලැබුවද, රජය විසින් කලින් කලට ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ ද ඇතුළුව, විවිධ තාක්ෂණික හේතුන් නිසා එම කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මේ දක්වා සිදු කර නොමැති නමුත්, එම අංශයේ රාජකාරි කටයුතු මේ වන විට අමාත්‍යාංශයේ නිලධාරීන් කිහිප දෙනෙකු තාවකාලික පදනමින් යොදවා ගනිමින් සිදු කරනු ලබන බවත්, එම අංශයෙන් බලාපොරොත්තු වූ සේවය, වෙනත් රජයේ ආයතනයන් ද සහභාගී කරගනිමින්, මේ වන විටත් ඉටුකරමින් පවත්න බවත්, රුපියල් ලක්ෂ 55 ක වටිනාකමක් ඇති ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ යටතේ සඳහන් කැමරාව අස්ථානගත වී නොමැති බවත්, එය මේ වන විට අමාත්‍යාංශයේ මාධ්‍ය ඒකකයේ කටයුතු සඳහා යොදා ගෙන ඇති |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | බවත්, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කළ අවස්ථාවේදී ඇතැම් උපකරණ අළුත්වැඩියාව සඳහා යොමු කර තිබූ බවත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ග.නි විසින් දන්වා සිටින ලදී.<br>__නිරීක්ෂණ/ නිර්දේශ__<br>එම ව්‍යාපෘතිය සඳහා මිළදී ගනු ලැබූ භාණ්ඩ ලේඛනය හා ඒවායේ වර්තමාන තත්ත්වය, අස්ථානගත වී ඇති භාණ්ඩ ඇත්නම් ඒ කවරේද යන්න හා ඒ සම්බන්ධයෙන් ආයතනය ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳව වාර්තාවක්, සති දෙකක් තුළ, කාරක සභාව වෙත ලබා දෙන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>**තාක්ෂණික දැනුම සහිත නිලධාරීන්ගෙන් සමන්විත විශේෂ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර 2024.08.03 දින භාණ්ඩ සමීක්ෂණයක් සිදු කළ බවත් එහි දී භාණ්ඩවල ඌනතාවයක් හඳුනා නොගත් බවත්, ඌනතාවයක් ලෙස දක්වා ඇත්තේ අලුත්වැඩියාවන් සඳහා යොමු කර ඇති භාණ්ඩ වන බැවින් මින් ඉදිරියේ දී එවැනි අතපසුවීම් සිදු නොවීමට කටයුතු කරන බවත් ආයුර්වේද කොමසාරිස්ගේ AVU/I.AU/03/05/03/COPA සහ 2024.09.19 දිනැති වාර්තාවෙන් දන්වා ඇත.** |
| 04 | __**"AyurEx Colombo 2023"** ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා අනුග්‍රහකයන් වෙතින් ලබාගත් මුදල් දෙපාර්තමේන්තුවේ සුභසාධන ගිණුමේ තැන්පත් කිරීම හා නියමිත සහ අනුමත රාජ්‍ය__ | තාක්ෂණික ගැටළු මත එම අවස්ථාවේ දී එම ක්‍රමවේදය අනුගමනය කළද, මින් ඉදිරියට එවැනි ක්‍රමවේදයන් අනුමත කිරීමක් හෝ අනුගමනය කිරීමක් සිදු නොවන බව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි විසින් කාරක සභාවට කරුණු |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | <u>**මූල්‍ය ක්‍රමවේදයන්ට පරිබාහිරව එම මුදලින් අක්‍රමික වියදම් දැරීම**</u> | පැහැදිලි කළේය.<br><u>**නිරීක්ෂණ/ නිර්දේශ**</u><br>මෙම කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා, එම මුදල් ලැබීම් සහ ඉන් වියදම් දැරීම සම්බන්ධයෙන් වූ සේවක සුභසාධක සංගමයේ ගිණුම් වාර්තාවක් සති දෙකක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>රජයේ වියදම් පාලනය සඳහා වන භාණ්ඩාගාර ලේකම්ගේ අංක 3/2022 සහ 2022.04.06 දිනැති චක්‍රලේඛනය සහ එවකට රටෙහි පැවති තත්වයන් මත රට තුළ දේශීය වෛද්‍ය ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරිමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ සේවකයින් 95% කට වඩා වැඩි පිරිසක් සාමාජිකත්වය දරන සුභසාධන සංගමයේ ව්‍යවස්ථාපිත අරමුණු වලට අනුකූලව එකී සංගමය විසින් ඉදිරිපත් කළ සංකල්ප පත්‍රිකාව සඳහා අදාළ විෂයභාර අමාත්‍යවරයාගේ අනුමතය ලබා ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ බවත්, ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ අරමුදලින් මුදල් භාවිතා නොකළ බවත්, ආයුර්වේද ඖෂධ සංස්ථාව එහි ප්‍රවර්ධන කාර්යයන් සඳහා වෙන් කළ ප්‍රතිපාදන වලින් රු. 5,000,000/- ක් ලබා දුන් බවත්, ඉතිරි සියලු මුදල් අනුග්‍රාහකයින් වෙතින් ලබා ගත් බවත්, සුභසාධන සංගමයේ ගිණුම් බලයලත් ගිණුම් පරීක්ෂකවරයෙකු විසින් පරීක්ෂා කළ බවත්, ව්‍යාපෘතිය අවසානයේ ඉතිරි වූ මුදලින් දෙපාර්තමේන්තුවේ සන්නිවේදන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කාර්යයන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගත් බවත්, සුභසාධන සංගමයේ ගිණුම් දෙපාර්තමේන්තුවේ නිල ගිණුමක් නොවන බැවින් ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර දෙන ලෙස අමාත්‍යාංශයට කළ ඉල්ලීමට අනුව මේ වන විට විමර්ශන කණ්ඩායමක් පත් කර විමර්ශනයක් සිදු කරන බවත්, අදාළ වාර්තාව විමර්ශනය අවසානයේදී ලබා දෙන බවත්, **ආයුර්වේද කොමසාරිස්ගේ AVU/I.AU/03/05/03/COPA සහ 2024.09.19 දිනැති වාර්තාවෙන් දන්වා ඇත.** |
| 05 | **<u>බොරැල්ල ආයුර්වේද රෝහලේ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම සහ එම ගොඩනැගිල්ල සම්පූර්ණ ධාරිතාවයෙන් රෝහලේ කටයුතු සඳහා උපයෝජනය කර නොගැනීම.</u>** | බොරැල්ල ආයුර්වේද රෝහලේ ඉදිකරනු ලබන මහල් 8 කින් යුතු එකී ගොඩනැගිලි සංකීර්ණය සඳහා මලාපවහනය, අපජල පවහනය, විදුලි සම්බන්ධතා ලබාගැනීම වැනි යටිතල පහසුකම් ලබාගැනීම කළ යුතුව ඇති බවත්, මෙම කටයුත්ත සඳහා දැනට රු. මිලියන 450 ක මුදලක් අයවැය ප්‍රතිපාදන ලෙස ලැබී ඇති බවත්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කිරීමට නියමිත එම ඉදිකිරීම්, 2024 නොවැම්බර් මාසය වන විට අදාළ කොන්ත්‍රාත්කරුවන්ට පවරා, 2025 වසර මුල වන විට එහි වැඩ කටයුතු අවසන් කර රෝහලට භාරදීමේ හැකියාවක් පවතින බැවින්, එලෙස ඉදිකිරීම් කටයුතු අවසන් වුවහොත් එහි කාමර 87 ක් සහිත කොටසක් ද, ඇඳන් 354ක් සහිත වාට්ටු සංකීර්ණයක්ද පවත්වාගෙන යාමේ හැකියාවක් ඇති බවත්, රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් ප්‍රකාශ කළේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>මෙම ඉදිකිරීම් අවසන්වන විට වාට්ටු සංකීර්ණය ඵලදායී ලෙස රෝහල් පද්ධතියට ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය වන අනෙකුත් භෞතික පහසුකම් සහ සෑම මට්ටමකම කාර්ය මණ්ඩලය සපයා ගැනීමට කටයුතු සම්පාදනය කරන ලෙස කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>මෙම ගොඩනැගිල්ල තුළ ඇඳන් 304 ක් ස්ථාපනය කර සේවා සැපයිය හැකි බවත්, සෑමට සාධාරණ ලෙස සකස් කරන ලද ගාස්තු ගෙවීම් ක්‍රමයන් හා සම්බන්ධිත සැලසුම් මේ වන විට සකස් කර ඇති බවත්, ගොඩනැගිලි සංකීර්ණය සඳහා අදාළ පහසුකම් හා උපකරණ සපයා ගැනීමට රු. 250,000,000/- ප්‍රතිපාදන තවදුරටත් අවශ්‍ය බවත්, ප්‍රතිපාදන ලැබී ඇති ඉදිකිරීම් කටයුතු මේ වන විට රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන බවත්,<br>**ආයුර්වේද කොමසාරිස්ගේ AVU/I.AU/ 03/05/03/COPA සහ 2024.09.19 දිනැති වාර්තාවෙන් දන්වා ඇත.** |
| 06 | **<u>විගණකාධිපතිවරයාගේ 2024.07.23 දිනැති කෙටි සටහනෙහි ඇතුළත්, කරුණු පිළිබඳ ප්‍රගතිය.</u>** | එකී කරුණු සම්බන්ධයෙන් වන ප්‍රගතිය ආයුර්වේද කොමසාරිස්ගේ **AVU/I.AU/ 03/05/03/COPA** සහ **2024.09.19** දිනැති වාර්තාවෙන් දන්වා ඇත. |

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</td></tr>
<tr><td colspan="3">වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>(2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)<br><br>විමර්ශනය කරන ලද දිනය - 2024 ජූලි 25</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය<br>❖ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>❖ රාජ්‍ය දැව සංස්ථාව</td></tr>
<tr><td>01</td><td><u>දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය</u><br>දෙපාර්තමේන්තුවේ විෂය ක්ෂේත්‍ර, ප්‍රධානීන් අතර බෙදීයාම සම්බන්ධයෙන් යම් ගැටළුමය තත්වයක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළේය. එහිදී විෂය ක්ෂේත්‍රයන් ගණනාවක්ම එක් තනතුරකින් පාලනය සිදුවන බව කාරක සභාව පෙන්වා දුන්නේය.<br>එක් එක් අංශයේ ප්‍රධානීන් සතුවිය යුතු විද්‍යාත්මක දැනුම එක් එක් විෂය ක්ෂේත්‍රයේ වන සංරක්ෂකවරුන් පාලනය කරන ප්‍රධානීන්ට නොමැති වීම කෙරෙහි කාරක සභාවේ දී සැලකිල්ලට භාජනය විය .</td><td>අතිරේක වන සංරක්ෂක ජනරාල් (පාලන හා මානව සම්පත් කළමනාකරණ), අතිරේක වන සංරක්ෂක ජනරාල් (අධ්‍යාපන හා පර්යේෂණ), අතිරේක වන සංරක්ෂක ජනරාල් (මෙහෙයුම් හා ආරක්ෂණ) වශයෙන් අතිරේක වන සංරක්ෂක ජනරාල්වරු තිදෙනෙක් සිටින බවත් ඔවුන් පරිපාලන සේවාවේ එක් නිලධාරියෙකු හා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත වන බවත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ගණන් දීමේ නිලධාරි (ග.නි.) ප්‍රකාශ කළේය.<br><br><u>නිරීක්ෂණ/ නිර්දේශ</u><br>මෙම කරුණ සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කඩිනම් අවධානය යොමුකරන ලෙසට කාරක සභාව දන්වා සිටි අතර අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට ලක්කර හෝ වන සංරක්ෂක සේවාවේ නිලධාරීන් අවම වශයෙන් දෙදෙනෙකුවත් අතිරේක වන සංරක්ෂක ජනරාල් ධූර සඳහා පත් කිරීමට කටයුතු කරන ලෙසත් ඔවුන් යටතට වෙනම ඒකක ඇති කරන ලෙසත් කාරක සභාව යෝජනා කර සිටියේය.</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 02 | **<u>හිඟ සේවක ණය ශේෂයන් ආපසු අයකර ගැනීම පිළිබඳව 06.</u>**<br>එම හිඟ ණය ශේෂය රු. මිලියන 13ක පමණ විශාල අගයක් ගන්නා බව විගණන අංශ මගින් පෙන්වා දුනි. | කාරක සභාවේ නිර්දේශයට අනුව එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ අතර ගත් ක්‍රියාමාර්ග අනුව ඉන් රු.මිලියන 6ක් අයකර ගෙන වර්තමානයේදී එම හිඟ ශේෂය රු. මිලියන 1.9 දක්වා අඩුකර ගැනීමට හැකිවූ බවත් එම රු. මිලියන 1.9 ට අදාළව සේවය අතහැර ගිය, වැඩ තහනමට ලක්වූ හා මියගිය සේවකයන් සිටින බවත්, සේවය අතහැර ගිය සේවකයන්ගෙන් ඉදිරියේ දී තවදුරටත් මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත්, එසේ අයකර ගැනීමට නොහැකි පුද්ගලයන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2024 අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවත් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කර සිටියේය. |
| 03 | **<u>දැනට ගැසට් මගින් ප්‍රකාශයට පත් නොකළ හෙක්ටයාර 250,000ක් පමණ වන වනාන්තර ගැසට් කිරීම.</u>**<br>දිසා වන කාර්යාල 25ක් යටතේ පාලනය වන, වන භූමි ප්‍රමාණයෙන් රක්ෂිත හා සංරක්ෂිතයන් ලෙස ගැසට් කර ඇති ප්‍රමාණය හෙක්ටයාර මිලියන 1.4ක ප්‍රමාණයක් බව විගණන අංශ මගින් පෙන්වා දෙන ලදී. ඉතිරි භූමි ප්‍රමාණයේ මැනුම් කටයුතු අවසන් කර නොතිබීම තුළ අනවසර ඉඩම් අල්ලා ගැනීම්, දැව හෙලීම් හා වන අපරාධ ආදිය බහුලව සිදුවන බවට කාරක සභාව | 2012 සහ 2018 කාලය තුළ බිම් මැනුමක් සිදු නොකර GPS තාක්ෂණය හරහා වනාන්තර ගැසට් කිරීමත් සමඟ සමාජයීය ගැටළු ඇතිවූ බව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. එමෙන්ම උතුරු නැගෙනහිර දැනට හඳුනාගෙන තිබෙන හෙක්ටයාර 137,000ක වනාන්තර ප්‍රමාණය 2024 වර්ෂය අවසාන වනවිට ගැසට් කිරීමට බලාපොරොත්තු වන බව හෙතෙම කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>විගණකාධිපති වාර්තාවට අනුව ගැසට් කළයුතු වනාන්තර ප්‍රමාණය වන හෙක්ටයාර 309000 ක බිම් ප්‍රමාණය |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | හමුවේ ප්‍රකාශ විය. | දිස්ත්‍රික් හා කලාප මට්ටමින් බෙදා, වැඩපිළිවෙලක් සකස් කර, එහි වගකීම් දිස්ත්‍රික් හා කලාප මට්ටමින් දෙපාර්තමේන්තු නිලධාරීන්ට පවරා, මැනුම් කටයුතු අවසන් කිරීම ඇතුළු ඉදිරි වසර 5 තුළ කළ යුතු වැඩපිළිවෙල පෙළගස්වා, ඒ සම්බන්ධයෙන් දින වකවානු ඇතුළත් වාර්තාවක් සකස් කර 2024 සැප්තැම්බර් 25 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.)/ ගණන් දීමේ නිලධාරි (ග.නි.) වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**වන සංරක්ෂක ජනරාල්ගේ අංක DFC/HO/ACC/A6/COPA සහ 2024.09.24 දිනැති ලිපියෙන් ඉහත වාර්තාව යොමු කර ඇත. ඒ අනුව, ප්‍රකාශයට පත් නොකළ වනාන්තර මුළු ප්‍රමාණය හෙක්ටයාර් 305,000 ක් බවත්, වසර 05 ක් තුළ මෙම වනාන්තර ගැසට් මගින් ප්‍රකාශයට පත් කර අවසන් කිරීම සඳහා වැයවන මුළු පිරිවැය රුපියල් මිලියන 8,036 ක් වන බවත් වාර්තා කර ඇත.** |
| 04 | **<u>නිශ්චිතව ලංකාවේ වනාන්තර ගැසට් කර නොතිබීම හේතුවෙන් විවිධ ව්‍යාපෘති හා සංවර්ධන යෝජනා ක්‍රම වලදී මතුව ඇති ගැටළු</u>** | කිකිලියාමාන කන්දේ කේබල් කාර් ව්‍යාපෘතිය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරය නොලැබීම පිළිබඳව සාකච්ඡාවට ගත් අතර අදාළ ව්‍යාපෘතිය සඳහා නොඉඳුල් කඳුකර වනාන්තරයේ (Montane forest) අක්කරයක පමණ බිම් ප්‍රමාණයක් ඉල්ලා සිටි බැවින් ඒ සඳහා අවසර ලබා නොදුන් බව වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 05 | <u>වල්ලපට්ටා වගාව සහ එම වගාවේ දැව ප්‍රවාහනය කිරීමට ඇති බාධා</u> | මෙම වගාවේදී බහුල ලෙස වාණිජ වශයෙන් වගාකරනු ලබන්නේ වනාන්තරවල තිබෙන වල්ලපට්ටා ශාකය නොව විදේශයෙන් ගෙන්වන ලද වල්ලපට්ටා ශාක කුලයේම Aquilaria නැමැති ශාකය බවට කාරක සභාව හමුවේ කරුණු ඉදිරිපත් විය.<br><br>නමුත් මෙම ශාක දෙකෙහිම බාහිර ස්වරූපය සමාන බවත් දැව ප්‍රවාහනයේ දී වනාන්තරවල තිබෙන වල්ලපට්ටා ශාකය (Gyrinops walla) සහ වාණිජ වශයෙන් වගාකරන විදේශයෙන් ගෙන්වන ලද Aquilaria නැමැති ශාකය වෙන්කර හඳුනාගැනීමේ අසීරුතාවයක් තිබෙන බැවින් ප්‍රවාහන බලපත්‍ර ලබාගත යුතු බව කාරක සභාව හමුවේ ප්‍රකාශ විය.<br><br>වල්ලාපට්ට ශාකය වනාන්තර තුළ තිබේනම්, එම ශාකයේ වගකීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරෙන බව හා වනාන්තර වලින් පිටත තිබේ නම් එහි අයිතිය අදාළ ආයතන වෙත පැවරෙන බව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. ප්‍රකාශ කළේය.<br><br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br><br>මේ සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයක් පිළිබඳව සොයා බලා වාර්තාවක් සකස් කර 2024 සැප්තැම්බර් 25 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | වන සංරක්ෂක ජනරාල්ගේ අංක DFC/HO/ACC/A6/COPA සහ 2024.09.24 දිනැති ලිපියෙන් මෙම වාර්තාව යොමු කර ඇත. ඒ අනුව, Gyrinops walla සහ Aquilaria ශාක විශේෂ දෙක එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් සකස් කිරීමට සහ වගාකරනු ලබන Aquilaria විශේෂ ප්‍රවාහනය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට පත්කරන ලද විශේෂඥ කමිටුව විසින් Aquilaria සඳහා ප්‍රවාහන බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලිය අහෝසි කිරීම සුදුසු නොවන බව, නීති විරෝධී වෙළඳාම පාලනය කිරීම උදෙසා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් සකස්කිරීම අවශ්‍ය බව ඇතුළු නිර්දේශ ලබාදී ඇත. |
| 06 | <u>පාරිසරික සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් වැඩපිළිවෙලක් 2024 වර්ෂය වන විටත් ස්ථාපිත කර නොතිබීම</u> | දැනට දෙපාර්තමේන්තුව මඟින් සංචාරකයන් සඳහා ස්ථාන 26ක් පවත්වාගෙන යන බවත්, මෙම ස්ථාන මඟින් 2023 වර්ෂයේ දී රු. මිලියන 172ක් හා 2024 වර්ෂයේ මුල් මාස 7 තුළ පමණක් රු. මිලියන 243ක පමණ ආදායමක් උපයා තිබෙන බවත්, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම සිංහරාජ වනාන්තරය නැරඹීම සඳහා 35000ක් පමණ වැඩිම සංචාරකයන් සංඛ්‍යාවක් 2024 වසරේදී පැමිණ තිබෙන බවද හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය. |
| 07 | <u>“පූර්ණ හෙළිම්” කිරීම සඳහා රාජ්‍ය දැව සංස්ථාව වෙත භාරදෙන ලද වන වගා නියමිත කාලය තුළ</u> | 2021 වර්ෂයේ සිට දැව හෙළීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට පෙර වසරට සාපේක්ෂව විශාල භූමි ප්‍රමාණයක් ලබාදීම |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | **<u>සිදු නොකිරීම නිසා ගැටළු ඇතිවීම.</u>**<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පූර්ණ හෙළීම් කිරීමට යෝජිත වන වගා නියමිත කාලය තුළ සිදු නොකිරීම නිසා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්මට අනුව නැවත වන වගාකිරීම සඳහා සිටුවීමට යෝජිත පැල වර්ග තවාන් තුළම විශාල වීම හා නඩත්තු කිරීම් සඳහා විශාල මුදලක් වැයවීම සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසන ලදී. | හා කොවිඩ් අර්බුදය හේතුවෙන් අදාළ කාලය තුල සම්පූර්ණයෙන් දැව හෙළීමට නොහැකිවීම නිසා මෙම ගැටළුව පැන නැඟුන බව රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ෆයිනස් වගාව ලංකාවෙන් ඉවත් කිරීමට 2020 වර්ෂයේ දී පැමිණි යෝජනා අනුව කටයුතු කිරීමත් සමඟ දැව හෙළීම සඳහා රාජ්‍ය දැව සංස්ථාවට ලබාදුන් භූමි ප්‍රමාණයද විශාල වීම සිදුවූ බවටත්, ඉතිරි ප්‍රමාණය 2025 වර්ෂය අවසාන වනවිට කපා ඉවත්කළ හැකි බවටත් රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් වැඩිදුරටත් ප්‍රකාශ කළහ.<br>මේ සඳහා අවශ්‍ය පරිදි වසර 10ක හෝ සැලසුමක් සකස් කර වන හෙළීම් සිදු කරන ලෙස කාරක සභාව විසින් රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් වෙත උපදෙස් දුන්නේය. |
| 08 | **<u>දියතලාව හමුදා කඳවුර ආශ්‍රිතව හෙක්ටයාර 42ක ෆයිනස් වගාව සම්පූර්ණයෙන් හෙළිකර නැවත සිටුවීමට සූදානම්ව තිබුණද එය නිසි අයුරින් සිදු නොකිරීම නිසා නැවත සිටුවීමට වවන ලද පැල නඩත්තුවට රු. මිලියන 6ක පමණ මුදලක් වැයවීම හා එම පැල විනාශවෙමින් පැවතීම.</u>** | 2021 වර්ෂයේදී ෆයිනස් වගාව ලංකාවෙන් ඉවත්කර කෙටි කාලයක් තුළදී දේශීය වන වගාව බවට පරිවර්තනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව මෙම කඳවුර අසල ෆයිනස් වගාව හෙක්ටයාර 100ක් පමණ ඉවත් කර දේශීය වන වගාව කිරීමට කටයුතු ආරම්භ කළ බවත්, දියතලාව හමුදා කඳවුර තුළ පිහිටි වන වගාවක් බැවින් හමුදා කඳවුරේ නීතිරීති වලට අනුකූලව සීමිත කාල සීමාවල් තුළ දැව හෙළීම සිදුකළ යුතු බවත් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී. එම කටයුතු සොයා බලන ලෙස කාරක සභාව උපදෙස් දුන්නේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| 09 | **නිසි ඇස්තමේන්තුවකින් තොරව පැළ තවන් කර තිබීම හා කාර්යක්ෂම ලෙස බෙදාහැර නොතිබීම**<br>මේ හේතුවෙන් පැල තවාන් තුළම විශාල ප්‍රමාණයක් ඉතිරිවී තිබීම හා නඩත්තු කිරීම් සඳහා විශාල මුදලක් වැයවීම සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. මෙහිදී 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මෙම පැළ නඩත්තුවට රු. මිලියන 107ක පමණ මුදලක් වැයකිරීම සම්බන්ධයෙන් ද කරුණු විමසන ලදී. | ඒ ඒ ප්‍රදේශවල වාර්ෂික පැල ඉල්ලුම අනුව වඳවී යන ශාක ප්‍රමාණය, මෙම වසර තුළ තවන් තුළ පැල ලක්ෂ 7ක පමණ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද බවත් ප්‍රකාශ කළ දෙපාර්තමේන්තු නිලධාරීන් දේශීය ආයතන විසින් සිදුකරන ඉල්ලීම් ප්‍රකාරව එම පැළ ලබාදීම සිදුවන බව ප්‍රකාශ කළේය. |
| 10 | **ත්‍රිකුණාමලය යාන්ඔය ඩෙල්ටාවේ වැලි ගොඩදැමීම** | එම ක්‍රියාවලිය මඟින් කඩොලාන රක්ෂිතයට හානියක් සිදුවී නොමැති බවත්, එහි තිබෙන විවෘත ප්‍රදේශයකට වැලි ගොඩදමා තිබෙන බවත්, දෙපාර්තමේන්තුව මඟින් වැලි ගොඩදැමීමේ බලපත්‍ර 5ක් නිකුත් කර තිබෙන අතර එම බලපත්‍ර ද මේ වසර වනවිට අහෝසි කර තිබෙන බවත්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය. එමෙන්ම ගව පට්ටි වනාන්තර තුළට ඇතුළුවීම ද වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුහුණ දී තිබෙන ගැටළුවක් බව එම නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී. |
| 11 | **කොන්ත්‍රාත් පදනම මත ගල් කැඩීම සඳහා ලබාදුන් ගල්කොරි බලපත්‍ර අනුව ගල් කැඩීමෙන් අනතුරුව හැරුණු වළවල් නිසි පරිදි නොපිරවීම නිසා ජලය** | එහිදී ත්‍රිකුණාමලය කිළිකොංජිමලේ ගල්කොරිය සම්බන්ධයෙන් ද විමසූ අතර එය තවම ක්‍රියාත්මක ගල්කොරියක් බව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. විසින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **<u>පිරුණු වලවල් බවට පත්ව තිබීම සහ ඇතැම් තැන්හි එම වළවල් වලට කසල බැහැර කිරීම ආදී කටයුතු නිසා පාරිසරික ගැටළු රාශියකට මුහුණපා තිබීම.</u>** | කාරක සභාව වෙත දන්වන ලදී. මෙම ගල්කොරි බලපත්‍රලාභීන්ගෙන් තැන්පතුවක් රඳවා තබාගෙන තිබෙන බවත් අදාළ ගිවිසුම් කාලය අවසන් වීමට පෙර එම වළවල් වසාදැමිය යුතු බවත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ග.නි. සඳහන් කළේය. |
| 12 | **<u>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම</u>** | දැනට දෙපාර්තමේන්තුව තුළ තිබෙන තාක්ෂණික අංශ 8හි වෙන වෙනම දත්ත පද්ධතීන් පවත්වාගෙන යන බවත්, ඊට අමතරව පාලන අංශයේ, ආයතනික හා පර්යේෂණ යන අංශවල වෙනම දත්ත පද්ධතීන් ඇති බවත්, එම දත්ත පද්ධති ගබඩා කිරීම සඳහා ටෙරා බයිට් 8ක ධාරිතාවයෙන් යුත් ක්ලවුඩ් (Cloud) පද්ධතියක් මිලදී ගෙන තිබෙන බවත්, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>මේ සඳහා අවශ්‍ය දත්ත පද්ධතිය සකස් කර තිබේද යන්න පිළිබඳව කාරක සභාව විමසීය. අදාළ දත්ත පද්ධතිය ඉහත 7 කරුණෙහි සඳහන් වනාන්තර ගැසට් කිරීමේ වැඩපිළිවෙලෙහි ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගතිය වාර්තා කළ හැකි අයුරින් සකස් විය යුතු බව කාරක සභාව පෙන්වා දුන්නේය.<br>ඒ අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 පුරා විසිරී සිටින දෙපාර්තමේන්තු නිලධාරීන්ට දත්ත ඇතුළත් කිරීම හා දත්ත ලබා ගැනීමට හැකිවන පරිද්දෙන් මධ්‍යගත දත්ත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා දින වකවානු ඇතුළත් වාර්තාවක් සකස් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | කර 2024 සැප්තැම්බර් 25 දින වනවිට කාරක සභාව වෙත යොමු කරන ලෙස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**වන සංරක්ෂක ජනරාල්ගේ අංක DFC/HO/ACC/A6/COPA සහ 2024.09.24 දිනැති ලිපියෙන් මෙම වාර්තාව යොමු කර ඇත. ඒ අනුව මධ්‍යගත තොරතුරු පද්ධතියක් සකස් කිරීමේ කටයුතු සඳහා 2024 නොවැම්බර් 30 දින දක්වා වන කාලරාමුවක් ඉදිරිපත් කර ඇති අතර, දත්ත පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගෙන යාමේ වගකීම් පවරනු ලබන නිලධාරීන් පිළිබඳව ද වාර්තා කර ඇත.** |
| 13 | <u>**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ගල් කැණීමේ බලපත්‍රයන්ට අදාළ හිඟ ආදායම් අයකර ගැනීම**</u> | ගල්කැණීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී කැණීම් කටයුතු සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන "සී" බලපත්‍රයට අමතරව භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය (GSMB) මඟින් ද කැණීම් බලපත්‍රයක් නිකුත් කරන බවත්, එම භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය මඟින් නිකුත් කළ බලපත්‍රයට අනුව වෙඩි බෙහෙත් නිකුත් කිරීම තුළ මෙම හිඟ ආදායම් නිර්මාණය වන බව හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ "සී" බලපත්‍රය ඉක්මවා සිදුකළ කැණීම් වෙනුවෙන් හිඟ ගාස්තු ගෙවීමට බලපත්‍රලාභීන් කටයුතු නොකරන බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මඟින් මාස 36ක සහන කාලයක් ද, හිඟ බලපත්‍ර ගාස්තුවෙන් 75%ක සහනයක් ද ලබා දී |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | තිබෙන බව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br>**<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>**<br>ප්‍රථමයෙන්ම, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට අයත් සන්නිවේදන කුළුණු ලේඛනය සකස් කරන ලෙසත්, ඒ අතුරින් ගාස්තු නොගෙවූ සමාගම් පිළිබඳ ලේඛනයක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>ඉදිරියේදී ගල්කොරි බලපත්‍රයන්ට අදාළව වෙඩි බෙහෙත් නිකුත් කරනු ලබන ප්‍රමාණය නිර්ණය කර ඊට අනුරූපීයව බදු මුදල තීරණය කරන ලෙසත්, ඒ සඳහා භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය සමඟ ඒකාබද්ධ ක්‍රමවේදයකට අනුව කටයුතු කරන ලෙසත්, ඒ සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශය ද සඳහන් කරමින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිඛිතව දන්වන ලෙසත්, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>ගල්කොරි බලපත්‍රයන්ට අදාළ හිඟ ගාස්තු ගෙවීම සිදු නොකළ ආයතන 143 සඳහා හිඟ ගාස්තු ගෙවන ලෙසට අවසාන නිවේදනය යැවීමෙන් පසුව ද ගෙවීම් කටයුතු සිදු නොකරන ආයතන අසාධු ලේඛනගත කරන ලෙසත් (Blacklist), අදාළ බලපත්‍ර හිමියන්ගේ නම් වලින් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | ලබාගෙන තිබෙන වෙනත් බලපත්‍ර තිබේනම් ඒවාද අහෝසි කරන ලෙසත්, සන්නිවේදන කුළුණු ගාස්තු සම්බන්ධයෙන් අදාළ සන්නිවේදන සමාගම් එකම දිනයක කැඳවා අදාළ ගාස්තු ගෙවීම සඳහා අවසන් දිනයක් නියම කර එදින වනවිට ගාස්තු ගෙවා අවසන් කරන ලෙස දන්වා සිටින ලෙසත් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br><br>**වන සංරක්ෂක ජනරාල්ගේ අංක DFC/HO/ACC/A6/COPA සහ 2024.09.24 දිනැති ලිපියෙන් පහත තොරතුරු වාර්තා කර ඇත;**<br><br>**i. ගල් කොරි බලපත්‍ර හිමියන්ට හිඟ ගාස්තු ගෙවන ලෙසට අවසාන නිවේදනය 2024.09.02 දින යවා ඇති බව සහ තවදුරටත් හිඟ ගාස්තු නොගෙවූ බලපත්‍ර හිමියන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බව.**<br><br>**ii. සම්ප්‍රේෂණ කුළුනු සඳහා හිඟ ගාස්තු ගෙවීම් සහ හිඟ මුදල් ගෙවීමට ලබා දී ඇති අවසන් දින පිළිබඳ විස්තර එවා ඇත.**<br><br>**iii. සම්ප්‍රේෂණ කුළුනුවල ප්‍රවේශ මාර්ග භාවිතා කිරීම සහ විදුලි රැහැන් ඇදීම සම්බන්ධයෙන් අයවිය යුතු ගාස්තුව පිළිබඳව තීරණයක් ගැනීමට කමිටුවක් පත් කර ඇති බව සහ එහි නිර්දේශ දෙපාර්තමේන්තුවේ විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කිරීමෙන් පසු නියමිත මුදල් අයකර** |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | **ගැනීමට කටයුතු කරනු ලබන බව.** |
| 14 | **<u>වනජ සම්පත් තිරසර අයුරින් නෙලා ගැනීම.</u>** | වනාන්තර වලින් කිතුල්, මීපැණි, වේවැල් වැනි ද්‍රව්‍ය ලබාගන්නා අතර එය තිරසාර අන්දමින් ලබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තම දෙපාර්තමේන්තුව මඟින් සිදුකරන බව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. කාරක සභාව ඉදිරියේදී ප්‍රකාශ කළේය.<br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු ලබාගෙන ශ්‍රී ලංකාවේ වනාන්තරවලින් ලබාගත හැකි සම්පත් හඳුනාගෙන, ඒවා තිබෙන ස්ථාන සහ එම සම්පත් තිරසාරව නෙලා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමවේද/ මාර්ගෝපදේශ අදාළ දිස්ත්‍රික් කාර්යාල සඳහා නිකුත් කරන ලෙස වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**වන සංරක්ෂක ජනරාල්ගේ අංක DFC/HO/ACC/A6/COPA සහ 2024.09.24 දිනැති ලිපියෙන් ඉහත උපදෙස් ලබා දී ඇති ආකාරය වාර්තා කර ඇත. තවද, වනජ ද්‍රව්‍ය තිරසාර ලෙස භාවිතා කිරීම සම්බන්ධව එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සමග ඒකාබද්ධ අධ්‍යයනයක් සිදු කිරීමට නියමිත බවද වාර්තා කර ඇත.** |

<table>
<tr><td></td><td>සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු</td><td>ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ</td></tr>
<tr><td colspan="3">වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>(2020, 2021 හා 2022 වර්ෂ සඳහා විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරුණු සහ වර්තමාන කාර්යසාධනය)<br>විමර්ශනය කරන ලද දිනය - 2024 අගෝස්තු 07</td></tr>
<tr><td colspan="3">කැඳවන ලද ආයතන -<br>❖ වාරිමාර්ග අමාත්‍යාංශය<br>❖ වාරිමාර්ග දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>01</td><td><u>වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලබන ගෙවීම් පටිපාටිය රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූල නොවීම</u><br><br>වාර්මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශිය කාර්යාල 52ක ගෙවීම් සහතික කිරීම, සැපයුම් සහතික කිරීම ගෙවීම් කිරීම යනාදිය ගණකාධිකාරී නොවන ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරීන් විසින් සිදුකිරීම හේතුවෙන් මූල්‍ය අක්‍රමිකතාවයන්ට වැඩි ඉඩකඩක් පවතින බව විගණනය විසින් පෙන්වා දෙන ලදී.</td><td>තාවකාලික පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට ගෙවීම් කිරීමේදී මුදලින් ගෙවීම් සිදු කිරීම, ගෙවීම් සහතික කිරීම හා ගෙවීම් පිළිබඳ ලේඛන නඩත්තු කිරීම යන කාර්යයන් ගණකාධිකාරිවරයෙකු නොවන ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරීන් විසින් සිදු කිරීම මුදල් රෙගුලාසිවලට හා වැඩ බෙදීමේ මූලධර්මයන්ට පටහැනි වන බවත්, ඉන් අක්‍රමිකතා සිදුවීමේ ප්‍රවනතාවයක් ඇති බවත්, කාරක සභාව පෙන්වා දුන්නේය.<br><br><u>නිරීක්ෂණ /නිර්දේශ</u><br><br>තාවකාලික පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට වැටුප් ගෙවීම් සිදු කිරීමේදී වාරිමාර්ග ඉංජිනේරු නමින් ලියන ලද චෙක්පත් මුදල්කර ගෙවීම්ලාභීන්ට මුදල් ලෙස ගෙවීම් සිදු කිරීම නිවැරදි ගෙවීම් ක්‍රමවේදයක් නොවන බැවින් අදාළ ගෙවීම්ලාභියාගේ නමින් ඇති ගිණුමකට මුදල් බැරකිරීම වැනි ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙස උපදෙස් ලබා දෙමින් සේවක වැටුප් ගෙවීමේ චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස දෙපාර්තමේන්තුවේ ග.නි. වෙත නිර්දේශ කළ අතර එම චක්‍රලේඛනයෙහි පිටපත් සමඟ එහි ප්‍රගතිය කාරක සභාව වෙත වාර්තා කරන ලෙස ද දන්වා සිටියේය.</td></tr>
</table>

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MI/F-13/ID/COPA/GEN හා 2024.10.23 දිනැති ලිපියෙන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා තාවකාලික පදනමින් බඳවාගනු ලබන කම්කරුවන්හට භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ වගකිවයුතු පාර්ශ්වයන් වෙත නිකුත් කරන ලද අංක CFO/FIN/AMC/01/2023 හා 2024.09.24 දිනැති උපදෙස් ලිපියේ පිටපතක් ඉදිරිපත් කර ඇත.** |
| 02 | **<u>ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවට ගෙවීම් සම්බන්ධව බලතල පැවරීම් ඇතුළත් කර තිබීම</u>** | **<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>මෙම කරුණට අදාළව 2017 අප්‍රේල් 07 දිනැති අංක 2013/31 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කර තිබූ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාවට ගණකාධිකාරිවරයෙකු විසින් ඉටු කළ යුතු ගෙවීම් සහතික කිරීම, මුදලින් ගෙවීම් සිදු කිරීම, චෙක්පත් අත්සන් කිරීම, ගෙවීම් පිළිබඳ ලේඛන නඩත්තු කිරීම ආදි රාජකාරි ලැයිස්තුවක් ඇතුළත් කර තිබීම සම්බන්ධයෙන් බලවත් අප්‍රසාදය පළ කර සිටි කාරක සභාව එය වහාම ක්‍රියාත්මක වන පරිදි සංශෝධනයට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා යවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත උපදෙස් දුන් අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍ර.ග.නි./ ග.නි. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | වෙත නිර්දේශ කළේය.<br>**රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අංක PAC/9/5/2024 හා 2024.08.20 දිනැති ලිපියෙන් ඉහත නිර්දේශය පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා යවා ඇත.**<br>**වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MI/F-13/ID/COPA/GEN හා 2024.08.31 දිනැති ලිපියෙන්, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයාගේ බලතල සම්බන්ධව වර්තමානයේ ක්‍රියාත්මක වන සංශෝධනයන් පිළිබඳව වාර්තා කර ඇති අතර, ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරන තෙක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය බාධාවකින් තොරව ඉටුකර ගැනීම සඳහා ඊට අනුකූලව කටයුතු කරන බව දන්වා ඇත.** |
| 03 | **ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල ගෙවීම් සහතික කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් ඇති කිරීම.** | **නිරීක්ෂණ /නිර්දේශ**<br>කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලවලට අනුයුක්ත කර ඇති ගණකාධිකාරීවරුන්ට ගෙවීම් සහතික කිරීමට හැකි, එකී සේවා ස්ථානවලට ආසන්නව පිහිටා ඇති ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල මොනවාද යන්න සහ එසේ කළ නොහැකි අවස්ථාවන්හිදී ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී වෙත ගෙවීම් සහතික කිරීමේ බලය ලබා දිය හැකි වන කාර්යාල මොනවාද යන්න (ගණකාධිකාරිවරුන් පත්කරන තෙක් තාවකාලික විසඳුමක් ලෙස) පිළිබඳව වාරිමාර්ග අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ව කමිටුවක් පත්කර දීර්ඝ වශයෙන් සාකච්ඡා කර මුදල් අමාත්‍යාංශය ද සම්බන්ධ |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | කරගෙන මාසයක් ඇතුළත සුදුසු ක්‍රමවේදයක් සකසන ලෙසත්, ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමෙන් අනතුරුව චක්‍රලේඛයක් මඟින් ඒ සම්බන්ධයෙන් අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් නිර්දේශ කළ කාරක සභාව එම චක්‍රලේඛ නිකුත් කිරීමට පෙර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව කාරක සභාවට පිටපතක් යොමු කරන ලෙස උපදෙස් දුන්නේය. |
| 04 | **<u>බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රු. මිලියන 2,093 ක ලංසුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත රු. මිලියන 254 කින් වැඩි කර තිබීම.</u>** | ආරම්භයේදී තාක්ෂණික ඇගයීම් කමිටුවේ වැරදි ගණනය කිරීම් මත රු. මිලියන 254ක් වැඩිපුර ඇස්තමේන්තු ගතකර තිබෙන බවත්, එම මුදලට අනුපාතිකව 20%ක අත්තිකාරම් වශයෙන් රු. මිලියන 50ක මුදලක් වැඩිපුර ගෙවා තිබෙන බවත් එම මුදල අත්තිකාරම් මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ දී නැවත පියවා ගන්නා බවත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේය.<br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>මෙම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කරන ලෙසත්, ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සිටි නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගතයුතු හෙයින් 2024.08.20 දිනට පෙර ලිඛිත දැනුම්දීම් මගින් ඔවුන් කැඳවා මෙම සිදුවීම සම්බන්ධව ඔවුන්ගේ නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් සකස් කර එම වාර්තාව 2024.09.01 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. වෙත නිර්දේශ කළේය. |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | **කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MI/F-13/Project/ Gen/2024 හා 2024.10.18 දිනැති ලිපියෙන් ඉහත තාක්ෂණික ඇගයීම් කමිටුවේ සිටි නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ පිටපතක් යොමු කර ඇත.** |
| 05 | **<u>බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වටිනාකම ඉහළ යාම සමඟ අතිරේක රු.මිලියන 1085ක මුදලක් ගෙවීමට නියමිතව තිබීම</u>**<br><br>ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත වීමේදී ව්‍යාපෘතියට අදාළ ඉඩම් හඳුනාගෙන අත්පත් කර ගැනීමකින් තොරව ව්‍යාපෘති සමාගම සමඟ ගිවිසුම්ගතව තිබීම හේතුවෙන් මෙම ගැටළුව පැනනැඟී ඇති බව විගණන අංශ මඟින් පෙන්වා දෙන ලදී. | **<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br><br>මෙම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට ගෙවා ඇති මුදල් ප්‍රමාණය, එහි ඉදිකිරීම් කටයුතු නිමවා ඇති ප්‍රමාණය සහ දැනට මෙම ව්‍යාපෘතියෙන් ජලය ලබාගැනීම සිදු කරයිද යනාදී කරුණු ඇතුළත් එහි වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු වාර්තාවක් 2024.08.20 දිනට පෙර කාරක සභාව වෙත යොමු කරන ලෙස කාරක සභාව අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි/ ග.නි. වෙත නිර්දේශ කළේය.<br><br>**බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතියේ පසුබිම හා වර්තමාන තත්ත්වය පිළිබඳව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුතු වාර්තාවක් ඉදිරිපත් කර ඇත.** |
| 06 | **<u>ගිං නිල්වලා ව්‍යාපෘතිය</u>**<br><br>2014 වසරේදී ඇ.ඩො.මි. 690කට ගිවිසුම් ගතවූ මෙම ව්‍යාපෘතියෙහි අත්තිකාරම් වශයෙන් ඇ.ඩො.මි. 29.989ක් කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති බවත්, ඉන්පසු ගෙවූ අත්තිකාරම් මුදලට සරිලන අයුරින් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා | පූර්ව ශක්‍යතා අධ්‍යයනයෙන් අනතුරුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතියක්ද ලද බවත් ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය හරහා අදාළ ගිවිසුම් වලට එළඹීම සිදුවූ බවත් වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. විසින් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම ව්‍යාපෘතියට ගිං හා නිල්වලා යන ගංගා 2ම අදාළ වන නමුත් ව්‍යාපෘතියට අදාළ ගිං ගඟේ කොටසක් ලෝක උරුම සිංහරාජ වනාන්තරයට අයත් වන බැවින් වන |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | 2017 වසරේදී අදාළ ගිවිසුම සංශෝධනය කළ බවත් කාරක සභාව හමුවේ කරුණු අනාවරණය විය. මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමට මාස 8ක කාලයක් ලබාදී ඇති නමුත් දැනට වසර 7ක් ගතවී තිබෙන බවද කරුණු ප්‍රකාශ විය.<br><br>මෙම ව්‍යාපෘතිය සිදු නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියේ පූර්ව ශක්‍යතා අධ්‍යයනය සඳහා වැයවූ මුදල සහ වර්ෂ 5 ක කාලයක් තුළ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා ඇතුළු අනෙකුත් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් වැයකල රු. මිලියන 27 ක මුදල නිශ්ඵල වියදමක් වී ඇති බවත්, 2015 මැයි මස 26 වන දින වන විට ව්‍යාපෘතිය අත්හිටුවීමට කටයුතු කළ තිබුණ ද ඒ සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල, බැඳුම්කර මුදලින් අඩු කිරීමට කටයුතු නොකිරීම පිළිබඳ විගණන අංශ මඟින් පෙන්වා දෙන ලදී. | සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා යුනෙස්කෝ ආයතනයේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වීම මත 2024 වර්ෂය දක්වාම ශක්‍යතා අධ්‍යයනය කිරීම ප්‍රමාද වූ බව හෙතෙම වැඩිදුරටත් ප්‍රකාශ කළේය.<br><br>මේ වනවිට එහි ශක්‍යතා අධ්‍යයන කටයුතු හා භූ විද්‍යාත්මක පරීක්ෂණ කටයුතු 95% ක් පමණ නිමවා ඇති බවත් කැබිනට් අනුමැතියක් ලබා ගැනීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කිරීමට අපේක්ෂිත බවත් අදාළ වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි./ ග.නි. විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>***<u>නිරීක්ෂණ /නිර්දේශ</u>***<br><br>මුදල් රෙගුලාසි අංක 3හි සඳහන් ක්‍රමවේදය නොසලකා හරිමින් ගිවිසුම්වලට එළඹීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබෙන බව විගණන අංශ මඟින් පෙන්වා දුන් අතර සිංහරාජ වනාන්තරයට අයත් අදාළ භූමි ප්‍රදේශ සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීමෙන් තොරව ව්‍යාපෘතිය සම්බන්ධ ගිවිසුම් අත්සන් කිරීම පිළිබඳව කාරක සභාව තම අප්‍රසාදය පළකර සිටියේය. ඉදිරියේදී මෙවැනි ව්‍යාපෘතිවලට අදාළව ගිවිසුම් අත්සන් කිරීමට පෙර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කරන ලදී. |
| 07 | විගණකාධිපතිවරයාගේ ලුහුඬු සටහනෙහි අඩංගු කරුණු (2024.08.07 දින රැස්වීමේදී සාකච්ඡාවට නොගත් විගණන | 2024.08.07 දින රැස්වීම සඳහා විගණකාධිපතිවරයා විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද විගණන කෙටි සටහනෙහි (Brief Note) මෙදින |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | ඡේද) | සාකච්ඡාවට නොගන්නා ලද විගණන විමසුම් සම්බන්ධ පිළිතුරු කාරක සභාව වෙත යොමු කරන ලෙස වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| **ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**<br>***(ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යසාධනය පරීක්ෂා කිරීම සඳහා 2024.06.06 දින පැවැත්වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශයන් හි ප්‍රගතිය සහ වර්තමාන කාර්යසාධනය)***<br>**විමර්ශනය කරන ලද දිනය - 2024 අගෝස්තු 08** | | |
| කැඳවන ලද ආයතන -<br>❖ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය<br>❖ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය | | |
| 01 | **<u>ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පේටන්ට් පරීක්ෂක සහ බුද්ධිමය දේපල නිලධාරීන් බඳවාගැනීමේදී දෙපාර්තමේන්තුවේ සේවය කරන සංවර්ධන නිලධාරීන්ට ද එම තනතුරු සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දීම.</u>** | ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා පේටන්ට් පරීක්ෂකවරුන් සහ බුද්ධිමය දේපල නිලධාරීන් බඳවා ගැනීමේදී දෙපාර්තමේන්තුවේ සේවය කරන සංවර්ධන නිලධාරීන්ට ද එම තනතුරු සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය ලැබී ඇති බවත් ඒ අනුව බුද්ධිමය දේපල නිලධාරි තනතුරු පුරප්පාඩු 08 ක් පිරවීම සඳහා මේ වනවිට අයදුම්පත් කැඳවා ඇති බවත්, පේටන්ට් පරීක්ෂක තනතුරු පුරප්පාඩු 10 ක් පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමට නියමිත බවත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ග.නි විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.<br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>කඩිනමින් අදාල බඳවාගැනීම් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව විසින් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි සහ ජාතික |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | බුද්ධිමය දේපළ කාර්යාලයේ ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>**පේටන්ට් පරීක්ෂක තනතුරු සඳහා විවෘත බඳවා ගැනීමේ තරඟ විභාගයට අදාළ නිවේදනය 2024.10.11 දින ගැසට් පත්‍රයේ පළ කළ බවත්, අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2024.11.13 දින බවත් බුද්ධිමය දේපළ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය 2024.11.10 දින පැවැත්වීමට නියමිතව ඇති බවත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 02 | **<u>පේටන්ට් අංශයෙහි අධ්‍යක්ෂකවරිය අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථානමාරු කිරීම</u>** | I ශ්‍රේණියේ නිලධාරීන් සීමිත සංඛ්‍යාවකින් පවත්වාගෙන යනු ලබන පේටන්ට් අංශයෙහි අධ්‍යක්ෂකවරිය අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථානමාරු කිරීම 2024 සැප්තැම්බර් හෝ ඔක්තෝබර් මාසයේදී ඇරඹීමට නියමිත ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය (Digitization Project) පවත්වාගෙන යාමට බාධාවක් වන බැවින් අනුප්‍රාප්තිකයෙකු ලබා දෙන ලෙස ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ ග.නි විසින් ඉල්ලා සිටින ලදී.<br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>දෙපාර්තමේන්තුමය තනතුරක් වන එම තනතුරට මේ වන විට ස්ථානමාරු කර ඇති ශ්‍රී ලංකා පරිපාලන සේවා නිලධාරිනිය 2017 වසරේදී අනුයුක්ත කරනු ලැබුයේ එවකට ආයතනය තුල නියමිත ජ්‍යෙෂ්ඨතාවය සම්පූර්ණ කළ නිලධාරීන් නොසිටි නිසා නමුත් මේ වන |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | විට එම තනතුරට පත් කළ හැකි වසර 11 ක ජ්‍යෙෂ්ඨතාවය සම්පූර්ණ කළ නිලධාරීන් දෙපාර්තමේන්තුව තුළ සිටින බව සැලකිල්ලට ගත් කාරක සභාව නියමිත ක්‍රමවේදය අනුගමනය කරමින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතුරින් සුදුසු නිලධාරියෙකුට එම රාජකාරී ඉටුකිරීම පැවරිය හැකි බවත්, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමග සාකච්ඡා කර නිසි පියවර ගන්නා ලෙසත් වෙළඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි සහ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>**පේටන්ට් අංශයෙහි අදාළ අධ්‍යක්ෂකවරියට නව සේවා ස්ථානයේ රාජකාරී 2024.11.06 දින සිට භාර ගැනීමට හැකිවන පරිදි අනුප්‍රාප්තිකයෙකු රහිතව ඇයව සේවයෙන් නිදහස් කළ බව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 03 | **<u>වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම් ලියාපදිංචිය ප්‍රමාද වීම නිසා ඇතිවන අපහසුතාවය මඟහරවා ගැනීම</u>**<br>වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම් ලියාපදිංචිය ප්‍රමාද වීම නිසා ඇතිවන අපහසුතාවය මඟහරවා ගැනීමට දින වකවානු සහිත සැලැස්මක් සකස් කරන ලෙස පසුගිය කාරක සභාවේදී කරනු ලැබූ නිර්දේශය සම්බන්ධයෙන් ප්‍රගතිය කාරක | මේ වන විට වෙළඳ ලකුණු ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර 14,000 ක් පමණද, පේටන්ට් අයදුම්පත් 591 ක් සහ කාර්මික සැලසුම් ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර 585 ක් පමණ පරික්ෂා කිරීමේ කාර්යය මේ වන විට තම කාර්යාලයට පැවරී ඇති බවත්, ඊට අමතරව අයදුම්පතක් තම කාර්යාලයට ලැබී අදාළ සහතික නිකුත් කිරීම දක්වා විවිධ මට්ටමේ පවතින අයදුම්පත්‍ර සහ අයදුම්කරුවන්ට දෝෂ වාර්තා කිරීම සහ සහතික පත් අළුත් කිරීම වැනි අයදුම්පත්‍ර තවත් ප්‍රමාණයක් පවතින බවත්, දැනට |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණකාධිකාරීතුමාගේ/ගණකාධිකාරීගේ කරුණු පැහැදිලි කිරීම් / කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
| | සභාව විසින් විමසන ලදී. | පවතින ප්‍රමාදයට හේතුව ආයතනයට ලැබෙන අයදුම්පත්‍රවලින් වැඩි සංඛ්‍යාවක් අඩුපාඩු සහිත අයදුම්පත්‍ර වීමත්, අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී නිර්මාණකරුවන් සතු අඩු කුසලතාවයත් සහ මෙකී අයදුම්පත්‍ර ඉදිරිපත් කළ දින සිට වසර 20 ක කාලයක් දක්වා වලංගු වන බැවින් අයදුම්පත ඉදිරිපත් කළද ඉන් අනතුරුව ඇතැම් අයදුම්කරුවන් ඒ සඳහා උනන්දු නොවීම යන කරුණු වන බවත් ග.නි විසින් පෙන්වා දෙන ලදී.<br>__**නිරීක්ෂණ /නිර්දේශ**__<br>ඉහත කරුණු සැලකිල්ලට ගත් කාරක සභාව මෙම විෂයය සහ ඒ හා සම්බන්ධිත ගැටළු ජාතික බුද්ධිමය දේපල කාර්යාලයටම විශේෂිත වූ කරුණු වන බැවින් ඒවා පාර්ලිමේන්තුවට යොමු කර අවශ්‍ය ප්‍රතිපත්තිමය නෛතික අනුමතයන් හා ප්‍රතිපාදනයන් සැලැස්වීමට හැකි වන අයුරින් මෙම ගැටළුව විසඳීමට සුදුසු යෝජනාවලියක් ඇතුලත් වාර්තාවක් මාස 03 ක් ඇතුළත කාරක සභාවට යොමු කරන මෙන් ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>**වර්ථමානයේ පවතින සේවක හිඟය සහ දැනට සිටින නිලධාරීගේ කාර්ය බහුලත්වය නිසා අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමට 2025.01.31 දින දක්වා කාලය ලබා දෙන ලෙස ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් ඉල්ලා ඇත.** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br><br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| 04 | **<u>ශ්‍රී ලංකාවේ දේශීය සහ ආවේණික බුද්ධිමය දේපල සංරක්ෂණය සඳහා බුද්ධිමය දේපල කාර්යාලය විසින් ගෙන ඇති පියවර.</u>** | ශ්‍රී ලංකාවේ දේශීය සහ ආවේණික බුද්ධිමය දේපල සංරක්ෂණය සඳහා බුද්ධිමය දේපල කාර්යාලය විසින් ගෙන ඇති පියවරයන් සම්බන්ධයෙන් කළ කරුණු විමසීමට පිළිතුරු ලෙස ශ්‍රී ලංකාවටම දේශීය සහ ආවේණික වූ බුද්ධිමය දේපල, විශේෂයෙන් සංරක්ෂණය කිරීම සඳහා බුද්ධිමය දේපල කාර්යාලයට සිය පනත මඟින් ප්‍රතිපාදනයන් සලසා නොමැති බව ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් දන්වා සිටින ලදී.<br><br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br><br>එකී කටයුතු සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය, කලා, ක්‍රීඩා සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ආයතනයන් සමඟ මෙම කාර්යාලය ඒකාබද්ධව කටයුතු කළ යුතු බව ප්‍ර.ග.නි සහ ග.නි වෙත කාරක සභාව විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>**මෙකී කටයුත්ත සඳහා 2003 අංක 36 දරන<br>බුද්ධිමය දේපළ පනත සංශෝධනය කර මේ හා සම්බන්ධිත සියලු පාර්ශවකරුවන් සමඟ සබැඳිව කටයුත් කළ යුත් බවත්, ඒ සඳහා තම ආයතනය තුළ වෙනම අංශයක් ස්ථාපිත කළ යුතු බැවින් අවශ්‍ය යටිතල පහසුකම් සැපයිය යුතුව ඇති බවත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 05 | **<u>ලෝක බුද්ධිමය දේපල සංවිධානය [World Intellectual Property Organization</u>** | ලෝක බුද්ධිමය දේපල සංවිධානය [World Intellectual Property Organization (WIPO)] විසින් ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ලිපිගොනු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | **<u>(WIPO)] විසින් ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය (Digitization Project)</u>** | ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය (Digitization Project), සඳහා රුපියල් මිලියන 70 ක තාක්ෂණික ආධාර සැපයීමට එකඟ වී, ඒ කටයුත්ත සඳහා ශ්‍රී ලාංකීය ආයතනයක් (Data Management Systems) ලෝක බුද්ධිමය දේපල සංවිධානය විසින් තෝරාගෙන ගිවිසුම්ගත වූ නමුත් එම ව්‍යාපෘතිය සඳහා මේ වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැති නිසා 2024 සැප්තැම්බර් මස ආරම්භ කිරීමට නියමිත එකී ව්‍යාපෘතිය ආරම්භ කිරීම ගැටළුවක් වී ඇති බව ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ග.නි විසින් දන්වා සිටි අතර අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලුම් කිරීමට ඇති ගැටළුව මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රධානිත ආයතනය වන ලෝක බුද්ධිමය දේපල සංවිධානයෙන් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් සහ එකඟතාවයක් මේ දක්වා අමාත්‍යාංශයට නොලැබීම යන බවත් අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි විසින් කාරක සභාවට දන්වන ලදී.<br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලුම් කිරීමට අවශ්‍ය සියළුම තොරතුරු සම්බන්ධයෙන් ලෝක බුද්ධිමය දේපල සංවිධානය ලිඛිතව දැනුවත් කර එම ආයතනය වෙතින් අවශ්‍ය තොරතුරු සෘජුවම ලබාගෙන සති දෙකක් ඇතුළත අමාත්‍ය මණ්ඩල අනුමතිය සඳහා ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>**අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට** |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | අමාත්‍යාංශ ලේකම් මගින් අමාත්‍ය මණ්ඩයට ඉල්ලුම් කර ඇති බව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත. |
| 06 | <u>**බුද්ධිමය දේපල පනතෙහි පවතින අඩුපාඩු හේතුවෙන් මෙරට ඇතැම් බුද්ධිමය දේපලයන් අවභාවිතා වීම.**</u> | <u>**නිරීක්ෂණ /නිර්දේශ**</u><br>බුද්ධිමය දේපල පනතේ පවතින අඩුපාඩු හේතුවෙන් මෙරට ඇතැම් බුද්ධිමය දේපලයන් හි අවභාවිතාවයන් සිදුවන බව අවධාරණය කළ කාරක සභාව, සුදුසු ජාත්‍යන්තර ක්‍රමවේදයන්ද පදනම් කර ගනිමින් පනත යාවත්කාලීන කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එම ක්‍රියාදාමයේදී ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට මුහුණදීමට සිදුව ඇති අපහසුතා සහ බාධක සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තා කරන ලෙසත්, ප්‍ර.ග.නි සහ ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී. |
| 07 | <u>**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ඉඩකඩ පිළිබඳ ගැටළුව සහ කාර්යාලයේ ඇති ලිපිගොනු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීම සම්බන්ධයෙන් පසුගිය කාරක සභාවේ දී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිමේ ප්‍රගතිය.**</u><br>ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ඉඩකඩ පිළිබඳ ගැටළුව සහ කාර්යාලයේ ඇති ලිපිගොනු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යැවීම සම්බන්ධයෙන් පසුගිය කාරක සභාවේ දී ලබා දුන් | සිදු කරන ලද ඉඩකඩ පිළිබඳ විගණනයට (Space Audit) අනුව, පවතින ඉඩකඩ ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ කටයුතු පවත්වාගෙන යාමට ප්‍රමාණවත් නොවන බව සහ ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කාර්යාල පහසුකම් සැපයීම ද ගැටළුවක්ව පවතින බවත්, වර්තමාන ගොඩනැගිල්ලෙන් අමතර ඉඩකඩ ප්‍රමාණයක් සපයා ගැනීම සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමඟ සිදු කළ සාකච්ඡා ද අසාර්ථක වී ඇති බවත් හා ලංකා සතොස ආයතනය පවතින ගොඩනැගිල්ලේ මහල් දෙකක වර්ග අඩි 3,000කට වැඩි ඉඩකඩ ප්‍රමාණයක්ලබාගත |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව කාරක සභාව විමසීය. | හැකි බැවින් ආයතනයේ අංශ කිහිපයක් එම ගොඩනැගිල්ලට ගෙන යා හැකි බවත් අමාත්‍යාංශයේ ප්‍ර.ග. නි විසින් ප්‍රකාශ කරන ලදී. <br> **<u>නිරීක්ෂණ /නිර්දේශ</u>** <br> ලංකා සතොස ආයතනය පවතින ගොඩනැගිල්ලේ පවතින එම ඉඩකඩ ආයතනයේ පැරණි ලිපිගොනු ගබඩා කිරීමට යොදා ගත යුතු බව සහ අනවශ්‍ය පැරණි ලිපිගොනු 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතට අනුකූලව අපහරණය කළ යුතු බවත් ඒ සඳහා පළමුව 2006 වසර සිට 2016 දක්වා පවත්වාගෙන යනු ලැබූ එහෙත් මේ වන විට ක්‍රියාත්මක නොවන ලිපිගොනු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයන් අනුගමනය කර ප්‍රසිද්ධ පුවත්පත් සහ වෙනත් සුදුසු දැන්වීම් පලකර මහජනතාව දැනුවත් කර, ඒවා නියමිත කාලවකවානු තුළ නියමිත ආකාරයෙන් අපහරණය කළ යුතු බවටත් ප්‍ර.ග.නි සහ ග.නි වෙත නිර්දේශ කළ කාරක සභාව සමාගම් මැදුරේ බිම් මහලේ සහ පස්වෙනි මහලේ ඌන උපයෝජනයක් සහිත ඉඩකඩ පවතින බව විගණකාධිපති වාර්තාවලින් සනාථ වී ඇති බැවින්, මෙම ලිපිගොනු ස්කෑන් කිරීමේ ව්‍යාපෘතිය අවසන්වන තෙක් හෝ තාවකාලික පදනමින් වර්තමාන ගොඩනැගිල්ලෙන්ම ඉඩකඩ සපයා ගැනීමට සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නැවත ඉල්ලීමක් සිදු කරන ලෙසද, කලාපයේ අනෙකුත් රටවල බුද්ධිමය දේපල කාර්යාලයන් පවත්වාගෙන යාමේ සහ නඩත්තු කරගෙන යාමේ ක්‍රමවේදයන් සහ ඒ සඳහා යොදාගෙන ඇති සුහුරු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | (smart) ක්‍රමවේදයන් කවරේද යන්නත් සොයා බලා ඒ පිළිබඳව කාරක සභාවට වාර්තා කරන ලෙසටද ප්‍ර.ග.නි සහ ග.නි වෙත තවදුරටත් නිර්දේශ කරන ලදී.<br>**ඉඩකඩ සම්බන්ධයෙන් වර්ග අඩි 700 ක් ලබා දෙන ලෙස සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමෙන්තුවෙන් ඉල්ලා සිටිය ද වර්ග අඩි 100 ක් පමණක් ලබා දීමට එකඟ වූ බවත් එම ඉඩ ප්‍රමාණවත් නොවන බව අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම් දුන් බවත්, ලිපිගොනු සංරක්ෂණය කටයුත්තේ දී සංරක්ෂණය කළ යුතු ලිපිගොනු වර්ගීකරණය කර 2024.08.02 දින ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් සහ අපහරණය කිරීම සඳහා වෙන් කර ඇති ලිපිගොනු සතොස ආයතනය මගින් ලබාදීමට නියමිත ඉඩ කොටසෙහි තැන්පත් කිරීමට අදාළ කටයුතු නොපමාව සම්පාදනය කර දෙන ලෙස අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම් දුන් බවත්, ඉන්දියාවේ බුද්ධිමය දේපල කාර්යාලයන් පවත්වාගෙන යාම සහ නඩත්තු කරගෙන යාම සඳහා යොදාගෙන ඇති සුහුරු (smart) ක්‍රමවේදයන් තම ආයතනය තුළ ද ස්ථාපිත කිරීමට ඉදිරියේ දී හැකිතාක් දුරට කටයුතු කරනු ලබන බවත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 08 | <u>ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් මේ වන විට</u> | ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධයෙන් මේ වන විට ක්‍රියාත්මක වැඩපිළිවෙල පිළිබඳව කරනු |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් <br> කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | <u>**ක්‍රියාත්මක වැඩපිළිවෙල.**</u> | ලැබූ කරුණු විමසීමේ දී, අමාත්‍යාංශය යටතේ පවතින ආයතන කිහිපයක් සඳහාම අමාත්‍යාංශයට අයත් කොල්ලුපිටියේ පිහිටි ඉඩමක මේ වන විටත් ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින බවත්, එම ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් වූ පසු මෙම ගැටළුව විසදෙනු ඇති බවත් ප්‍ර.ග.නි විසින් කාරක සභාවට කරුණු දක්වන ලදී. <br> **මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ පවතින ප්‍රමාදය නිසා තම කාර්යාලයේ ඉඩකඩ ගැටළුව සඳහා කඩිනම් පිලියම් ලබා දෙන ලෙස අමාත්‍යාංශයේ ලේකම්ට ඉල්ලීම් ඉදිරිපත්කර ඇති බව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 09 | <u>**ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සඳහා සේවාදායකය මිලදී ගැනීමට ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට ගෙවන ලද මුදල නැවත අය කර ගැනීම.**</u> <br> ජාතික බුද්ධිමය දේපල කාර්යාලය සඳහා සේවාදායකයමිලදී ගැනීමට ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමඟ 2016 වසරේදී ගිවිසුම්ගතව ගෙවන ලද රුපියල් මිලියන 32 ක මුදල නැවත අය කර ගැනීම සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | මෙම කරුණ සඳහා ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත 2016 වසරේදී මුදල් ලබා දුන්න ද සර්වර් යන්ත්‍රය මේ දක්වා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට නොලැබුණ නමුත් එම මුදල සිය ආයතනයේ වැටුප් ගෙවීම සඳහා යොදා ගත් බැවින් එය නැවත ගෙවීමට ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයට හැකියාවක් නොමැති බව දන්වා ඇති බවට ප්‍ර.ග.නි සහ ග.නි විසින් කරුණු දක්වන ලදී. <br> <u>**නිරීක්ෂණ /නිර්දේශ**</u> <br> ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් සිදු කරන ලද මෙම බරපතල වරද හේතුවෙන් එම මුදල් |

| | සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු | ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්<br>කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ |
|---|---|---|
| | | මහා භාණ්ඩාගාරයෙන් සපයා ගැනීම නිසි ක්‍රමවේදය නොවන බවත්, එනිසා ඉදිරි මාස 03 ඇතුළත එම මුදල ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙතින් අයකර ගැනීමට ගත හැකි සියළුම ක්‍රියාමාර්ගයන් ගන්නා ලෙසත් කාරක සභාව විසින් ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී.<br>**සර්වර් යන්ත්‍රය මිලදී ගැනීමට ගෙවූ මුදල අයකර ගැනීමට මැදිහත් වන ලෙස ඉල්ලමින් 2024.10.29 දිනැතිව අමාත්‍යාංශයේ නව ලේකම් වෙත ලිපියක් යොමු කරන ඇති බව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 10 | **<u>ජාතික බුද්ධිමය දේපල කාර්යාලය යටතේ පවතින විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතනයන් හි පවත්වාගෙන යන තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානයන් හි ක්‍රියාකාරීත්වය හා වාර්ෂික ප්‍රගතිය පරීක්ෂා නොකිරීම.</u>**<br>ජාතික බුද්ධිමය දේපල කාර්යාලය යටතේ පවතින විශ්වවිද්‍යාල පර්යේෂණ ආයතනයන් හි පවත්වාගෙන යන තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානයන් හි ක්‍රියාකාරීත්වය හා වාර්ෂික ප්‍රගතිය පරීක්ෂා නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | තම ආයතනය විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනයන් 27 ක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානයන් [Technology and Innovation Support Centers (TISC)] ආරම්භ කළද, මේ වන විට ඒ අතුරින් ක්‍රියාත්මක වනුයේ මධ්‍යස්ථාන සුළුතරයක් පමණක් බවත්, ඒ සඳහා ප්‍රධානම හේතුව එම මධ්‍යස්ථානයන්හි සේවයේ නියුතු විශ්වවිද්‍යාල ආචාර්ය මණ්ඩලයට වර්තමානයේදී කිසිදු ගෙවීමක් සිදු නොකිරීම බවත්, අදාළ නිලධාරීන් විසින් දන්වා සිටින ලදී.<br>**<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>එම මධ්‍යස්ථානයන් සඳහා මුල්‍යමය සහායක් සපයා ගැනීම සඳහා ඒවායේ සේවය අවශ්‍යවන්නා වූ වෙනත් රාජ්‍ය |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්**<br>**කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | | ආයතනයන් සමඟ සම්බන්ධීකරණයෙන් මෙම මධ්‍යස්ථානයන් තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපල කාර්යාලයට මැදිහත් විය හැකි සියළුම අංශයන් පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් සිදු කර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟද සාකාච්ඡා කර ඒ සඳහා සුදුසු යෝජනාවලියක් සහ සංකල්ප පත්‍රිකාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි සහ ග.නි වෙත කාරක සභාව විසින් නිර්දේශ කරන ලදී.<br>**මේ සඳහා සංකල්ප පත්‍රිකාවක් සකස් කරමින පවතින බවත්, එහිදී නිලධාරීන් නිරන්තරයෙන් ස්ථානමාරු වන වාතාවරණයක දී ඇති වන ගැටළුකාරී තත්ත්වයන් මඟහැරීමට අදාළ ආයතන සමඟ ද ඒකාබද්ධව විශේෂ ශක්‍යතා අධ්‍යනයක් සිදු කරනු ලබන බවත් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2/4/8 VOL III හා 2024.11.07 දිනැති ලිපියෙන් දන්වා ඇත.** |
| 11 | **<u>භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ජාතික බුද්ධිමය දේපල පනතට 2022 වසරේදී සිදු කරන ලද සංශෝධනයන් බලාත්මක කිරීම සඳහා පැනවිය යුතු රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය.</u>**<br>භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ජාතික බුද්ධිමය දේපල පනතට 2022 වසරේදී සිදු | **<u>නිරීක්ෂණ /නිර්දේශ</u>**<br>ඒ සඳහා අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගැනීමේ ප්‍රමාදයට හේතුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පාර්ශවයෙන් පවතින ප්‍රමාදය බව කාරක සභාවට දන්වා සිටියෙන්, එකී දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීව කටයුතු කර සංශෝධන ඇතුළත් කෙටුම්පත කඩිනමින් සකස් කර ගන්නා ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි වෙත නිර්දේශ කරන ලදී. |

| | **සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර.ග.නි.) /ගණන් දීමේ නිලධාරිගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම්** **කාරක සභාවේ නිරීක්ෂණ/ නිර්දේශ** |
|---|---|---|
| | කරන ලද සංශෝධනයන් බලාත්මක කිරීම සඳහා පැනවිය යුතු රෙගුලාසි පාර්ලිමේන්තුවේ අනුමතිය සඳහා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් කාරක සභාව විමසීය. | |

## සූචිය

**අ**
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ආ**
ආයුර්වේද දෙපාර්තමේන්තුව

**ක**
කම්කරු දෙපාර්තමේන්තුව

**ග**
ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ජ**
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

**බ**
බස්නාහිර පළාත් සභාව
බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් පාලන ආයතන

**ව**
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**ශ**
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව